# වාර්ෂික වාර්තාව 2018

ජාතික තරුණ සේවා සභාව

# හැඳින්වීම.

ජාතික තරුණ සේවා සභාව 2018 වර්ෂය තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම්හි ප්‍රතිඵල මෙම වාර්ෂික වාර්තාව තුළ අන්තර්ගතව පවතී.

ඉදිරි තීන්දු තීරණ ගැනීමේදී මෙන්ම, බාහිර පාර්ශවයන්ටද ආයතනය පිළිබඳව ප්‍රතිරූපයක් ගොඩ නගා ගැනීමට මෙම වාර්ෂික වාර්තාව ඉවහල් වනු ඇත. විශේෂයෙන් ඉදිරි වර්ෂය සඳහා ප්‍රතිපාදන ලබාගැනීමේදී ද මෙහි සඳහන් කාර්ය සාධනයන් වැදගත් වේ.

දේශීය මෙන්ම විදේශීය තරුණ ප්‍රජාව සම්බන්ධ කර ගනිමින් තරුණ සංවර්ධන වැඩසටහන් ක්‍රියාවට නගමින් ආයතනික ඉලක්ක කරා ලගාවීම සඳහා යොදාගත් උපක්‍රම හා ඉන් ලද ප්‍රතිඵලයන් මේ තුළින් දක්වා ඇත. භෞතික හා මානව සම්පත් තරුණ සංවර්ධන ක්‍රියාවලිය සඳහා උපයෝගී කරගත් ආකාරය මෙහි දක්වා ඇත.

තවද රාජ්‍ය නොවන සංවිධාන සහ ආයතනය පිළිබඳ උනන්දුවක් දක්වන බාහිර පාර්ශවයන් ජාතික තරුණ සේවා සභාව සමඟ සම්බන්ධ වී කටයුතු කිරීමේදි තීරණ ගැනීම සඳහා වාර්ෂික වාර්තාව උපයෝගී කරගත හැක. එමෙන්ම අපේක්ෂිත දිශානතිය තුළ ගමන් කළේ ද යන්න අවබෝධ කර ගැනීමට වාර්ෂික වාර්තාව බෙහෙවින් වැදගත් වේ.

2018 වර්ෂය තුළ ජාතික තරුණ සේවා සභාවේ යෞවන සමාජ පිහිටුවීම,තරුණ නායකත්ව වැඩසටහන්, යෞවන ක්‍රිඩා උළෙල , ක්‍රීඩා සංචිත , තුරුණු ශ්‍රම ශක්ති ප්‍රජා සංවර්ධන වැඩසටහන,යෞවන සම්මාන උළෙල,යොවුන් නාට්‍ය තරඟාවලිය,ජාතික සංස්කෘතික උළෙල ,(නිස්කෝ) තරුණ සමූපකාර සමිති වැඩසටහන , විදේශ සංචිත , ජාත්‍යන්තර තරුණ හුවමාරු වැඩසටහන් , මාධ්‍ය වැඩමුළු වැනි වැඩසටහන් රාශියක් සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී.

නිලධාරීන්ගේ වෘත්තීමය සුදුසුකම් ඉහළ නැංවීම සහ ඉහළ අධ්‍යාපන හෝ වෘත්තීය හැකියාවක් සහිත නිලධාරීන් සම්බන්ධ කරගැනීමේ අවශ්‍යතාවය දැඩිව පවතී. භෞතික සම්පත් වල හිඟතාවය, සමාන සේවා සපයන ආයතන සමඟ තරඟ කිරීමට ආයතනයට සම්පත් ප්‍රමාණවත් නොවීම මෙම වර්ෂයේද ආයතනයේ අභියෝගයන් විය. මෙම ගැටළු වලට පිළියමක් ලෙස පුහුණු අවශ්‍යතා විශ්ලේෂණයකින් පසු නිළධාරි පුහුණු කිරීම,නිළධාරි උසස් කිරීම,වෘත්තිය මට්ටමේ ප්‍රවිණයන්ගේ සහාය ලබා ගැනීම සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) යාවත්කාලීන කිරීම සහ භෞතික සම්පත් යාවත්කාලීන කිරීම යනාදිය සිදු කිරීමේ දැඩි අවශ්‍යතාවය පවතී.

ජාතික තරුණ සේවා සභාවේ සියළු ආයතනික කාර්යයන් සාර්ථකව පවත්වාගෙන යෑම සඳහා මාර්ගෝපදේශකත්වය හා නායකත්වය සපයනු ලැබූ ගරු අග්‍රාමාත්‍යතුමා, අමාත්‍යතුමා ඇතුළු ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ සියළුම නිලධාරින් සහ ජාතික තරුණ සේවා සභාවේ සභාපති / අධ්‍යක්ෂ ජනරාල්තුමා ඇතුළු මෙහිලා සහය දැක් වූ සියළු දෙනා ගෞරවයෙන් සිහිපත් කරමු.

සැලසුම් සහ සංවර්ධන අංශය

## දැක්ම

බලසතු වූ ශ්‍රී ලාංකීය තරුණයෙක්.

## මෙහෙවර

දේශීය හා ජාත්‍යන්තර අවස්ථා උපයෝගී කොටගෙන ජීවිත අභියෝග සඳහා මුහුණ දීමට ශ්‍රී ලාංකීය තරුණයා සවිබල ගැන්වීම සඳහා පහසුකම් සැපයීම.

## අරමුණු

- ජාතික හැඟුම පිළිබද උද්යෝගයක්, විනය පිළිබද හැඟීමක්, සමාජ හා ආර්ථික ගැටළු පිළිබද අවබෝධයක් සහ ශ්‍රමාභිමානය පිළිබද හැඟීමක් තරුණයන් අතර පෝෂණය කිරීම.

- ජාතික සංවර්ධන යෝජනා ක්‍රමයන්හි තරුණයන්ගේ සහභාගිත්වය ඇති කර ගැනීම.

- ශ්‍රී ලංකාවේ හා වෙනත් රටවල තරුණයන් අතර සුහදතාවය සහ අන්‍යොන්‍ය අවබෝධය ප්‍රවර්ධනය කිරීම.

- තරුණයන් අතර තරගකාරිත්වය හා ජයග්‍රහණය පිළිබද හැඟීම සදහා දිරිගැන්වීම.

- තරුණයන්ගේ දැනුම පුළුල් කිරීම සහ සංවර්ධනයට අදාළ ක්ෂේත්‍රයන්හි පුහුණුවීම ලබාදීම.

- තරුණයන් අතර සංස්කෘතික සාහිත්‍යමය හා කලාත්මක ක්‍රියාකාරකම් සදහා දිරි ගැන්වීම.

- තරුණයන් අතර ශාරීරික ප්‍රාගුණය හා ක්‍රීඩා වර්ධනය සදහා දිරි ගැන්වීම.

- තරුණයන් සදහා විනෝද කටයුතු සහ විනෝද සැපයුම් පිළිබද පහසුකම් සැලසීම.

- ආබාධිත තරුණයන්ට සහය වීම.

- රජයේ ආර්ථික සැළසුම ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව, දීර්ඝ කාලීන ප්‍රතිපත්ති පදනමක් මත ඵලදායී ලෙස අරමුදල් ආයෝජනය කිරීමෙන් තරුණයන් සදහා ක්‍රමික සේවා නියුක්තිය සදහා අවස්ථාව සැලසීම.

- ප්‍රතිපත්ති සැකසීමේ හා ක්‍රියාත්මක කිරීමේ දී තරුණයන්ගේ සහභාගිත්වය සදහා අවස්ථාව සැලසීම.

- තරුණ සංවිධානය පිහිටුවීම සහ තරුණ සුභ සාධනය සදහා දැනටමත් පිහිටුවා ඇති සංවිධාන වලට සහය වීම.

- තරුණ සේවා ව්‍යාප්තිය සැළසුම් කිරීම, ඒකාබද්ධ කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ මෙහෙයවීම.

- එක් එක් තරුණයාගේ ආවේනික ලක්ෂණ වර්ධනය කිරීම.

## ලේකම්තුමාගේ සුබ පැතුම් පණිවිඩය

ශ්‍රී ලංකාවේ තරුණ සංවර්ධන කටයුතු වෙනුවෙන් පිහිටුවා ඇති මුල්ම මෙන්ම,දැවැන්ත රාජ්‍ය ආයතනය වන ජාතික තරුණ සේවා සභාව විසින් 2018 වර්ෂයේ තරුණ සුබ සාධනය හා සංවර්ධනය වෙනුවෙන් සිදු කරන ලද සුවිශාල වැඩසටහන් පිළිබඳව කරුණු විදහා දැක්වෙන වාර්ෂික වාර්තාව වෙනුවෙන් සුබ පැතුම් පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම ගැන අතිශයින්ම සතුටට පත් වෙමි.

තරුණ තරුණියන්ගේ ක්‍රීඩා හැකියාවන් වඩා වර්ධනය කොට ඔවුන් ජාතික හා ජාත්‍යන්තර තලයට රැගෙන යාමේ අරමුණින් ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රීඩා තරග පවත්වා ඒවායින් දක්ෂතා දැක්වූ තරුණ තරුණියන් වෙනුවෙන් පැවැත්වෙන 2018 ජාතික යෞවන ක්‍රීඩා උළෙල,මාතර කොටවිල දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේදී අති උත්කර්ශවත් අන්දමින් පැවැත්වීමට ලැබීම,මෙරට ක්‍රීඩාශිලි තාරුණ්‍යය ලත් සුවිශේෂී ජයග්‍රහණයක් ලෙසින් මා දකිමි.එමෙන්ම නාට්‍ය ක්ෂේත්‍රයට පිවිස සිටින තරුණ තරුණියන්ගේ සහජ දක්ෂතා ජාතික හා ජාත්‍යන්තර තලයට හඳුන්වා දීමේ අරමුණින් ජාතික යොවුන් නාට්‍ය උළෙල පසුගිය සැප්තැම්බර් මස මරදාන,ටවර් හෝල් රඟහලේදී අති සාර්ථක අන්දමින් පැවැත් වූ අතර,මෙවරට විවිධ කලා අංගයන්ගෙන් දක්ෂතා දැක්වූ අංකුර කලාකරුවන් ඇගයීමට ලක් කිරීම උදෙසා සංවිධානය කළ,ජාතික යෞවන සම්මාන උළෙල,පසුගිය නොවැම්බර් මස කොළඹ නෙළුම් පොකුණ රඟහලේදී වර්ණවත් අන්දමින් පැවැත්විණ.මෙහිදී නාට්‍ය ක්ෂේත්‍රයේ මෙන්ම,විවිධ කලා අංගයන්ගෙන් දක්ෂතා දැක්වූ තරුණ කලාකරුවන් 170කට අධික පිරිසකට යෞවන සම්මාන ප්‍රදානය කිරීමට ලැබීම සතුටට කරුණකි.

තවද,ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින නාට්‍ය ක්ෂේත්‍රයට ඇල්මක් දක්වන තරුණ තරුණියන් වෙනුවෙන් නාට්‍ය හා රංග කලා ඩිප්ලෝමා පාඨමාලාවක්ද,නැටුම් හා සංගීත ක්ෂේත්‍රයන්ට දක්ෂතා දක්වන තරුණ තරුණියන් වෙනුවෙන් මහරගම බෙල්වුඩ් හා එරමිණියාය සෞන්දර්ය නිකේතනයන්ද 2018 වර්ෂය තුළ සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී.

එමෙන්ම ,දකුණු ආසියාවේ විශාලතම ස්වේච්ඡා තරුණ සංවිධානය වන ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනය ශක්තිමත් කරමින් 2018 වර්සයේදී යෞවන සමාජ 11350ක් පිහිටුවීමට ජාතික තරුණ සේවා සභාවට හැකියාවක් ලැබිණ.මෙම සම්මේලනය හරහා ජාතික තරුණ දිනය හා ජාත්‍යන්තර තරුණ දිනය වෙනුවෙන් වැඩසටහන් රාශියක් අති උත්කර්ශවත් අන්දමින් පැවැත්වීමට හැකිවීම මෙරට තාරුණ්‍යය ලත් සුවිශේෂී ජයග්‍රහණයකි.තවද,එම වර්ෂයේදී යොවුන් පාර්ලිමේන්තුවද ශක්තිමත් කරමින් සාර්ථක සැසි වාර මෙන්ම,අධ්‍යාපන හා පුහුණු වැඩමුළු කිහිපයක් පවත්වන ලදි.මෙරට තරුණ තරුණියන් වෙනුවෙන් පාසල් මාධ්‍ය වැඩමුළු,පළාත් හා ජාතික මාධ්‍ය වැඩමුළු සිංහල මෙන්ම දමිළ මාධ්‍ය ද්විත්වයෙන්ම පැවැත්වීමට ජාතික තරුණ සේවා සභාවට හැකියාවක් ලැබීමද තවත් සුවිශේෂී ජයග්‍රහණයකි.

මීට අමතරව,නිපොන්මාරු මිත්‍රත්ව නෞකා වැඩසටහන,ජාත්‍යන්තර තරුණ හුවමාරු වැඩසටහන්,ජාත්‍යන්තර තරුණ සමුළුව,ශිෂ්‍ය නායක වැඩසටහන්,ප්‍රාදේශීය යොවුන් කඳවුරු,වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන්,ජාතික යොවුන් තිළිණ ප්‍රදාන වැඩසටහන,එඩින්බරෝ ආදිපාද ජාත්‍යන්තර දිනය සැමරීම,තරුණ සේවා රූපවාහිනී අභියෝග ශූරතා හා සුපර්ලීග් තරගාවලිය අති සාර්ථක අන්දමින් පැවැත්වීම,වොලිබෝල්/කබඩි,ජූඩෝ/කරාතේ යන ක්‍රීඩා සංචිත පවත්වා ගෙන යාම."අනාගතය ඇරඹුණා"යන තේමාව යටතේ 2018 යොවුන්පුරය වැඩසටහන නිකවැරටිය,පශුසම්පත් ගොවිපල පරිශ්‍රයේදී දෙස් විදෙස් තරුණයින් 7000කගේ සහභාගිත්වයෙන් පැවැත්වීම යුත් චිත් ටැලන්ට් රියැලිටි වැඩසටහන හා තුරුණු ශ්‍රම ශක්ති ව්‍යාපෘති 200ක වැඩසටහන,ජාතික යොවුන් චිත්‍රපට උළෙල වැනි අතිවිශාල වැඩසටහන් රාශියක් මෙරට තාරුණ්‍යය වෙනුවෙන් 2018 වර්ෂයේ දී තරුණ සේවා සභාව ක්‍රියාවට නංවා ඇතිබව නිහතමානි සතුටකින් යුතුව ප්‍රකාශයට පත් කළ හැකි වීම මා ලද භාග්‍යයක් කොට සලකමි.

ලේකම්,
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු,නැවත පදිංචි කිරීමේ හා පුනරුත්ථාපන,උතුරු පළාත් සංවර්ධන,සහ
යෞවන කටයුතු අමාත්‍යංශය

## සභාපති/අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සුබ පැතුම් පණිවිඩය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1979 අංක 69 දරණ පාර්ලිමේන්තු පනත මගින් ස්ථාපිත කර ඇති ජාතික තරුණ සේවා සභාව ශ්‍රී ලාංකීය තරුණ පරපුර වෙනුවෙන් සේවාවන් කිරීම සඳහා දිවයිනේ සෑම පළාතකම සහ දිස්ත්‍රික්කයකම කාර්යාල පිහිටුවා ඇති අතර,එයට අමතරව පුහුණු මධ්‍යස්ථාන 54 ක තරුණ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.මෙම සභාව ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු,නැවත පදිංචි කිරීම්,පුනරුත්ථාපන,උතුරු පළාත් සංවර්ධන හා යෞවන කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර,එම අමාත්‍යාංශය මගින් තරුණ සංවර්ධන කටයුතු වලට අදාළ අධීක්ෂණ,උපදෙස්,මග පෙන්වීම් හා වාර්ෂික ප්‍රතිපාදන සපයා දෙනු ලබන අතර,සභාවේ ප්‍රගතිය දැක්වෙන 2018 වාර්ෂික වාර්තාව සඳහා මාගේ පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම සතුටට කරුණකි.

මෙම සභාව වාර්ෂික සැලැස්මකට අනුව වැඩසටහන් සකස් කර ක්‍රියාත්මක කරනු ලබන අතර,මේ යටතේ එක් එක් තරුණ තරුණියන්ට ආවේණික හැකියාවන් වර්ධනය කිරීමේ අරමුණින් අංශ කීපයක් පිහිටුවා ඒ යටතේ තරුණ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර,සෞන්දර්ය කුසලතා සංවර්ධන අංශය මගින් වාර්ෂිකව යෞවන සම්මාන උළෙල පවත්වා සෞන්දර්ය හැකියාවන් වර්ධනය කිරීමට තරුණ පෙළ උනන්දු කරනු ලැබේ.එසේම මහරගම ජාතික තරුණ මධ්‍යස්ථානය ආශ්‍රිතව මාස 06 කට වරක් පූර්ණ කාලීන පාඨමාලා 20ක් සහ අර්ධ කාලීන පුහුණු පාඨමාලා 28ක් ක්‍රියාත්මක කර එමගින් පුහුණු තරුණ තරුණියන් විශාල පිරිසක් රටට දායාද කිරීමට කටයුතු කර ඇත.

විශේෂ ව්‍යාපෘති අංශය මගින් යොවුන්පුරය ජාතික තරුණ කඳවුර වාර්ෂිකව සංවිධානය කරනු ලබන අතර,එමගින් නායකත්වය,පෞරුෂත්වය සහිත විනය ගරුක තරුණ පිරිසක් ගමට රටට දායාද කිරීමට වැඩකටයුතු සලසා ඇත.විශේෂයෙන්ම ගමට කෝටියක් වැඩසටහන මගින් දිවයින පුරා තරුණ තරුණියන් විසින් තම ප්‍රදේශයේ අවශ්‍යතා හඳුනාගනිමින් මාර්ග,පාලම් සකස් කිරීම ආගමික ස්ථාන සංවර්ධනය හා අනෙකුත් ග්‍රාමීය සංවර්ධන කටයුතු කරමින් තරුණ ශ්‍රමය වඩාත් ඵලදායී ලෙස යෙදවීමට කටයුතු කර ඇත.නිස්කෝ විඩියෝ අංශය මගින් රූපවාහිනී ඩිප්ලෝමා පාඨමාලාව පවත්වන අතර,ඉන් ජාතික වෘත්තිය තත්ව සහතිකය පිරිනැමීමට කටයුතු කර ඇත.ජාතික යෞවන තිළිණ ප්‍රදාන අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන එඩින්බරෝ ජාත්‍යන්තර තිළිණ ප්‍රදානය මගින් තරුණ තරුණියන් අන්‍යාන්‍ට සේවය කිරීම සඳහා යොමු කිරීමට වැඩසටහන් සකස් කර එමගින් තරුණ තරුණියන්ට උසස් අධ්‍යාපන අවස්ථාවන් වලදී ලකුණු ලබා දීමේ වැඩපිළිවෙලක්ද ක්‍රියාත්මක වන බැවින් ඒ තුළින් තරුණ තරුණියන්ට වඩාත් ඵලදායී සේවයක් සිදු කෙරේ.

මෙයට අමතරව මාධ්‍ය අංශය මගින් පළාත් මට්ටමින් මාධ්‍ය වැඩමුළු පවත්වා තරුණ තරුණියන්ට මාධ්‍ය ක්ෂේත්‍රය සඳහා අවතීර්ණ වීමට ඉඩ ප්‍රස්ථා සලසා ඇත.යොවුන් පාර්ලිමේන්තු වැඩසටහන මගින් ජාතික ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා තරුණ සහභාගීත්වය හා අදහස් යෝජනා ලබා ගැනීමට වැඩ කටයුතු සලසා තිබේ.මෙයට අමතරව විශේෂ සංගීත කණ්ඩායම් පිහිටුවා සංගීත ක්ෂෙත්‍රයට ලැදි තරුණ තරුණියන්ගේ කුසලතා සංවර්ධන කරනු ලබන අතර,ක්‍රීඩා සංවර්ධන අංශය මගින් වාර්ෂිකව පවත්වනු ලබන ජාතික යෞවන ක්‍රීඩා උළෙල මගින් යහපත් කායික,මානසික සමබරතාවයෙන් යුතු හා මනා පෞරුෂයකින් හෙබි යෞවන යෞවනියන් රටට දායාද කිරීමට කටයුතු යොදා ඇත.ජාත්‍යන්තර තරුණ සංවර්ධන අංශය,සමුපකාර සංවර්ධන අංශය,කාර්මික හා වෘත්තීය පුහුණු අංශය වශයෙන් තරුණ තරුණියන්ගේ ප්‍රගතියට ඉවහල් වන අංශ පිහිටුවා ඇත.

ජාතික තරුණ සේවා සභාව යටතේ පිහිටුවා ඇති ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනය දිවයිනේ ක්‍රියාකාරී තරුණ තරුණියන් විශාල පිරිසක් සිටින එකම ස්වේච්ඡා සංවිධානයයි.මේ යටතේ සෑම ග්‍රාමසේවා වසමකම යෞවන සමාජ පිහිටුවා ඇති අතර,ප්‍රාදේශිය,දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් එම සංවිධානය ක්‍රියාත්මක වේ.

ජාතික තරුණ සේවා සභාවේ දැක්ම අනුව බලසතු වූ ශ්‍රී ලාංකේය තරුණයන් නිර්මාණය කිරීම සඳහා දේශීය සහ ජාත්‍යන්තර අවස්ථා උපයෝගී කර ගෙන ජීවිත අභියෝග සඳහා මුහුණ දීමට ශ්‍රී ලාංකීය තරුණයා සවිබල ගැන්වීමට පහසුකම් සැලසීමේ මෙහෙවර තුළින් 2018 වර්ෂයේ සාර්ථක ප්‍රතිඵල අත්කර ගැනීම සඳහා උරදුන් සැමට මාගේ කෘතවේදීත්වය පල කරමි.

සභාපති/අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික තරුණ සේවා සභාව,
මහරගම.

# පටුන


| | | |
|---|---|---|
| | හැඳින්වීම | II |
| | දැක්ම/මෙහෙවර | III |
| | අරමුණු | IV |
| | අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය | V |
| | සභාපති/අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සුභ පැතුම් පණිවිඩය | VI |
| 1 | ජාතික තරුණ සේවා සභාව | 1 |
| 1.1 | සංවිධාන ව්‍යුහය | 2 |
| 1.2 | සභා අධ්‍යක්ෂ නාම ලේඛණය | 3-5 |
| 2 | විගණක හා කළමනාකරන කමිටුව-2018 | 6 |
| 3 | ජාතික තරුණ සේවා සභාවේ ලැබීම් හා වියදම් පිලිබඳ විස්තරය | 7-11 |
| 4 | සංවර්ධන ක්‍රියාකාරකම්-2018 | 12 |
| 4.1 | තරුණ සංවිධාන හා සංවර්ධන වැඩසටහන් | 12-15 |
| 4.2 | වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ක්‍රියාකාරකම් | 16 |
| 4.3 | ක්‍රීඩා සංවර්ධන ක්‍රියාකාරකම් | 17-21 |
| 4.4 | සෞන්දර්ය කුසලතා සංවර්ධන ක්‍රියාකාරකම් | 22-24 |
| 4.5 | කාර්මික හා වෘත්තීය පුහුණු ක්‍රියාකාරකම් | 24-25 |
| 4.6 | ජාත්‍යන්තර තරුණ සබඳතා | 25-27 |
| 4.7 | නිස්කෝ වීඩියෝ ක්‍රියාකාරම් | 27-28 |
| 4.8 | ආර්ථික ප්‍රවර්ධන හා ගොවිපල සංවර්ධන ක්‍රියාකාරකම් | 28-29 |
| 4.9 | සැළසුම් සහ සංවර්ධන අංශය | 30 |
| 4.10 | කාර්යසාධන ඇගයීම් හා නිලධාරී පුහුණු අංශය | 30-31 |
| 4.11 | මාධ්‍ය අංශය | 32-33 |
| 4.12 | තොරතුරු තාක්ෂණ අංශය | 34-35 |
| 4.13 | විභාග ඇගයීම් අංශය | 35-36 |
| 4.14 | විශේෂ ව්‍යාපෘති අංශය | 36-42 |
| 4.15 | යෞවන තිළිණ අධිකාරිය | 43 |
| 4.16 | තරුණ සමුපකාර හා ව්‍යාපාර සංවර්ධන අංශය | 44 |
| 5 | පාලන අංශයේ ක්‍රියාකාරකම්-2018 | 45-47 |
| 5.1 | ආයතනික කටයුතු | 47 |
| 5.2 | සැපයුම් අංශය | 47 |
| 5.3 | ප්‍රවාහන ක්‍රියාකාරකම් | 47 |
| 5.4 | අභ්‍යන්තර විගණක අංශය | 48 |
| 5.5 | ලේකම් අංශය | 48 |
| 5.6 | නීති විමර්ශන ක්‍රියාකාරකම් | 48-49 |
| 5.7 | ඉදිකිරීම් හා නඩත්තු අංශය | 49 |
| 6 | ස්වේච්ජා වැඩසටහන් | 49-50 |
| 7 | ආයතනයේ කාර්යසාධන වාර්තාවහි සාරාංශය හා කාර්යසාධනය වර්ධනය කරගැනීම සඳහා වන කෙටිකාලීන හා මධ්‍යකාලීන ක්‍රියාමාර්ග | 51-53 |
| 8 | 2018 වර්ෂයට අදාල විගණන විමසුම් මගින් දක්වා ඇති කරුණු නිවැරදි කිරීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව. | 54-56 |
| 9 | ආශ්‍රිත වාර්තා / ලේඛන. | 57 |
| ඇමුණුම් 01- විගණක කමිටු වාර්තාව | | 58 |
| ඇමුණුම් 02- මූල්‍ය විගණක ප්‍රකාශය | | 59-60 |
| ඇමුණුම් 03 -විගණකාධිපති වාර්තාව හා 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව | | 61-78 |

# 1.ජාතික තරුණ සේවා සභාව


ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ගේ පූර්ණ වර්ධනය සහතික කිරීමට හැකිවන පරිදි ඔවුන්ගේ ස්වාර්ථයන් ප්‍රවර්ධනය කිරීම සඳහා පිහිටුවා ඇති එකම රාජ්‍ය ආයතනය ජාතික තරුණ සේවා සභාව වේ.

<u>ජාතික තරුණ සේවා සභාව පිහිටුවීමට අදාළ පාර්ලිමේන්තු පනත් :-</u>

- 1967 වර්ෂයේ අංක 11 දරණ ස්වේච්ඡා ජාතික තරුණ සේවා පනත.
- 1968 වර්ෂයේ අංක 52 දරණ ස්වේච්ඡා ජාතික තරුණ සේවා (සංශෝධිත) පනත.
- 1969 ජනවාරි 23 වන දින අංක 14837/6 දරණ අති විශේෂ ගැසට් පත්‍ර මඟින් පනතේ 26 වන ඡේදනට අනුව රෙගුලාසි මාලාව ප්‍රකාශයට පත් කිරීම.
- 1979 වර්ෂයේ අංක 69 දරණ ජාතික තරුණ සේවා පනත.
- 1979 දෙසැම්බර් මස 20 වන දින අංක 67/09 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් 1967 අංක 11 දරණ ස්වේච්ඡා ජාතික තරුණ සේවා (සංශෝධන) පනත අහෝසි කිරීම හා 1979 අංක 69 දරණ ජාතික තරුණ සේවා පනත ක්‍රියාත්මක කරන දිනය ප්‍රකාශයට පත් කිරීම.
- 1980 ජනවාරි මස 02 වන දින අංක 69/09 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් 1979 අංක 69 දරණ ජාතික තරුණ සේවා පනතේ 34 වන වගන්තිය යටතේ රෙගුලාසි මාලාව ප්‍රකාශයට පත්කිරීම.
- 1986 මාර්තු මස 10 වන දින අංක 392/05 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් 1979 ජාතික තරුණ සේවා පනතේ 34 වන වගන්තිය යටතේ 1986 අංක 01 දරණ ජාතික තරුණ සේවා නියෝග ප්‍රකාශයට පත්කිරීම.
- 1990 පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාලය ජාතික තරුණ සේවා සභාවට අන්තර්ග්‍රහණය කිරීම.
- 2011 වසරේ ශ්‍රී ලංකා යූත් සංකල්පය ආරම්භ වීම.

1978 වසරේ යෞවන කටයුතු හා රැකී රක්ෂා අමාත්‍යාංශය පිහිටුවීමත් සමඟ සම්මත වූ 1979 අංක 69 දරණ ජාතික තරුණ සේවා පනත යටතේ ජාතික තරුණ සේවා සභාවට පෙරට වඩා පුළුල් බලතල සහිතව තරුණ සංවර්ධන කටයුතු වන නියැලීමට අවකාශය ලැබුණි.

## 1.1 සංවිධාන ව්‍යුහය


සභාපති/අධ්‍යක්ෂ ජනරාල් සහ අධ්‍යක්ෂ මණ්ඩලය
HM
ප්‍රධාන අභ්‍යන්තර විගණක
අධ්‍යක්ෂ (මානව සම්පත් සහ පරිපාලන)
අධ්‍යක්ෂ (මුදල්)
අධ්‍යක්ෂ (සංවර්ධන)
අධ්‍යක්ෂ (කාර්මික හා වෘත්තීය පුහුණු)
MM
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පළාත්)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංවර්ධන)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (කාර්මික හා වෘත්තීයපුහුණු)
MM
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (නීති) සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
අභ්‍යන්තර විගණක
සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික්)
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන,මානව සම්පත්,ප්‍රවාහන)
සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්‍ෂණ)
ඉංජිනේරු (සිවිල්)
සහකාර අධ්‍යක්ෂ (මුදල්)
සහකාර අධ්‍යක්ෂ: තරුණ බලගැන්වීම්,ආදායම් ප්‍රවර්ධන හා ගොවිපල සංවර්ධන,පර්යේෂණ හා සැලසුම්,තරුණ සංවිධාන සංවර්ධන, ජාතික තරුණ මධ්‍යස්ථානය, ජාත්‍යන්තර තරුණ සම්බන්ධතා අංශය,මාධ්‍ය හා නිස්කෝ වීඩියෝ, ප්‍රගති සමාලෝචන හා ඇගයීම්)
සහකාර අධ්‍යක්ෂ: කාර්මික හා වෘත්තීය පුහුණු,විභාග,සෞන්දර්ය කුසලතා සංවර්ධන,අධ්‍යාපනික සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති,ක්‍රීඩා සංවර්ධන,නිකේතනාධිපති
JM
පෞද්ගලික ලේකම්
අභ්‍යන්තර විගණන නිලධාරී
පුහුණු කළමනාකරු
පරිපාලන නිලධාරී (පළාත්)
ජ්‍යෙෂ්ඨ තරුණ සේවා නිලධාරී
පරිපාලන නිලධාරී,ප්‍රවාහන නිලධාරී
පරිගණක වැඩසටහන් සම්පාදක සහ විශ්ලේෂක
කාර්මික නිලධාරී (සිවිල්,විදුලි, ඉලෙක්ට්‍රොනික්)
මූල්‍ය නිලධාරී, ප්‍රසම්පාදන නිලධාරී
මූල්‍ය නිලධාරී
නිෂ්පාදක
වැඩපොල අධිකාරී, පුස්තකාලයාධිපති,පුහුණු කළමනාකරු
MA 4
භාෂා පරිවර්තක
ප්‍රචාරක නිලධාරී
උපදේශන සේවා නිලධාරී
MA 3
තරුණ සේවා නිලධාරී
MA 2-1
ජල/ද්‍රඩාංග කාර්මික ශිල්පී
කාර්මික සහකාර (සිවිල්,විදුලි, ඉලෙක්ට්‍රොනික්)
පොත් තබන්නා
වීඩියෝ සංස්කාරක,සහකාර නිෂ්පාදක,වීඩියෝ කැමරා ශිල්පී, ගොවිපල සහකාර,නිශ්චල ඡායාරූප ශිල්පී
කලා ශිල්පී(සංගීත/නැටුම්) සහකාර පුස්තකාලයාධිපති,වෘත්තීය පුහුණු උපදේශක/ක්‍රීඩා උපදේශක
MA 1-1
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර, සහකාර තරුණ සේවා නිලධාරී
කළමනාකරණ සහකාර ,සහය භාෂා පරිවර්තක
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර, නිවාස පාලිකා,නිවේදක
PL 3
රියදුරු
කාර්මික,විදුලි කාර්මික
කාර්මික ශිල්පී (ශ්‍රව්‍ය/දෘශ්‍ය) කාර්මික ශිල්පී (ආලෝකකරණය)
PL 2
සංචාරක බංගලා භාරකරු,අරක්කැමි
සහය කලා ශිල්පී (සංගීත/නැටුම්)
PL 1
කාර්යාල සහයක
කාර්යාල සහයක
කාර්යාල සහයක
කාර්යාල සහයක
කාර්යාල සහයක
කාර්යාල සහයක
කාර්යාල සහයක
කාර්යාල සහයක
කාර්යාල සහයක
කාර්යාල සහයක
කාර්යාල සහයක

## 1.2 2018.01.01 සිට 2018.04.30 දක්වා සභා අධ්‍යක්‍ෂ මණ්ඩල නාම ලේඛණය

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01 | නීතිඥ, ඩබ්.ජී.එස්.එරන්දික මහතා | සභාපති / අධ්‍යක්ෂ ජනරාල් |
| 02 | අශෝකා අලවත්ත මහත්මිය | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 03 | එච්. හේවගේ මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 04 | කේ.පි. සිරිබද්දන මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 05 | සි.එච්.එස්. දන්ගල්ල මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 06 | නීතිඥ, දසුන් නාගස්හේන මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 07 | නීතිඥ,මදුර ප්‍රියභාෂන වෙල්ගම මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 08 | නීතිඥ,එච්.එම්.සුදර්ශී භාග්‍යා කරුණාරත්න මහත්මිය | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 09 | පුන්සඳ විජයකුමාර මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 10 | චමින්ද තල්ගස්වත්ත මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 11 | රවී ක්‍රිෂාන් ජයවර්ධන මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 12 | බෙන්. රජිත ෂ්‍යාමල් ගුණවර්ධන මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 13 | ඩබ්. බුද්ධික ලක්මාල් ගුණසේකර මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 14 | වි.එ.එච්. සදරුවනි මහත්මිය | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 15 | නිරෝෂා විරාජිනි මහත්මිය | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 16 | නිලූක කරුණාරත්න මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |

මූලාශ්‍රය - ලේකම් අංශය, ජාතික තරුණ සේවා සභාව,මහරගම.

2018.08.03 පසු පත් වූ සභා අධ්‍යක්ෂ මණ්ඩලයේ නාම ලේඛණය

| අනු අංකය | නම | තනතුර | පත් වූ දිනය |
|---|---|---|---|
| 01 | නීතිඥ, ඩබ්.ජී.එස්.එරන්දික මහතා | සභාපති / අධ්‍යක්ෂ ජනරාල් | |
| 02 | එස්.එච්.ඒ.එන්.ඩී. අභයරත්න මහත්මිය | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2018.09.10 |
| 03 | එච්. හේවගේ මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2018.09.10 |
| 04 | සී.එච්.එස්. දන්ගල්ල මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2018.09.17 |
| 05 | ඩී.එස්. විජේසේකර මහත්මිය | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2018.09.25 |
| 06 | නීතිඥ, දසුන් නාගස්හේන මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2018.08.03 |
| 07 | පුන්සඳ විජයකුමාර මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2018.08.03 |
| 08 | ඩබ්. බුද්ධික ලක්මාල් ගුණසේකර මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2018.08.03 |
| 09 | නීතිඥ, කණිෂ්ක රාජපක්ෂ මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2018.08.03 |
| 10 | කේ.එම්.රොමේෂ් සුගතපාල මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2018.08.03 |
| 11 | නවෝද්‍යා ජයසිංහ මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2018.08.03 |
| 12 | සම්පත් නිරෝෂ දික්කුඹුර මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2018.08.03 |
| 13 | සතිර සරච්චන්ද්‍ර මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2018.08.03 |

මූලාශ්‍රය - ලේකම් අංශය, ජාතික තරුණ සේවා සභාව,මහරගම

2018.11.02 පසු පත් වූ සභා අධ්‍යක්ෂ මණ්ඩලයේ නාම ලේඛණය

| අනු අංකය | නම | තනතුර | පත් වූ දිනය |
|---|---|---|---|
| 01 | මනුල වමල් පෙරේරා මහතා | සභාපති / අධ්‍යක්ෂ ජනරාල් | 2018.11.02 |
| 02 | එච්. හේවගේ මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2018.09.10 |
| 03 | එස්.එච්.ඒ.එන්.ඩී. අභයරත්න මහත්මිය | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2018.09.10 |
| 04 | ඩී.එස්. විජේසේකර මහත්මිය | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2018.09.25 |
| 05 | විජිතා සෙනවිරත්න මහත්මිය | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2018.11.26 |
| 06 | කේ. ගුණවර්ධන මහත්මිය | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2018.11.26 |
| 07 | මෙරිල් ගුණතිලක මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2018.11.26 |
| 08 | ආර්.ඩී. අනුර රණසිංහ මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2018.11.26 |
| 09 | සමන් .ඩී. වඩුගේ මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2018.11.26 |
| 10 | සී.එච්.එස්. දන්ගල්ල මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2018.09.17 |

මූලාශ්‍රය - ලේකම් අංශය, ජාතික තරුණ සේවා සභාව,මහරගම.

## 2. විගණක හා කළමනාකරණ කමිටුව - 2018

- සී.එච්.එස්.දන්ගල්ල මහතා — කමිටු සභාපති
  සහකාර අධ්‍යක්ෂ
  රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

- නීතිඥ දසුන් නාගස්හේන මහතා — කමිටු සාමාජික
  සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

- බෙන් රජිත ශ්‍යාමල් ගුණරත්න මහතා — කමිටු සාමාජික
  සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

- පී.ඒ.කාන්ති මහත්මිය — නිරීක්ෂක
  ප්‍රධාන අභ්‍යන්තර විගණක,
  ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය.

- එම්.ඒ.එස්.පුෂ්පරාණි මහත්මිය — ආරාධිත
  විගණන අධිකාරී,
  විගණකාධිපති දෙපාර්තමේන්තුව

- ඩබ්.එල්.නාමරත්න මහතා — ලේකම්/කැඳවුම්කරු
  ප්‍රධාන අභ්‍යන්තර විගණක
  ජාතික තරුණ සේවා සභාව

- සී.කේ.හේරත් මහත්මිය — කමිටුවේ හිටපු ලේකම්/කැඳවුම්කරු

මූලාශ්‍රය - අභ්‍යන්තර විගණන අංශය, ජාතික තරුණ සේවා සභාව,මහරගම.

### 3. ජාතික තරුණ සේවා සභාවේ ලැබීම් හා වියදම් පිළිබඳ විස්තරය

ජාතික තරුණ සේවා සභාවේ 2018 වර්ෂයේ ප්‍රතිපාදන ලැබීම්.

(රු. 000)


| | | **2018** |
|---|---|---|
| භාණ්ඩාගාර | | |
| | පුනරාවර්තන | 999,930 |
| | සංවර්ධන | 531,475 |
| | ප්‍රාග්ධන | 221,000 |
| **මුළු භාණ්ඩාගාර ප්‍රතිපාදන** | | **1,752,405** |
| අමාත්‍යාංශ | | |
| | පුනරාවර්තන | 482,783 |
| | ප්‍රාග්ධන | 497,202 |
| **මුළු අමාත්‍යාංශ ප්‍රතිපාදන** | | **979,985** |
| පලාත් සභා | | |
| | පුනරාවර්තන | 150 |
| **පලාත් සභා** | | **150** |
| විදේශ සංවිධාන | | |
| | පුනරාවර්තන | 6,441 |
| | ප්‍රාග්ධන | 45,980 |
| **විදේශ සංවිධාන** | | **52,421** |
| වෙනත් බාහිර ආයතන ලැබීම් | | |
| | පුනරාවර්තන | 1,213 |
| **වෙනත් බාහිර ආයතන ලැබීම්** | | **1,213** |
| අභ්‍යන්තර ඉපයීම් | | |
| | අභ්‍යන්තර ආදායම් | 243,060 |
| **අභ්‍යන්තර ඉපයීම්** | | **243,060** |

ජාතික තරුණ සේවා සභාවේ 2018 වර්ෂයේ ප්‍රතිපාදන ගෙවීම්.


(රු. 000)

| | | **2018** |
|---|---|---|
| භාණ්ඩාගාර | | |
| | පුනරාවර්තන | 999,930 |
| | සංවර්ධන | 494,526 |
| | ප්‍රාග්ධන | 221,000 |
| **මුළු භාණ්ඩාගාර ගෙවීම්** | | 1,715,456 |
| අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතන වැය | | |
| | පුනරාවර්තන | 482,626 |
| | ප්‍රාග්ධන | 490,491 |
| **මුළු අමාත්‍යාංශ ගෙවීම්** | | 973,117 |
| පලාත් සභා | | |
| | පුනරාවර්තන | 150 |
| **මුළු පලාත් සභා ගෙවීම්** | | 150 |
| විදේශ සංවිධාන | | |
| | පුනරාවර්තන | 10,971 |
| | ප්‍රාග්ධන | 53,392 |
| මුළු විදේශ සංවිධාන ගෙවීම් | | 64,363 |
| වෙනත් බාහිර ආයතන වැය | | |
| | පුනරාවර්තන | 3,483 |
| මුළු වෙනත් බාහිර ආයතන වැය | | 3,483 |
| අභ්‍යන්තර ඉපයීම් වැය | | |
| | පුනරාවර්තන | 124,806 |
| | සංවර්ධන | 109,798 |
| | ප්‍රාග්ධන | 3,115 |
| **මුළු අභ්‍යන්තර ඉපයීම් වැය** | | 237,719 |

ජාතික තරුණ සේවා සභාවේ 2018 වර්ෂයේ ප්‍රතිපාදන ලැබීම්




ජාතික තරුණ සේවා සභාවේ 2018 වර්ෂයේ ප්‍රතිපාදන ගෙවීම්




ජාතික තරුණ සේවා සභාව වෙත භාණ්ඩාගාරය, අභ්‍යන්තර ඉපයීම් සහ වෙනත් බාහිර ආයතන මඟින් සෘජු හා වක්‍ර ලෙස ප්‍රතිපාදන වලින් දරණ ලද පරිපාලන හා සංවර්ධන වියදම් (රුපියල් මිලියන)

2013– 2018

| ප්‍රතිපාදන | වර්ෂය | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
| සංවර්ධන | 716 | 831 | 565 | 768 | 1212 | 1115 |
| පරිපාලන | 745 | 795 | 1014 | 1014 | 1075 | 1124 |

ජාතික තරුණ සේවා සභාව වෙත භාණ්ඩාගාරය, අභ්‍යන්තර ඉපයීම් සහ වෙනත් බාහිර ආයතන මඟින් සෘජු හා වක්‍ර ලෙස ප්‍රතිපාදන වලින් දරණ ලද පරිපාලන හා සංවර්ධන වියදම් (රුපියල් මිලියන)

2013 – 2018



සංවර්ධන වැඩසටහන් වියදම් සාරාංශය

| අනු අංකය | වැඩසටහන | වෙන්කල මුදල | රුපියල් (මිලියන) | වැය කළ මුදල | රුපියල් (මිලියන) |
|---|---|---|---|---|---|
| | | | | | ,000 |
| | | භාණ්ඩාගාර | අමාත්‍යාංශ | භාණ්ඩාගාර | අමාත්‍යාංශ |
| 1 | සෞන්දර්යය කුසලතා සංවර්ධන වැඩසටහන් | 87.9 | | 75.64 | 17.84 |
| 2 | ජාත්‍යන්තර තරුණ සබඳතා ක්‍රියාකාරකම් | 36 | | 44.39 | |
| 3 | තරුණ සංවිධාන හා සංවර්ධන වැඩසටහන් | 71 | 50 | 65.73 | 35.54 |
| 4 | යෞවන තිලිණ අධිකාරිය ක්‍රියාකාරකම් | 43 | | 10.12 | |
| 5 | ක්‍රීඩා සංවර්ධන ක්‍රියාකාරකම් | 188 | | 120.76 | |
| 6 | කාර්මික හා වෘත්තීය පුහුණු ක්‍රියාකාරකම් | 80.7 | | 97.32 | |
| 7 | තරුණ සමුපකාර හා ව්‍යාපාර සංවර්ධන ක්‍රියාකාරකම් | 10 | | 6.9 | |
| 8 | ආර්ථික ප්‍රවර්ධන හා ගොවිපල ක්‍රියාකාරකම් | 25 | | 11.28 | |
| 9 | මාධ්‍ය ක්‍රියාකරකම් | 10 | | 10.57 | |
| 10 | නිස්කෝ වීඩියෝ ක්‍රියාකරකම් | 5 | | 2.75 | |
| 11 | සැලසුම් හා සංවර්ධන ක්‍රියාකරකම් | 6.6 | | 2.5 | |
| 12 | තොරතුරු තාක්ෂණ ක්‍රියාකරකම් | 25 | | 15.42 | |
| 13 | කාර්ය සාධන හා නිලධාරි ඇගයීම් ක්‍රියාකාරකම් | 15 | | 9.78 | |
| 14 | ඉදිකිරීම් ක්‍රියාකාරකම් | 169.8 | 300 | 75.83 | 263.37 |
| 15 | සැපයුම් ක්‍රියාකාරකම් | 40 | | 77.48 | 0.29 |
| 16 | විශේෂ ව්‍යාපෘති ක්‍රියාකාරකම් | 16 | 600 | 15.2 | 429.23 |
| 17 | වෘත්තීය මාර්ගෝපදේශන ක්‍රියාකාරකම් | 20 | | 6.15 | |
| 18 | ඉඩම් | 1 | | 0.15 | |
| | එකතුව | 850 | 950 | 647.99 | 746.27 |

## සංවර්ධන ක්‍රියාකාරකම් - 2018

### 4.1 තරුණ සංවිධාන හා සංවර්ධන ක්‍රියාකාරකම්.

1. ග්‍රාමීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා තරුණ තරුණියන් ඒකරාශී කර තරුණ තරුණියන් විවිධ ප්‍රජා සංවර්ධන කටයුතු ඉටු කිරීමට මෙම සංවිධාන ජාලය කටයුතු කරනු ලැබේ.ඒ තුළින් ලබාදෙන අත්දැකීම් හරහා ඔවුන්ගේ නායකත්ව හා පෞර්ෂ සංවර්ධනය මෙන්ම ජාතිකාභිමානය හා විනය පිළිබඳ හැඟීම් ඇති කිරීම හා දිරිගැන්වීම තරුණ සංවිධාන සංවර්ධන අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

2. තරුණ සංවර්ධන ප්‍රවේශයන් ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමට අවශ්‍ය වන ප්‍රායෝගික හා තාක්ෂණික පහසුකම් සපයමින් තිරසර තරුණ සංවිධාන ජාලයක් ලෙස යෞවන සමාජ වැඩපිළිවෙළ ශක්තිමත් කිරීම.

3. ශ්‍රී ලංකාවේ සෑම ග්‍රාම නිලධාරී වසමක්ම ආවරණය වන පරිදි යෞවන සමාජ ව්‍යාපාරය ව්‍යාප්ත කිරීම සහ සාමාජිකත්වය ප්‍රවර්ධනය කිරීම.

4. යෞවන සමාජ ,ප්‍රාදේශීය මණ්ඩල ,දිස්ත්‍රික් මණ්ඩල සහ ජාතික මණ්ඩල ස්ථාපිත කිරීම හා තරුණ සංවිධාන වල නායකයින් ජාතික සංවර්ධනයට දායක කිරීම සඳහා ප්‍රවේශයන් හඳුන්වා දීම.

5. වත්මන් තොරතුරු තාක්ෂණ ලෝකයට ගැලපෙන ලෙස තරුණ තරුණියන් තුළ කුසලතාවය වර්ධනය කිරීම.


6. ප්‍රාදේශීය මට්ටමේ තරුණයන් සහ වැඩිහිටියන් දැනුවත් කිරිමේ මත් නිවාරණ කමිටු පිහිටුවමින් ප්‍රජා දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම හා ඒකාබද්ධ වැඩසටහන් හඳුන්වාදීම මඟින් පොදු මත් විරෝධී ප්‍රජා වැඩසටහන් සංවිධානය කිරීම.

7. ශ්‍රී ලංකාවේ වෙසෙන ප්‍රධාන ජාතීන් වූ සිංහල,දෙමළ හා මුස්ලිම් තරුණයන් අතරේ අන්‍යෝන්‍ය මිත්‍රත්වය ඇති කිරීම තුළින් සැකය හා අවිශ්වාසය දුරුකර ජාතික සංහිඳියාව ඇති කරලීම සඳහා තරුණයින් තුළ ස්ථිරසාර ආකල්ප ජනිත කිරීම.

සමාජ සම්මේලනයේ ලියාපදිංචි යෞවන සමාජ පිළිබඳ විස්තර

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය මණ්ඩල ප්‍රමාණය | ග්‍රාම නිලධාරි වසම් ප්‍රමාණය | සාමාජික සංඛ්‍යාව (ලේඛන අනුව ) | සම්මේලනයේ ලියාපදිංචි යෞවන සමාජ ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| 1. | කොළඹ | **08** | **454** | 6916 | 287 |
| 2. | කොළඹ 1 | **08** | **103** | 2102 | 84 |
| 3. | ගම්පහ | **13** | **1177** | 22007 | 732 |
| 4. | කළුතර | **14** | **762** | 16009 | 597 |
| 5. | ගාල්ල | **19** | **896** | 13840 | 631 |
| 6. | මාතර | **16** | **650** | 4371 | 598 |
| 7. | හම්බන්තොට | **12** | **576** | 8302 | 470 |
| 8. | මහනුවර | **20** | **1188** | 24849 | 868 |
| 9. | මාතලේ | **11** | **545** | 8920 | 411 |
| 10. | නුවරඑළිය | **05** | **491** | 10703 | 389 |
| 11. | මොණරාගල | **11** | **319** | 7933 | 306 |
| 12. | බදුල්ල | **15** | **567** | 16759 | 511 |
| 13. | කෑගල්ල | **11** | **573** | 10228 | 444 |
| 14. | රත්නපුර | **17** | **575** | 15189 | 478 |
| 15. | කුරුණෑගල | **30** | **1610** | 21159 | 1200 |
| 16. | පුත්තලම | **16** | **548** | 9546 | 421 |
| 17. | අනුරාධපුරය | **22** | **694** | 13597 | 543 |
| 18. | පොලොන්නරුව | **07** | **295** | 6061 | 252 |
| 19. | ත්‍රිකුණාමලය | **11** | **230** | 9278 | 240 |
| 20. | මඩකලපුව | **14** | **348** | 17076 | 352 |
| 21. | අම්පාර | **20** | **503** | 19130 | 482 |
| 22. | වව්නියාව | **04** | **102** | 5211 | 102 |
| 23. | මන්නාරම | **05** | **153** | 5099 | 155 |
| 24. | කිලිනොච්චිය | **04** | **95** | 2635 | 97 |
| 25. | මුලතිව් | **06** | **136** | 4721 | 142 |
| 26. | යාපනය | **15** | **435** | 10544 | 436 |
| | එකතුව | **334** | **14025** | 292185 | 11228 |

ලියාපදිංචි යෞවන සමාජ ප්‍රමාණය.




යොවුන්පුරය තුළ ක්‍රියාත්මක කල වැඩසටහන් - 2018

| අනු අංකය | වැඩසටහන් | වැඩසටහන් ගණන | සහභාගීත්වය |
|---|---|---|---|
| 1. | ආපදා කළමනාකරණය හා පෙර සූදානම් වීම පිළිබඳ පුහුණු වැඩසටහන | 01 | 125 |
| 2. | යොවුන්පුර නගර සභාව පිහිටුවීම හා පුහුණුව (සුවති නගර සංකල්පය) | 01 | 52 |
| 3. | යොවුන්පුර සහභාගිකයන් සම්බන්ධීකරණය හා කැඳවීම | 01 | 6593 |
| 4. | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩපිළිවෙල ආශ්‍රිත ආයතන විසින් ක්‍රියාත්මක කල වැඩසටහන් | 05 | 1610 |

තරුණ සංවිධාන සංවර්ධන අංශයේ වැඩසටහන් පිළිබඳ විස්තර.

| අනු අංක | වැඩසටහන් | වැඩසටහන් ගණන | සහභාගීත්වය |
|---|---|---|---|
| 01 | යෞවන සමාජ පිහිටුවීම | 11238 | 292185 |
| 02 | ප්‍රාදේශීය මණ්ඩල පිහිටුවීම | 334 | 33400 |
| 03 | දිස්ත්‍රික්ක මණ්ඩල පිහිටුවීම | 26 | 3900 |
| 04 | උපදේශක කාරක සභා පිහිටුවීම | 122 | 9034 |
| 05 | තෛපොංගල් සැමරුම | 01 | 1100 |
| 06 | ජාතික තරුණ දින සැමරුම ( E-Library ගමට දැනුම) | 35 | |
| 07 | ජාත්‍යන්තර තරුණ දින සැමරුම | 01 | 1680 |
| 08 | තරුණ නායකත්ව පුහුණු කඳවුර | 334 | 22567 |
| 09 | No Drugs අපි Youth ( දිස්ත්‍රික්ක මට්ටම ) | 15 | 14500 |
| 10 | No Drugs අපි Youth ( ජාතික මට්ටම ) | 01 | 1000 |
| 11 | දේශීය තරුණ හුවමාරු වැඩසටහන | 20 | 1295 |
| 12 | සුවති යෞවනය බෝ නොවන රෝග වලක්වා ගැනීම පිළිබඳ වැඩසටහන | 25 | 1292 |

තරුණ සංවර්ධන ක්‍රියාකාරකම් වල විශේෂ අවස්ථා.






## 4.2 වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ක්‍රියාකාරකම්.

ජාතික තරුණ සේවා සභාවේ වෘත්තීය මාර්ගෝපදේශණ හා උපදේශණ අංශය යටතේ ඇති සියලුම වෘත්තීය මාර්ගෝපදේශණ හා උපදේශණ මධ්‍යස්ථානයන් වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරියෙකු යටතේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයක් ස්ථාපිත කොට ඇත.රැකියාවකට යොමු වීමට කැමති තරුණ තරුණියන් හට වෘත්තීය මාර්ගෝපදේශණ මධ්‍යස්ථාන මගින් ඒ සඳහා අවශ්‍ය කරනු ලබන මඟ පෙන්වීමේ කටයුතු කරනු ලබන අතර විවිධ මානසික සහ වෙනත් ගැටළු සහිත පුද්ගලයින් හට උපදේශන මධ්‍යස්ථාන මගින් අවශ්‍ය කරනු ලබන පහසුකම් සපයනු ලබයි.

පාසැල් සිසුන්, ගුරුවරුන්, පාසැල් අධ්‍යාපනය අවසන්කල සිසුන්, දෙමාපියන්, වැඩිහිටියන් හා අනෙකුත් රාජ්‍ය හා ස්වේච්ඡා සංවිධාන වල නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,සුදුසු පරිදි ඒ ඒ ප්‍රදේශ වල පැවැත්වෙන ප්‍රදර්ශන කටයුතු සඳහා සහභාගිත්වය ලබාදීම සහ එම වැඩසටහන් වල ප්‍රගතිය නිරීක්ශණය කිරිම.

2018 වර්ශයේ ක්‍රියාත්මක කල වැඩසටහන්

- **"පාසලින් වැඩ ලොවට"** - අනාගත ජීවන ඉලක්ක ගොඩනැගීමේ වැඩසටහන මගින් දිවයිනේ සියළුම පාසල් ආවරණය වන පරිදි සිංහල සහ දමිල තරුණ තරුණියන් සඳහා වෘත්තීය නිපුණතා පරීක්ෂණයකට තරුණ පිරිස භාජනය කිරීම,තම වෘත්තීය අනාගත ඉලක්ක ගොඩනැගීම හා වර්තමාන වැඩලෝකයේ ප්‍රවනතා හා උපයා ගත යුතු ප්‍රාප්තීන් හඳුනාගැනීම / අවබෝධ කර ගැනීම යන අංශ අවරණය වන පරිදි දැනුවත් කරන ලදී.
- රැකියා පොළ - දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමඟ සම්බන්ධව ප්‍රධාන පෙලේ පෞද්ගලික හා රාජ්‍ය ආයතන සහභාගීත්වයෙන් පැවැත් වූ අතර ඒ සඳහා විශාල තරුණ තරුණියන් පිරිසක් සහභාගී විය.
- **Vesume - සැකසීම**

වර්තමානයේ රැකියා සපයන ආයතන නවීන තාක්ෂණය භාවිතා කරමින් තම සේවා අවශ්‍යතාවයන් සපුරාගනු ලබන අතර සම්ප්‍රදායික ජීව දත්ත ලබා ගැනීමෙන් ඔබ්බට ගොස් Vesume සැකසීම කරනු ලැබේ.

දිවයිනේ දිස්ත්‍රික්ක කිහිපයක් ආවරණය වන පරිදි Vesume සැකසීමේ වැඩසටහන ක්‍රියාත්මක කර අතර ඒ සඳහා සිංහල සහ දමිල තරුණ තරුණියන් සහභාගී විය.

## 4.3 ක්‍රීඩා සංවර්ධන ක්‍රියාකාරකම්

ජාතික තරුණ සේවා සභාවේ වාර්ෂික සංවර්ධන වැඩසටහන් අතුරින් ක්‍රීඩා සංවර්ධන වැඩසටහන් තාරුණ්‍යට වඩාත් ඵලදායි ලෙස 2018 වසරේදී ක්‍රියාත්මක කොට ඇත. සමස්ථ ශ්‍රී ලාංකේය යෞවන සමාජ සාමාජික සාමාජිකාවන්ගේ ක්‍රීඩා කුසලතාවන් ග්‍රාමීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා ඔසවා තබාගැනීම සඳහා වසර පුරා විවිධ ක්‍රීඩා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර, ඒ තුළින් ඔවුන් කායික හා මානසික වශයෙන් සෞඛ්‍ය සම්පන්න ශක්තිමත් තාරුණ්‍යයක් බවට පත්කොට ඔවුන් තුළ ජනිත වන තාරුණ්‍යයේ ජවය ජාතික සංවර්ධන ප්‍රවාහය වෙත මුදාහැරීමට හැකිවීම අප ලද සාර්ථකත්වය වේ.

වාර්ෂික වැඩ සැලැස්මට අනුව වර්ෂය පුරා පහත සඳහන් ක්‍රීඩා වැඩසටහන් ක්‍රීඩා සංවර්ධන අංශය මගින් සංවිධානය කොට ක්‍රියාත්මක කරන ලදි.



01. ජාතික යෞවන ක්‍රීඩා උළෙල
02. තරුණ සේවා රූපවාහිනී වොලිබෝල් තරඟාවලිය
03. තරුණ සේවා ක්‍රීඩා සමාජය
04. ක්‍රීඩා සංචිතය
05. ආධුනික පුහුණුකරුවන් පුහුණු කිරීමේ කඳවුරු වැඩසටහන
06. යෞවන සමාජ සඳහා ක්‍රීඩා භාණ්ඩ බෙදාදීම
07. දිවා රාත්‍රී වොලිබෝල් ක්‍රීඩාංගණ නවීකරණය කිරීම
08. යොවුන් පුර වැඩසටහනට සමගාමීව ක්‍රීඩා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
09. තෛපොංගල් වැඩසටහනට සමගාමීව ක්‍රීඩා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
10. සූර්ය මංගල්‍යයට සමගාමීව පාපැදි තරඟ/කඹ ඇදීම/මැරතන්



ජාතික යෞවන ක්‍රීඩා සඳහා දිස්ත්‍රික් 26 ආවරණය වන පරිදි ක්‍රීඩා අංශ 10ක් යටතේ ක්‍රීඩකයන් 3598ක සහභාගීත්වයෙන් කණ්ඩායම් තරඟ පවත්වන ලදි.

නව තරඟ වාර්තාවන්

| තරඟ අංශය | ක්‍රීඩක/ක්‍රීඩිකාවගේ නම | දිස්ත්‍රික්කය | නව තරඟ වාර්තාව |
|---|---|---|---|
| **අවුරුදු 20න් පහළ පිරිමි** | | | |
| උස පැනීම | එස්.ඒ. තරිඳු දසුන් | ගාල්ල | 2.12 M |
| මීටර් 200 | එස්.පී.ඒ. දර්ශන | මාතලේ | 21.33 sec |
| මීටර් 800 (මූලික තරඟ) | ආර්.පී.අයි. ලක්ෂාන් | පුත්තලම | 1:55.20 sec |
| මීටර් 400 | පී.එම්.පී.එල්. කොඩිකාර | කුරුණෑගල | 48.58 sec |
| **අවුරුදු 20න් ඉහළ කාන්තා** | | | |
| දුර පැනීම | ඒ. පුල්වන්ස | කොළඹ | 5.96 M |
| **අවුරුදු 20න් පහළ කාන්තා** | | | |
| මීටර් 100 කඩුළු | එන්.ජී.පී.ආර්. ගුණතිලක | කෑගල්ල | 15.24 sec |

**දක්ෂතම ක්‍රීඩක ක්‍රීඩිකාවන්**

| | | | |
|---|---|---|---|
| 20න් පහළ කාන්තා | තුම් පිම්ම | වි.ආර්. හිමාෂ කුරේ | නාගරික තරුණයා |
| 20න් පහළ පිරිමි | මීටර් 200 | එස්.පී.ඒ. දර්ශන | මාතලේ |
| 20න් ඉහළ කාන්තා | මීටර් 400 | නදීෂා රාමනායක | හම්බන්තොට |
| 20න් ඉහළ පිරිමි | දුර පැනීම | ඩබ්.පී. අමිල ජයසිරි | පුත්තලම |

**- ජාතික යෞවන ක්‍රීඩා උලෙළ විශේෂ අවස්ථා**







තරුණ සේවා රූපවාහිනී වොලිබෝල් තරඟාවලිය

**අභියෝග ශූරතාවය (කාන්තා)**

| අනු අංකය | ලබාගත් ස්ථානය | දිස්ත්‍රික්කය |
|---|---|---|
| 01 | ප්‍රථම ස්ථානය | කෑගල්ල දිස්ත්‍රික්කය |
| 02 | දෙවන ස්ථානය | පුත්තලම දිස්ත්‍රික්කය |
| 03 | තෙවන ස්ථානය | අම්පාර දිස්ත්‍රික්කය |



**අභියෝග ශූරතාවය (පිරිමි)**

| අනු අංකය | ලබාගත් ස්ථානය | දිස්ත්‍රික්කය |
|---|---|---|
| 01 | ප්‍රථම ස්ථානය | හම්බන්තොට දිස්ත්‍රික්කය |
| 02 | දෙවන ස්ථානය | කෑගල්ල දිස්ත්‍රික්කය |
| 03 | තෙවන ස්ථානය | කළුතර දිස්ත්‍රික්කය |



**සුපර් ලීග් (පිරිමි)**

| අනු අංකය | ලබාගත් ස්ථානය | දිස්ත්‍රික්කය |
|---|---|---|
| 01 | ප්‍රථම ස්ථානය | ශ්‍රී ලංකා යුධ හමුදා කණ්ඩායම |
| 02 | දෙවන ස්ථානය | ශ්‍රී ලංකා ගුවන් හමුදා කණ්ඩායම |
| 03 | තෙවන ස්ථානය | තරුණ සේවා ක්‍රීඩා කණ්ඩායම |

**සුපර් ලීග් (කාන්තා)**

| අනු අංකය | ලබාගත් ස්ථානය | දිස්ත්‍රික්කය |
|---|---|---|
| 01 | ප්‍රථම ස්ථානය | කැෂුවලයින් ක්‍රීඩා කණ්ඩායම |
| 02 | දෙවන ස්ථානය | ශ්‍රී ලංකා යුධ හමුදා කණ්ඩායම |
| 03 | තෙවන ස්ථානය | ශ්‍රී ලංකා ගුවන් හමුදා කණ්ඩායම |

**<u>ක්‍රීඩා සංචිත වැඩසටහනේ ලද ජයග්‍රහණයන්</u>**

අවුරු 23න් පහළ වොලිබෝල් (කාන්තා) කණිෂ්ඨ සංචිතය සඳහා සංසලා නෙත්මිනි ක්‍රීඩිකාව තෝරාගෙන ඇත.

ආසියානු කබඩි ක්‍රීඩා තරඟාවලිය - ඉන්දුනීසියාව

- ඩබ්.ජී. නිශාන්ත ක්‍රීඩකයා

සඳුනි මල්ෂා සහ කේ. ලෂිනියා නැමැති ක්‍රීඩිකාවන් 2018 ජාතික මහ ක්‍රීඩා උළෙලේ වොලිබෝල් (කාන්තා) අවසන් මහ තරඟය සඳහා සහභාගි වී ඇත.

තරුණ සේවා රූපවාහිනී සුපර්ලීග් වොලිබෝල් තරඟාවලියේ පිරිමි අංශයේ තෙවන ස්ථානය 2018 වර්ෂයේ දී ජාතික තරුණ සේවා සභා කණ්ඩායම හිමි කරගන්නා ලදි

තරුණ සේවා රූපවාහිනී වොලිබෝල් තරඟාවලිය විශේෂ අවස්ථා







ක්‍රිඩා සංවර්ධන වැඩසටහන්

| අනු අංකය | වැඩසටහනේ නම | වැඩසටහන් ප්‍රමාණය | තරුණ සහභාගිත්වය |
|---|---|---|---|
| 01 | ජාතික යෞවන ක්‍රීඩා | | |
| | ප්‍රාදේශීය මට්ටම | 337 | 253410 |
| | දිස්ත්‍රික්ක මට්ටම | 26 | 31106 |
| | ජාතික මට්ටම | 01 | 1351 |
| 02 | ක්‍රීඩා සංචිත | | |
| | වොලිබෝල් | 01 | 40 |
| | කබඩි | 01 | 15 |
| | ජූඩෝ | 01 | 15 |
| 03 | තරුණ සේවා ක්‍රීඩා සමාජය | 01 | 1370 |
| 04 | තරුණ සේවා රූපවාහිනි වොලිබෝල් තරඟාවලිය | | |
| | අභියෝග ශූරතාවය | 20 | 3600 |
| | දිස්ත්‍රික් ශූරතාවය | 24 | 288 |
| | සුපර්ලීග් | 01 | 520 |
| | ජාතික ශූරතාවය | 01 | 112 |
| 05 | ආධුනික පුහුණුකරුවන් පුහුණු කිරිමේ වැඩසටහන | 12 | 760 |
| 06 | යෞවන සමාජ සඳහා ක්‍රීඩා භාණ්ඩ බෙදාදීම | 201 | 1472 |
| 07 | දිවා රාත්‍රී වොලිබෝල් ක්‍රීඩාංගනය නිරික්ෂන කිරීම | 01 | 453 |
| 08 | යොවුන් පුර වැඩසටහනට සමගාමීව ක්‍රීඩා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 09 | 4110 |
| 09 | තෛපොංගල් වැඩසටහනට සමගාමීව ක්‍රීඩා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 03 | 518 |
| 10 | සූර්ය මංගල්‍යයට අවුරුදු උත්සවයට සමගාමීව ක්‍රීඩා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 04 | 820 |

## 4.4 සෞන්දර්ය කුසලතා සංවර්ධන ක්‍රියාකාරකම්

01. ජාතික යෞවන සම්මාන තරගාවලිය සහ උළෙල



ශ්‍රී ලාංකීය කලාකෙත පෝෂණය කිරීම සඳහා අංකුර කලාකරුවන් හෙවත් කලාකෙතට අත්පොත් තබන නව යොවුන් නිර්මාණකරුවන් හඳුනා ගැනීම, නිර්මාණකරණයට සහය ලබා දීම හා ඒවා ඇගයීමට ලක් කිරීම ඉතා වැදගත් වේ. මේ තුලින් බිහි වන නව යොවුන් නිර්මාණකරුවන් අනාගත කලා ක්ෂේත්‍රය පෝෂණය කිරීම සඳහා සුවිශේෂී මෙහෙවරක් ඉටු කරනු ලබන අතර එය ශ්‍රී ලාංකීය කලාකෙත සශ්‍රීක කිරීම සඳහා මහත් පිටුවහලක් වේ. මේ සඳහා ග්‍රාමීය මට්ටමේ නව යොවුන් නිර්මාණකරුවන් හඳුනා ගැනීම හා ජාතික



මට්ටමට හඳුන්වා දීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කිරීම ජාතික තරුණ සේවා සභාවේ කාර්ය භාරයක් වනු ඇත. මේ සඳහා ජාතික තරුණ සේවා සභාව ජාතික යෞවන සම්මාන නමින් නිර්මාණකරුවන් ඇගයීමට ලක් කර සම්මාන පිරි නැමීමේ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන අතර එය දිස්ත්‍රික් පළාත් හා ජාතික ලෙස අදියර 03 ක් ක්‍රියාත්මක වේ.

02. ජාතික යොවුන් නාට්‍ය උළෙල

තරුණ තරුණියන් අතර නාට්‍ය කලාව කෙරෙහි උනන්දුවක් ඇති කිරීම.ප්‍රාදේශීය වශයෙන් නාට්‍ය කලාවට උනන්දුවක් දක්වන තරුණ නාට්‍යකරුවන්ගේ දක්ෂතාවයන් ජාතික මට්ටමට දක්වා ඇගයීම සඳහා මෙම ව්‍යාපෘතිය ස්ථාපනය කර ඇත.

03. සෞන්දර්ය නිකේතන සංවර්ධනය



සෞන්දර්ය ක්ෂේත්‍රය දියුණු කිරීම තුලින් සුභවාදී සමාජයක් ගොඩ නැංවීම රටක යහපැවැත්ම සඳහා සෞන්දර්ය විෂයට අදාළ ක්ෂේත්‍රවල ව්‍යාපෘති කිරීම ඉතා වැදගත් වේ. ජාතික තරුණ සේවා සභාව රාජ්‍ය ආයතනයක් ලෙස බෙල්වුඩ් සෞන්දර්ය නිකේතනය, එරමිණියාය සෞන්දර්ය නිකේතනය හා මහරගම සෞන්දර්ය නිකේතනය තුල සංගීතය හා නැටුම් යන අංශ ආවරණය වන ආකාරයට ඩිප්ලෝමා පාඨමාලා පවත්වනු ලැබේ. වසර 03 ක විධිමත් ඩිප්ලෝමා පාඨමාලාවක් ලෙස න්‍යායික හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුලත් පුහුණුවක් ලබාදීම තුලින් අභ්‍යාසලාභීන්ගේ සෞන්දර්යාත්මක දැනුම වර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂා කෙරේ.

04. හා රංග කලා ඩිප්ලෝමා පාඨමාලාව

ප්‍රවීණතම හා දක්ෂතා ඇති තරුණ නාට්‍ය ශිල්පීන්ගෙන් සැදුම්ලත් දේශක මහතුන්ගේ උපදේශකත්වයෙන් තරුණ නාට්‍ය ශිල්පීන් පිරිසකට ජාතික තලයට පිවිසීම සඳහා මාර්ගෝපදේශ ලබාදීම.නාට්‍ය කලාවට ඇලුම් කරනඡ් පිළිබද උනන්දුවක් දක්වන දිවයින පුරා විසිරී සිටින තරුණ තරුණියන්ගේ කුසලතා වර්ධනය කිරීම මෙතුලින් බලාපොරොත්තු වේ. රගපෑම, නිෂ්පාදනය, රචනය, අංග රචනා, පසුතල නිර්මාණ ආදී පුළුල් ක්ෂේත්‍රයන් ඔස්සේ දැනුම ලබා දෙමින් ශිල්පියෙකු බිහි කිරීම මෙම සය මාසික පාඨමාලාව තුලින් සිදු කරනු ලබයි.

05.යොවුන් නාට්‍ය සංදර්ශන

නාට්‍ය කලාව කෙරෙහි ඇල්මක් දක්වන ප්‍රබුද්ධ පිරිසක් බිහි කිරීම හා ඉහල රසඥතාවයක් ඇති තරුණ පිරිසක් බිහි කිරීම යෞවන සම්මාන උළෙල හරහා සම්මානයට පාත්‍ර වූ තරුණ තරුණියන් විසින් නිෂ්පාදිත නාට්‍ය මහජන ප්‍රදර්ශනය අවස්ථාව උදාකර දීම වෙනුවෙන් මෙම ව්‍යාපෘතිය නිර්මාණය කර ඇත. විශේෂයෙන් තරුණ නිර්මාණකරුවන් හරහා නව නාට්‍ය නිර්මාණ බිහි කිරීමට අත දීම හා ඔවුන් ඇගයීමට ලක් කිරීම මෙහිදී වැඩි දුරටත් අපේක්ෂා කෙරේ.

06. ජාතික සංස්කෘතික වැඩසටහන්



විවිධ ජාතීන්ගේ සංස්කෘතික සාරධර්ම තරුණ පරපුරට හඳුන්වාදීම සහ ජාතීන් අතර අන්‍යෝන්‍ය සුහදතාවය වාර්ධනය කිරීම . ශ්‍රී ලංකාව විවිධ ජාතීන් ජීවත් වන බහු ආගමික හා බහු වාර්ගික රටකි.

මෙම විවිධ ජාතීන්ගේ සංස්කෘතික සාර්ධර්මද විවිධ වේ. ජාතීන්ගෙන් මෙන්ම ආගමික හා සංස්කෘතික සාරධර්ම වලින් ද විවිධ වූ මෙරට ඇත අතීතයේ සිටම සහයෝගයෙන් සංහිදියාවෙන් එක්ව ගත කිරීමට මෙම සියලු ජාතීන් උනන්දුවක් දක්වති. මෙම තත්වය පරම්පරාවෙන් පරම්පරාවට රැගෙන යාම ඉතා වැදගත් වේ. මේ සඳහා තරුණ තරුණියන්ගේ සහභාගිත්වයෙන් විවිධත්වයෙන් යුතු සංස්කෘතික වැඩසටහන් සංවිධානය කිරීම සිදු කෙරේ

## 4.5 කාර්මික හා වෘත්තීය පුහුණු ක්‍රියාකාරකම්

ජාතික තරුණ සේවා සභාව මගින් පවත්වාගෙන යනු ලබන සියළුම වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන තත්ව කළමණාකරණ සහතිකය ලත් පුහුණු මධ්‍යස්ථාන බවට පරිවර්තනය කරමින්, දේශිය හා විදේශීය නිපුනතා සම්මතයන්ට අනුව වෘත්තීය පුහුණුව ලබා දෙමින්, ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය ලත් පුහුණු ශ්‍රමිකයන් බිහි කිරීම.

<u>පාඨමාලා ප්‍රමාණය</u>

| | |
|---|---|
| NVQ | = 187 |
| Non NVQ Full Time | = 39 |
| Part Time | = 228 |
| මුළු පාඨමාලා ගණන | = 454 |



<u>**උපදේශක ප්‍රමාණය**</u>

| | |
|---|---|
| **බාහිර** | **= 303** |
| **කොන්ත්‍රාත්** | **= 28** |
| **ස්ථිර** | **= 62** |
| **මුළු උපදේශක ප්‍රමාණය** | **= 393** |

අභ්‍යාසලාභීන් බඳවා ගැනීම - 2018 (පළාත් මට්ටමින්)

| පළාත | පුහුණු පාඨමාලා ප්‍රමාණය | බඳවා ගැනීම් | සම්පූර්ණ කළ ප්‍රමාණය |
|---|---|---|---|
| බස්නාහිර | 217 | 9842 | 7439 |
| දකුණු | 41 | 1459 | 1099 |
| සබරගමුව | 17 | 569 | 440 |
| ඌව | 11 | 245 | 203 |

| | | | |
|---|---|---|---|
| වයඹ | 36 | 1994 | 1555 |
| මධ්‍යම | 51 | 3312 | 2598 |
| උතුරු මැද | 26 | 1135 | 860 |
| නැගෙනහිර | 42 | 1963 | 1125 |
| වන්නි | 11 | 457 | 242 |
| උතුරු | 2 | 49 | 40 |
| ***එකතුව*** | ***454*** | 21025 | 15601 |

සියළුම පාඨමාලා NVQ මට්ටම් I,II,III,IV ලෙස වෙන් වෙන් වශයෙන් පවතී.

තරුණ සේවා සභාවේ පැවැත්වෙන පාඨමාලා අවස්ථා





## 4.6 ජාත්‍යන්තර තරුණ සබඳතා ක්‍රියාකාරකම්

විනයානුකූල ශ්‍රී ලාංකීය චරිතාකමකින් යුතු දේශීය , ශ්‍රේෂ්ඨතම , ගෝලීය දැනුමෙන් පරිපූර්ණ,තරුණයෙකු බිහිකිරීම උදෙසා ජාතික තරුණ සේවා සභාවේ ජාත්‍යන්තර තරුණ සම්බන්ධතා අංශය මගින් තරුණ තරුණියන් හා නිළධාරීන් සඳහා විශිෂ්ඨ හා විශ්වාසනීය සේවාවක් සැපයීම.



- ❖ **2018 වර්ෂයේ ක්‍රියාත්මක වැඩසටහන්**
  - ජාත්‍යන්තර තරුණ හුවමාරු වැඩසටහන්
  - පාකිස්ථාන ශ්‍රී ලංකා තරුණ හුවමාරු වැඩසටහන
  - ඉන්දියා ශ්‍රී ලංකා තරුණ හුවමාරු වැඩසටහන
  - බන්ග්ලාදේශ ශ්‍රී ලංකා තරුණ හුවමාරු වැඩසටහන්
  - ජර්මන් ශ්‍රී ලංකා තරුණ හුවමාරු වැඩසටහන
  - ජාත්‍යන්තර ශ්‍රී තරුණයා දායකකර වීම
  - ස්වේච්ඡා සේවක වැඩසටහන්
  - ජගත් තරුණ නෞකා වැඩසටහන්
  - එක්සත් ජාතීන්ගේ සංවාධානයේ ශ්‍රී ලාංකීය තරුණ නායකයින් දෙදෙනා තෝරා ගැනීමේ වැඩසටහන
  - නිළධාරීන් විදේශ ගත කිරීමේ වැඩසටහන්(සමුළු/ සම්මන්ත්‍රණ/පුහුණු/ වැඩමුළු සඳහා)
  - විදේශ වැඩසටහන් සඳහා සහභාගී කරවීමට යෝජිත තරුණ තරුණියන් (විදේශ සංචිතයේ තරුණ තරුණියන්) පුහුණු කරවීමේ වැඩසටහන







ජාත්‍යන්තර තරුණ සබඳතා ක්‍රියාකාරකම්

| වැඩසටහන | වැඩසටහන් ප්‍රමාණය | සහභාගීත්වය |
|---|---|---|
| ජාත්‍යන්තර තරුණ සබඳතා වැඩසටහන් | 10 | 169 |
| කලාපීය ජාත්‍යන්තර තරුණ සම්මන්ත්‍රණ | 14 | 81 |
| ලෝක තරුණ නෞවිකා වැඩසටහන | 02 | 267 |
| **යෞවන නියෝජිත වැඩසටහන්** | 01 | 02 |
| නිලධාරීන් සඳහා විදෙස් පුහුණුව ලබා දීමේ වැඩමුළුව | 11 | 16 |

| | | |
|---|---|---|
| **ස්වේච්ඡා** වැඩසටහන් | 21 | 114 |
| විදේශ සංසදයේ තෝරාගත් තරුණ තරුණියන් සඳහා පැවැත්වෙන පුහුණු වැඩමුළුව | 02 | 208 |

## 4.7 නිස්කෝ විඩීයෝ ක්‍රියාකාරම්

තරඟකාරි වාණිජ ලෝකයේ නොයෙකුත් අපහසුකම් නිසා සිය දක්ෂතාවන්ගෙන් ප්‍රයෝජන ගැනීමට ශ්‍රී ලාංකේය තාරුණ්‍යයට නොහැකි පරිසරයක් ගොඩනැඟී තිබුණි. ඊට රාජ්‍ය ආයතනයක මැදිහත් වීම අවශ්‍යව තිබුණි. ඒ පසුබිම මත ජාතික තරුණ සේවා සභාව විසින් නිස්කෝ විඩියෝ අංශය ආරම්භ කරන ලදී.

- ජාතික තරුණ සේවා සභාවේ අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කරගැනීම උදෙසා ජාතික තරුණ සේවා සභාවේ දැක්ම හා අරමුණු වලට අනුගතව නිස්කෝ වීඩියෝ අංශයේ දැක්මට අනුකූලව ශ්‍රී ලාංකීය තාරුණ්‍යයේ දියුණුව උදෙසා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- එම වැඩසටහන් මඟින් අදාළ දර්ශන භාවිතයට ගනිමින් රූපවාහිනී හා ජනමාධ්‍ය ක්ෂේත්‍රය පිළිබඳව තාරුණ්‍යය දැනුවත් කිරීම.
- තරුණ සංවර්ධනය සඳහා ඉටු කෙරෙන කාර්යයන් වීඩියෝ ගත කිරීම හා සංරක්ෂණය කිරීම.
- හැකියාවන් සහිත තරුණ තරුණියන් ජාතික තලයට හඳුන්වා දීම උදෙසා වූ වැඩසටහන් රූපවාහිනී මාධ්‍යයෙන් ජාතික තලයට රැගෙන ඒම.
- ශ්‍රී ලාංකීය තාරුණ්‍යයේ ආර්ථික සමාජීය, දේශපාලන, මානසික සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක කරනු ලබන විවිධ වැඩසටහන් වීඩියෝ ගත කර අවශ්‍ය අවස්ථාවන් වලදී යළි ප්‍රයෝජනයට ගැනීම සඳහා සංරක්ෂණය කිරීම, අවශ්‍ය අවස්ථාවන් වලදී අවශ්‍යවන්නන් සඳහා ලබාදීම.



2018 වර්ෂය තුල නිස්කෝ වීඩියෝ අංශයේ සංවර්ධන ක්‍රියාකාරකම්

| අනු අංකය | වැඩසටහන | ක්‍රියාත්මක කල වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ප්‍රවෘත්ති ආවරණ(වැඩසටහන් නිෂ්පාදනය හා සංස්කරණය) | 140 |
| 02 | 7වන යෞවන චිත්‍රපට උළෙල | 05 |
| 03 | චිත්‍රාගාර පවිත්‍රතා හා නඩත්තු කටයුතු සිදුකිරීම. | 02 |

ඒමෙන්ම තාරුණ්‍ය නිර්මාණශීලී හැකියාවන් වර්ධනය කිරීම, කුසලතා වර්ධනය කිරීම මෙන්ම මෙම නවීන තාක්ෂණයෙන් යුතු ආර්ථික ශක්තිය වර්ධනය කර ගත හැකි රැකියා අවස්ථා ඇති රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදන තාක්ෂණ NVQ 5 මට්ටමේ එක් අවුරුදු පාඨමාලාවක් අභ්‍යන්තර ආදායම් ප්‍රබවය යටතේ 2017/07/21 වන දින අභ්‍යාසලාභීන් 33 ගේ සහභාගීත්වයෙන් ආරම්භ කරන ලදී. පාඨමාලාවේ මෙම කණ්ඩායමේ නිමාව 2018 ජූලි මස 22 දින වේ.

## 4.8 ආර්ථික ප්‍රවර්ධන හා ගොවිපළ සංවර්ධන ක්‍රියාකාරකම්

### i . කෘෂි සංවර්ධන ක්‍රියාකාරකම්

- නව තාක්ෂණය හා දැනුම උපයෝගී කර ගනිමින් , පාරිසරික සමතුලිතතාවය රකිමින් , සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගෙන , මූල්‍ය කළමනාකරණය තුළින් අනාගත ගොවිබිම ජය ගැනීම සඳහා , ශ්‍රී ලාංකීය තරුණයාට කෘෂිකාර්මික පාඨමාලා මගින් දැනුම ලබා දීම.
- සහාව සතු ඉඩම් සංවර්ධනය කරමින් , අභ්‍යන්තර ආදායම් උත්පාදනය කිරීම.





### ii .ගොවිපල සංවර්ධනය

- ගොවිපල මධ්‍යස්ථාන 11 ක් සංවර්ධනය කිරීම හා නඩත්තු කිරීම.
- ගොවිපල නිෂ්පාදන අලෙවි සැලක් 2018 යොවුන් පුර භූමිය තුල පැවතීම.
- ගොවිපල නිෂ්පාදන අගය වැඩි කිරීම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ගොවිපල නිෂ්පාදන ප්‍රධාන කාර්යාලයට රැගෙන ඇවිත් කාර්ය මණ්ඩලය සඳහා අලෙවි කිරීම.
- ස්වයං රැකියා සඳහා පුහුණු කිරීම.

**iii . කෘෂි පාඨමාලා (NVQ )**



- කෘෂි පාඨමාලා 10 ක් මධ්‍යස්ථාන 10 ක් ආශ්‍රිතව ජනවාරි ජුනි හා ජූලි දෙසැම්බර් ලෙස කණ්ඩායම් දෙකක් ලෙස ක්‍රියාත්මක කිරීම.
- කෘෂි පාඨමාලා :- පැළ තවාන් සංවර්ධන සහායක සහ ක්ෂේත්‍ර සහායක (කෘෂිකර්ම) NVQ4

**iv . විවිධ වැඩ සටහන්**

- නිකවැරටිය පැවති යොවුන්පුර වැඩසටහන සඳහා ශ්‍රමදාන , ගවේෂණ , වෙළඳකුටි (හෙළ නිපැයුම්) හා පැළ සිටුවීම වැඩසටහන් සංවිධානය කිරීම.
- ජාතික ආහාර නිෂ්පාදන වගා සංග්‍රාමය - " එක්ව නැගිටිමු , අමුකොටු පුරවමු " වැඩසටහනට දායකත්වය ලබාදිම.
- ඩෙංගු මර්ධන වැඩසටහනට සහාය දැක්වීම.
- ඵලදායිතා වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

කෘෂි සංවර්ධන අංශය විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සාරාංශය

| අනු අංකය | වැඩසටහනේ නම | පවත්වන ලද ස්ථාන | වැඩසටහන් ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | ගොවිපල සංවර්ධනය | බටංගල,එරමිණියාය,පන්නල,ඇතුන්ගම, පුනගරී,ලෙව්වේගොඩ,දඹුල්ල,නුවරඑළිය, හෙයියන්තුඩුව , උලපනේ, දොළුව | 11 |
| 02 | කෘෂිකර්ම පාඨමාලා | බටංගල, එරමිණියාය,පන්නල,දඹුල්ල, ලෙව්වේගොඩ,මොනරාගල,අක්මීමන, ඇතුන්ගම,පුනගරී, දොළුව | 10 |

## 4.9 සැළසුම් හා සංවර්ධන ක්‍රියාකාරකම්

ආයතනික කටයුතු විධිමත්ව සැළැසුම් කිරීම,ක්‍රියාත්මක කිරීම සඳහා මග පෙන්වීම තුළින් ආයතනික කාර්ය සාධනය ඉහළ නැංවීම.

<u>කාර්ය භාරය</u>

සැළසුම් සකස් කිරීම

- සංයුක්ත සැළැස්ම සකස් කිරීම.
- වාර්ෂික සංවර්ධන සැළැස්ම සකස් කිරීම.
- වාර්ෂික ක්‍රියාත්මක සැළැස්ම සකස් කිරීම.
- දිස්ත්‍රික් සැළැස්ම සකස් කිරීම.



තරුණ සංවර්ධනයට අදාල ව්‍යාපෘති වාර්තා සකස් කිරීම හා අනුමත කිරීමට අදාල කටයුතු.තරුණ සංවර්ධනට අදාල සමීක්ෂණ කිරීම හා සමීක්ෂණ වාර්තා සකස් කර ඉදිරිපත් කිරීම.මහරගම මධ්‍යස්ථානයේ පුස්තකාලය සංවර්ධනය කිරීම හා දිස්ත්‍රික් හා පුහුණු මධ්‍යස්ථාන සඳහා පුස්තකාල පොත් ලබා දීම.

ප්‍රගතිය සම්බන්ධ කටයුතු

- සති ප්‍රගතිය සකස් කිරීම.
- මාසික ප්‍රගතිය සකස් කිරීම.
- කාර්තු ප්‍රගතිය සකස් කිරීම.
- අංශ ප්‍රධානී ප්‍රගති රැස්වීම් පැවැත්වීම.
- පළාත් නිළධාරී සාකච්ඡාව පැවැත්වීම.
- කලාපීය නිළධාරී සාකච්ඡාව පැවැත්වීම.
- වාර්ෂික වාර්තා සකස් කිරීම


## 4.10 කාර්යසාධන ඇගයීම් හා නිලධාරී පුහුණු ක්‍රියාකාරකම්

දේශීය හා ජත්‍යන්තර අවස්ථා උපයෝගී කොට ගෙන ජීවිත අභියෝග සඳහා මුහුණු දීමට ශ්‍රී ලාංකීක තරුණයා සවිබල ගැන්වීම උදෙසා තරුණ සංවර්ධනයේ ප්‍රමුඛයා වශයෙන් කටයුතු කරමින් සිය සේවාව විශිෂ්ඨ සහ විශ්වාසනීය අයුරින් සැපයීම සඳහා කාර්ය මණ්ඩල නිලධාරී පුහුණු කිරීමේදී අපේක්ෂිත මට්ටම හා පවතින මට්ටම අතර පරතරය පිරවීම සඳහා නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය (මානව සම්පත් සංවර්ධනය) කිරීම කාර්යසාධන ඇගයීම් හා නිලධාරි පුහුණු අංශයේ ප්‍රධානතම කාර්යයකි.

කාර්යසාධන ඇගයීම් හා නිලධාරී පුහුණු අංශය භාණ්ඩාගාර ප්‍රතිපාදන ප්‍රධාන කොටස් 02ක් යටතේ ක්‍රියාත්මක වේ

එනම්

- කාර්ය මණ්ඩල පුහුණු ක්ෂේත්‍රය
- කාර්යසාධන ඇගයීම් වැඩසටහන වශයෙනි



කාර්ය මණ්ඩල පුහුණු ක්ෂේත්‍රයේදී මූලික වශයෙන් සේවයේ නියුතු නිලධාරීන් හට ඔවුන්ගේ රැකියා ක්ෂේත්‍රයට අදාළ පුහුණුවීම් ලබා දීම සිදු කෙරේ. මෙමගින් සේවකයන්ගේ කාර්යක්ෂමතාව හා ඵලදායීතාව ඉහළ නැංවීම හරහා ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම මූලික අභිප්‍රාය වේ.

තවද නිලධාරීන් හට ස්වකීය දැනුම, කුසලතා ඉහල නංවාගැනීම උදෙසා බාහිර ආයතන මඟින් ක්‍රියාත්මක කරන අධ්‍යයන වැඩමුළු වලට සහභාගී වීමට පාඨමාලා ගාස්තු ගෙවීම කාර්යසාධන ඇගයීම් හා නිලධාරී පුහුණු අංශය මඟින් සිදුකෙරේ. එක් නිලධාරී වරයෙකු සඳහා උපරිම ලක්ෂ 02ක මුදලකට යටත්ව ස්වකීය රැකියාවට අදාළ වන පාඨමාලා සඳහා ගෙවීම් කටයුතු සිදු කරයි.

ජාතික තරුණ සේවා සභාව තුළ ඵලදායීතා වැඩපිළිවෙල ස්ථාපිත කිරීමේ අරමුණින් කාර්යසාධන ඇගයීම් හා නිලධාරී පුහුණු අංශය හරහා ඵලදායිතා සංකල්ප පලාත් මට්ටමින් ක්‍රියාත්මක කිරීමේ වැඩසටහනක් දියත් කෙරේ. මෙමඟින් ඵලදායිතා සංකල්පය පිලිබඳව ජාතික තරුණ සේවා සභාවේ සේවයේ නියුතු නිලධාරීන් දැනුවත් කිරීම, පුහුණු කිරීම, සේවා ස්ථාන වල ඵලදායිතා සංකල්පය ක්‍රියාත්මක කිරීම වැනි කටයුතු සිදු කරනු ලැබේ.



කාර්යසාධන ඇගයීම් වැඩසටහන මඟින් ජාතික තරුණ සේවා සභාවේ සේවයේ නියුතු නිලධාරීන්ගේ කාර්යසධනය මැන බැලීම හා ඔවුන්ගේ කාර්යසාධනය ඉහළ නැංවීමට අවශ්‍ය කටයුතු සිදු කෙරේ. ඉහළ කාර්යසාධනයක් සහිත නිලධාරීන් හට තිළිණ, සහතිකපත් ලබා දීම මෙන්ම කාර්යසාධනය අවම මට්ටමක පවතින නිලධාරීන් හට ප්‍රශස්ථ මට්ටමකට ඔවුන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප ලබා කර ගැනීමට අවශ්‍ය කටයුතු කාර්යසාධන ඇගයීම් වැඩසටහන හරහා සිදු කෙරේ.එමෙන්ම එක් එක් තනතුරු සඳහා රැකියා පිරිවිතර සකස් කිරීම තුළින් ඔවුන් වෙත නිශ්චිත වශයෙන් පැවරී ඇති රාජකාරි හඳුන්වාදීම මෙමඟින් සිදු වේ.

2018 වර්ෂයේ පුහුණු වැඩසටහන් 32 ක් පවත්වන ලද අතර ඒ සඳහා නිළධාරීන් 2462ක් සහභාගී වී ඇත.

## 4.11 මාධ්‍ය අංශය

ජාතික තරුණ සේවා සභාව මගින් ක්‍රියාත්මක කරනු ලබන සියළුම තරුණ සංවර්ධන වැඩ සටහන් පිළිබඳ පුවත්පත්/ ගුවන් විදුලි/ රූපවාහිනි යන මාධ්‍ය මගින් පුළුල් ප්‍රචාරයක් ලබා දිම. ප්‍රදර්ශන කුටි නිර්මාණය කිරිම.ජාතික තරුණ සේවා සභාව මගින් ක්‍රියාත්මක කරනු ලබන සියළුම තරුණ සංවර්ධන වැඩ සටහන් තරුණ තරුණියන් දැනුම්වත් වන අයුරින් අත් පත්‍රිකා/පෝස්ටර්/ කටවුට් ඇතුලු සියලු මාධ්‍ය කලා නිර්මාණ සිදු කිරිම.

- ජාතික තරුණ සේවා සභාව මගින් තරුණ තරුණියන් වෙනුවෙන් 2018 ජනවාරි 01සිට 2018 දෙසැම්බර් 31දක්වා වර්ෂය තුළදි ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත සංවර්ධනාත්මක වැඩ සටහන පිළිබඳ සමස්ත ශ්‍රී ලංකීය ජනතා දැනුම්වත් කිරිම.
- ජාතික තරුණ සේවා සභාව මගින් ඉදිරියේදි ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත සංවර්ධනාත්මක වැඩ සටහන් පිළිබඳ සමස්ථ තරුණ ප්‍රජාව දැනුවත් කිරිම.
- ජාතික තරුණ සේවා සභාව වටා ඒකරාශි වි නොමැති තරුණ ප්‍රජාව ඉදිරි වැඩ සටහන් සඳහා දායක කර ගැනිමට පෙළඹවීමක් ඇති කිරිම.

1. **දිස්ත්‍රික් මාධ්‍ය සාකච්ඡා -**

දිස්ත්‍රික්කයේ තරුණ සංවර්ධන ඉලක්ක කරා ගමන් කරන විට ශ්‍රී ලාංකේය තාරුණ්‍ය දැනුවත් කිරීම අපගේ වගකීමකි.ඒ සඳහා දිස්ත්‍රික්කවල සියලුම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය වේදීන් සමග සමීප සබඳතා පවත්වමින් දිස්ත්‍රික් මාධ්‍ය සාකච්ඡා ක්‍රමවත්ව පැවැත්වීමට සැලසුම් තිබුනි.මෙම වැඩ සටහන දිස්ත්‍රික්ක 26 පුරා පවත්වනු ලැබුනි.

- **මාධ්‍ය පාසල් (වැඩමුළු)**



දිවයින පුරා පාසල් මාධ්‍ය ඒකක තුළ සිටින, මාධ්‍ය කේෂත්‍රයට ඇල්මක් දක්වන වයස අවුරුදු 15 ත් 20
ත් අතර තරුණ තරුණියන් ඉලක්ක කරගනිමින් පාසල් මාධ්‍ය වැඩමුළුව ක්‍රියාත්මක කිරීමට කටයුතු
යොදා ඇත. එතුළින් මාධ්‍ය පිළිබඳ ඔවුන්ගේ කුසලතා ඔප්නංවාලමින් ඔවුන් ජාතික තලයට හඳුන්වාදීමත්,
ප්‍රවීණ මාධ්‍යවේදීන් ලවා ක්‍රමවත් පුහුණුවක් ලබාදීමටත් අදහස් කෙරේ.

- තරුණ තරුණියන්ට මාධ්‍යය කේෂ්ත්‍රය පිළිබඳ විධිමත් දැනුමක් ලබාදීම
- පාසල් මාධ්‍ය ඒකක සංවර්ධනය කිරීම
- ජාතික තරුණ සේවා සභාවේ වැඩසටහන් ජාතික මට්ටමේ සිට ග්‍රාමීය මට්ටම දක්වා ප්‍රචාරය කිරීමට කටයුතු කිරීම හා ඒ පිළිබඳ අවබෝධයක් ලබාදීම

**ක්‍රියාකාරකම්-**

- ❖ පාසල් මාධ්‍ය වැඩමුළුව සඳහා පාසල් මට්ටමින් තරුණ තරුණියන් 200 දෙනෙකු තෝරා ගැනී
- ❖ එක් දින වැඩමුළුවක් ලෙස ක්‍රියාත්මක කෙරෙන අතර න්‍යායික හා ප්‍රායෝගික පුහුණුවක් ලබාදීම සිදුකෙරේ





**ප්‍රතිලාභීන්ට ලැබෙන ප්‍රයෝජන**

මෙම පුහුණුව මගින් පාසල් තුළ නිවේදන, කථික හැකියාවන් සහිත සිසුන්ට ඔවුන්ගේ හැකියාවන් වර්ධනය කර ගැනීම සඳහා අවස්ථාව ලබාදීම මෙන්ම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය භාවිතය පිළිබඳ පුළුල් දැනුමක් ලබා දීම.

මෙම පුහුණුව තුළින් ලබාගත් දැනුමින් පාසල් දරුවන්ට පාසල් මාධ්‍ය ඒකක තුළින් පෙරට වඩා විධිමත්ව තම නිර්මාණශීලී හැකියාව ප්‍රදර්ශනය කිරීමට හැකියාව ලැබීම

ප්‍රවීන ජනමාධ්‍යවේදීන්ගේ දැනුම හා අත්දැකීම් ලබාගැනීමට ඉඩප්‍රස්ථා හිමිවීම

- ➢ **මාධ්‍ය වැඩමුළු (පළාත්/ජාතික)**

මාධ්‍ය ක්ෂේත්‍රයට උනන්දුවක් ඇල්මක් දක්වන දිවයින පුරා යෞවන සමාජ වල සිටින වයස අවුරුදු 15-29 ත් අතර තරුණ තරුණියන් ඉලක්ක කරගනිමින් පළාත් 10 තුළ සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් වැඩමුළු 12 ක් හා එමගින් තෝරා ගන්නා දක්ෂතා සපිරි සිංහල තරුණ තරුණියන් 100 ක් හා දමිළ තරුණ තරුණියන් 50 දෙනෙකු සම්බන්ධ කර ගනිමින් ජාතික මාධ්‍ය වැඩමුලු වැඩසටහන් 02 ක් ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත.මෙම ව්‍යාපෘතිය මගින් තරුණ තරුණියන්ගේ මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යයන් හා නව මාධ්‍යන් පිළිබඳ දැනුම,කුසලතා හා ආකල්පයන් ප්‍රවීන සම්පත්ධාරීන් හරහා ප්‍රයෝගික හා න්‍යායාත්මක වශයෙන් සංවර්ධනය කිරීමත් ඉන් පසු ඔවුන් මේ රටේ මාධ්‍ය ආයතන වෙත හඳුන්වාදීමටත් අදහස් කෙරේ.

- දිවයින පුරා යෞවන සමාජවල සිටින මාධ්‍ය ක්ෂේත්‍රයට උනන්දුවක් දක්වන තරුණ තරුණියන් හඳුනාගනිමින් ඔවුනට මාධ්‍ය විෂය පිළිබඳ ප්‍රයෝගික හා න්‍යායාත්මක දැනුමක් ලබාද
- . ශ්‍රී ලාංකේය මාධ්‍ය ක්ෂේත්‍රයට කුසලතා පූර්ණ මාධ්‍යවේදීන් පිරිසක් බිහිකිරීම.
- ජාතික තරුණ සේවා සභාව වටා ඒකරාශි වි නොමැති තරුණ ප්‍රජාව ආයතනයේ ඉදිරි තරුණ සංවර්ධන වැඩසටහන් සඳහා දායක කර ගැනිමට අවශ්‍ය පරිසරයක් මෙම පුහුණුලාභීන් හරහා නිර්මාණය කිරීම.
- පළාත් මාධ්‍ය වැඩමුලු වලට සහභාගිවන තරුණ තරුණියන් විසින් අදාල දිස්ත්‍රික්කය තුල යෞවන සමාජ සමාජිකයින් හට මාධ්‍ය පිළිබඳ පුහුණුවක් ලබා දිම.

## 4.12 තොරතුරු තාක්ෂණ ක්‍රියාකාරකම්.

ජාතික තරුණ සේවා සභාවේ තොරතුරු තාක්ෂණික සංවර්ධන අංශය මගින් ජාතික තරුණ සේවා සභාවේ සියලුම තොරතුරු තාක්ෂණික අවශ්‍යතා සපුරාලීම වෙනුවෙන් පිහිටුවා ඇත. එම අවශ්‍යතා අතර,



01. ජාතික තරුණ සේවා සභාවේ ක්‍රියාකාරකම් නවීන තාක්ෂණය භාවිතා කර ඉටු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික පහසුකම් සංවර්ධනය කිරීම.

02. කාර්යක්ෂම සන්නිවේදන ක්‍රමවේදයක් සැකසීම මගින් ශ්‍රී ලාංකීය තාරුණ්‍ය වෙත තොරතුරු සන්නිවේදනය කාර්යක්ෂම කිරීම.

03. ජාතික තරුණ සේවා සභාවේ නිල වෙබ් අඩවිය සංවර්ධනය හා යාවත්කාලින කිරීම තුලින් තොරතුරු ඉක්මනින් ලබා දීම.

04. ජාතික තරුණ සේවා සභාවේ පවතින පරිගණක ජාල පද්ධතිය නඩත්තු කිරීම හා පවත්වාගෙන යාම හා යාවත්කාලින කිරීම.


05. ජාතික තරුණ සේවා සභාවේ යෞවන සමාජ /පුහුණු මධ්‍යස්ථාන තරුණ තරුණියන්ගේ තොරතුරු තාක්ෂණ භාවිතය හා ආරක්ෂාව පිලිබඳව දැනුවත් කිරීමේ වැඩමුළු සංවිධානය හා ක්‍රියාත්මක කිරීම.

සමාජ මාධ්‍යජලා භාවිතය පිළිබඳව නිසි ආකාරව අවබෝධයක් හා දැනුවත්කමක් නොමැතිව භාවිතා කිරීමෙන් මේ වනවිටත් ලෝකයේ අනෙක් රටවල් මෙන්ම අපේ රටෙත් තරුණ ජීවිත විශාල ප්‍රමාණයක් අහිමි වෙමින් පවතී.එය හේතුකොටගෙන අප විසින් සංවිධානය කරන ලද සමාජ මාධ්‍ය ජාල ආරක්ෂණ වැඩසටහන දිස්ත්‍රික් විසි හය ආවරණය වන පරිදි හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 334 ආවරණය කරමින් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

තරුණ පරපුර අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) කුසලතා පිළිබඳ දැනුම උපයෝගී කර ගනිමින් ජාතික ප්‍රමුඛතා මත පදනම්ව ඊ-ඉගෙනුම් ක්‍රමවේදය තුලින් ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් තෝරාගත් ස්ථාන/ පුහුණු මධ්‍යස්ථාන 20 ක් තුළ වැඩසටහන් 20 ක් ක්‍රියාත්මක කරන ලදී.

ජාතික තරුණ සේවා සභාවේ වෙබ් පිටුව **www.nysc.lk** භාවිතයෙන් ජාතික තරුණ සේවා සභාවේ ඉතිහාසයේ සිට මේ දක්වා තොරතුරුද ප්‍රධාන කාර්යාලයේ සියලුම අංශ / දිස්ත්‍රික් කාර්යාල / පළාත් කාර්යාල සහ පුහුණු මධ්‍යස්ථාන තොරතුරු මෙන්ම පුහුණු මධ්‍යස්ථාන වලින් සිදු කරන සියලුම පාඨමාලා සම්බන්ධ තොරතුරු ලබා ගැනීමට පහසු වන සේ ත්‍රයි භාෂා වෙබ් පිටුව ක්‍රියාත්මක තත්වයේ පවත්වාගෙන යාම.




ජාතික තරුණ සේවා සභාවේ වෙබ් පිටුවේ අන්තර්ගත සේවක තොරතුරු පද්ධතිය යටතේ හා ජාතික තරුණ සේවා සභාවට අදාල සියලුම යෞවන සමාජයන්හි ක්‍රියාකාරී සාමාජිකයන් හට සියලුම තොරතුරු ඇතුලත් කරමින් 60,000 වැඩි දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම හා නඩත්තු කිරීම .

## 4.13 විභාග හා ඇගයීම් අංශය.

**ප්‍රධාන කාර්යභාරය**

❖ දිවයින පුරා මධ්‍යස්ථාන 54 ක පාඨමාලා 64 ක් වෙනුවෙන් වර්ෂයකට දෙවරක් (මාස හයෙන් හයට) පූර්ණ කාලීන හා අර්ධ කලින,NVQ හා NON NVQ සිසුන් 20000 කට ආසන්න සංඛ්‍යාවක් සඳහා ප්‍රායෝගික හා ලිඛිත අවසන් පරීක්ෂණ විධිමත්ව හා ක්‍රමවත් ලෙස පැවැත්වීම ප්‍රධාන කාර්යය වේ.

❖ අවසන් පරීක්ෂණ නිම කළ පසු තෙමසක් ගත වීමට පෙර විභාග ප්‍රතිඵල මධ්‍යස්ථාන වෙත නිකුත් කරමින් සමත් වූ අභ්‍යාසලාභීන් සඳහා පළාත්,දිස්ත්‍රික් හා මධ්‍යස්ථාන මට්ටමින් NVQ හා Non NVQ සහතිකපත් ඉතා කඩිනමින් හා ක්‍රමවත්ව උත්සවාකාරයෙන් බෙදා දීම සිදු කෙරේ.



❖ පාඨමාලා අවසන් පරීක්ෂණ නිම වූ පසු අභ්‍යාසලාභීන් සය මාසික රැකියාගත පුහුණුවකට (OJT) යොමු කළ යුතු අතර එසේ රැකියාගත කළ අභ්‍යාසලාභීන්ගේ සමස්ථ ප්‍රගතිය මධ්‍යස්ථාන මට්ටමින් පූර්ණ අධීක්ෂණ කටයුතු අප විසින් විධිමත්ව ඉටු කරයි.

❖ ජාතික තරුණ සේවා සභාවේ පුහුණු මධ්‍යස්ථානයන්හි පවත්වනු ලබන නිපුණතා පාදක පාඨමාලා සඳහා ඇගයීම් පවත්වා ජාතික හා ජාත්‍යයන්තරව පිළිගනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් සහිත NVQ සහතිකපත් නිකුත් කිරීම.

❖ ඒ තුළින් වෘත්තීය නිපුණත්වය සපුරනු ලබන තරුණ තරුණියන් හට ඉතා කඩිනමින් රැකියාගත වීමට අවස්ථාව සැලසීම සිදු වේ.

❖ ජාතික තරුණ සේවා සභාවේ මධ්‍යස්ථාන වල ඇති සියලුම පාඨමාලා සඳහා පොදු විෂය මාලාවක් යටතේ ඉගැන්වීම සඳහා විෂයමාලා සංවර්ධනය ද අප අංශය මඟින් ඉටු කරයි.

❖ ජාතික තරුණ සේවා සභාවේ පුහුණු පාඨමාලා පැවැත්වෙන සියලු මධ්‍යස්ථාන වල දරුවන් සඳහා වෘත්තිය මාර්ගෝපදේශ ලබා දීම සඳහා උපදේශක උපදේශිකාවන් පුහුණු කිරීම.

2018 වර්ෂයේ ක්‍රියාත්මක වැඩසටහන් පිළිබඳ විස්තරය

| අනු අංක | වැඩසටහනේ නම | සහභාගීත්වය | |
|---|---|---|---|
| | | පළමු කාර්තුව | දෙවන කාර්තුව |
| 1. | ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීම | 9834 | 9718 |
| 2. | පාඨමාලා අවසන් විභාග පැවැත්වීම | 9834 | 9718 |
| 3. | සහතිකපත් ප්‍රදානය | 6970 | 6866 |
| 4. | NVQ අවසන් ඇගයීම් කටයුතු | 843 | 711 |
| 5. | NVQ ලිඛිත විභාගය | 1021 | 1098 |
| 6. | NVQ සහතිකපත් නිකුත් කිරිම | 810 | 600 |
| 7. | OJT වැඩසටහන | 1523 | 1753 |

## 4.14 විශේෂ ව්‍යාපෘති අංශය.

1979 අංක 69 දරණ ජාතික තරුණ සේවා පනතේ අංක 04 හි සඳහන් අ,ආ,ඇ,ඈ,ඉ,ඊ,උ,එ,ඒ,ඔ,ග වගන්ති වලට සෘජු ලෙසම අවස්ථානුකූලව සංවිධානය කරන ලද ව්‍යාපෘති සැළසුම් කිරීම/ සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම මෙම අංශය මඟින් මෙහෙයවනු ලබයි. විශේෂයෙන් ම ,

❖ යොවුන් පාර්ලිමේන්තුව
❖ යොවුන්පුරය
❖ තුරුණු ශ්‍රම ශක්ති ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති හා සුවිශේෂී තරුණයා තේරීම
❖ විශේෂ සංගීත හා නර්තන කණ්ඩායම් පවත්වාගෙන යාම.

මේ මඟින්,

- රටේ සංවර්ධනය හා රාජ්‍ය ප්‍රතිපත්තීන් සැකසීමේදි තරුණ දායකත්වය ලබා ගැනීම.
- ස්වේච්ඡා සේවය,සමාජ වැඩ පිළිබඳ ආකල්ප හා නිපුණතා සංවර්ධනය කිරීම.
- නායකත්වය ගොඩනැංවීමෙහිලා වූ විවිධ ක්‍රියාකාරකම් සහ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- සුවිශේෂි හැකියාවන්ගෙන් යුතු තරුණ තරුණියන් ජාතික තලයට හඳුන්වා දීම.
- සංගීත හා නර්තන ක්ෂේත්‍රයේ දක්ෂතාවන් ඇති කලාකරුවන් ප්‍රශස්ත ශිල්පීන් ලෙස රටට දායාද කිරීම.

සිදු කෙරෙන අතර, ආයතනයේ ප්‍රධානතම වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක වන අංශයක් ලෙස කැපී පෙනෙන මෙහෙයක් ඉටු කරනු ලබයි.



**2018 වර්ෂයේ ක්‍රියාත්මක වැඩසටහන්**

i. යොවුන් පාර්ලිමේන්තුව
ii. යොවුන් පාර්ලිමේන්තු වැඩසටහන
iii. Youth with Talent ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති වැඩසටහන
iv. Youth with Talent රියලිටි වැඩසටහන
v. යොවුන් පුරය
vi. විශේෂ සංගීත කණ්ඩායම
vii. විශේෂ නර්තන කණ්ඩායම

**යොවුන් පාර්ලිමේන්තුව- 2018**

රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේ දී හා සැළසුම්කරණයේදී තාරුණ්‍යයට ඉඩ ප්‍රස්ථා ලබාදීමටත්, ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රම පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීමට අවස්ථාව ලබාදීටමත් විවිධ ජාතීන්ට විවිධ මත, අදහස් දරමින් සම්මුතිවාදීව සංවාද තුලින් සංහිදියාවක් ගොඩනගමින් අනාගත තරුණ දේශපාලන නායකයින් බිහි කිරීමත්, ශ්‍රී ලංකා යොවුන් පාර්ලිමේන්තුව තුළින් අපේක්ෂා කෙරේ.

- සංයුතිය - මන්ත්‍රිවරු 225
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් - 160
- පත්කල මන්ත්‍රි - 65

## යොවුන්පුරය නිකවැරටිය

ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනයේ යෞවන සමාජ වටා ඒකරාශි වී සිටින තරුණ තරුණියන්ගේ පෞරුෂ වර්ධනය සඳහා නායකත්ව වැඩ මුළු, යොවුන් කඳවුරු, තරුණ හමු සංවිධානය කර පවත්වනු ලබයි. මෙම වැඩසටහන් ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කලද ජාතික මට්ටමින් සංවිධානය කිරීමේ අවශ්‍යතාවය මතු වනු ඇත. ඒ සඳහා, ශ්‍රී ලාංකේය තරුණ තරුණියන්ට ජාතික සංහිදියාව සහ සම්මුතිවාදය පිළිබඳව අවබෝධයක් ගැනීමටත්, තරුණ සංවර්ධන ක්ෂේත්‍රයේ කටයුතු සම්බන්ධව විදෙස් තරුණ තරුණියන් සමඟ අත්දැකීම් හුවමාරු කරගැනීමටත්, අන්‍යෝන්‍ය අවබෝධය තුලින් සාමූහිකත්වය සහ සහජීවනය පදනම් කර ගත් විවිධ ක්‍රියාකාරකම්වල නියැලීමටත්, ජාතික සංවර්ධනය සම්බන්ධයෙන් තරුණ පරපුර අතර විවිධ කතිකාවත් ඇතිකරමින් අදහස් හා යෝජනා ලබාගැනීමටත් යොවුන්පුරය ක්‍රියාත්මක කෙරේ. යෞවන සමාජ සාමාජික සාමාජිකාවන් 6710කි





### යොවුන්පුරය ආශ්‍රිත සිදුකරන ලද ක්‍රියාකාරකම්.





- යොවුන්පුර නගරසභාව
- ක්‍රීඩා තරඟ
- අධ්‍යාපන වැඩසටහන්
- සංස්කෘතික තරඟ
- නායකත්ව පුහුණු
- බැහැරගත නායකත්ව පුහුණුව
- ශ්‍රමදාන වැඩසටහන්
- ගිනිමැලය
- පැළ සිටුවීමේ වැඩසටහන්
- ව්‍යවසායකත්ව වැඩසටහන්
- ගවේෂණ වැඩසටහන්
- සංගීත හා සංස්කෘතික සංදර්ශන
- අධ්‍යාපනික හා වෙළඳ ප්‍රදර්ශ

**<u>තුරුණු ශුම ශක්ති ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති 3000 වැඩසටහන</u>**

යොවුන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් ග්‍රාමීය හා නාගරික ප්‍රජාව මුහුණ දෙනු ලබන විවිධ ගැටළු හදුනා ගෙන, ඊට විසඳුම් සෙවීමටත්, රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමේ කාර්යයෙහිදී තරුණයින්ගේ කාර්යභාරය පිළිබද තරුණයින් තුළ අවබෝධය මෙන්ම, ඊට සක්‍රිය දායකත්වය ලබාදීමට අවස්ථාව සැලසීම හා යෞවන සමාජ තරුණ තරුණියන් අතර, තරගකාරීත්වය සහ ජයග්‍රහණය පිළිබද හැගීම් දිරිගැන්වීම උදෙසා මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.

<u>ව්‍යාපෘති ක්‍රියාත්මක ක්ෂේත්‍රයන්</u>

1. ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති
2. පාරිසරික සංවර්ධන හා සංරක්ෂණ ව්‍යාපෘති
3. තාක්ෂණික හා නව උත්පාදන ව්‍යාපෘති
4. ආර්ථික හා රැකියා උත්පාදන ව්‍යාපෘති
5. කෘෂි හා වාරි කර්මාන්ත ව්‍යාපෘති
6. ප්‍රදේශයට සුවිශේෂි වූ විශේෂ ව්‍යාපෘති

<u>අරමුණු</u>

1. තරුණ තරුණියන්ට ප්‍රායෝගිකව තම නායකත්වය හා හැකියාව ස්වේච්ඡා සේවය තුළින් ග්‍රාමීය හා නාගරික සංවර්ධනය උදෙසා කැප කිරීමට අවස්ථාව උදාකරලීම.
2. ග්‍රාමීය හා නාගරික තරුණ ප්‍රජාවට සමාජයීය පිළිගැනීමක් හා වටිනාකමක් ඇතිකිරීම.
3. යෞවන සමාජ ශක්තිමත් කිරීම හා තරුණ නායකයින් දිරිමත් කිරීම.
4. දිවයින පුරා යෞවන සමාජ ආශ්‍රිතව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින්, ග්‍රාමීය ප්‍රජා අවශ්‍යතා සපුරාලීම හා විසඳුම් ලැබීම.
5. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී භෞතික හා මානව සම්පත් කළමනාකරණය කරමින්,නිශ්චිත කාලසීමාවක් තුළ කාර්යක්ෂමව තම කාර්යභාරය අවසන් කිරීමට හාපසුවිපරම් කිරීමට හුරු කරවීමෙන් , නිර්මාණශීලි තරුණ පිරිසක් රටට දායාද කරවීම

**<u>2016-2018 ව්‍යාපෘති සඳහා ලබා දුන් මුලාධාර</u>**

| <u>වර්ෂය</u> | <u>ව්‍යාපෘති ගණන</u> | <u>ව්‍යාපෘතියකට ලබා දුන් මුදල</u> | <u>වටිනාකම</u> |
|---|---|---|---|
| 2016 | 1500 | රු.75,000.00 | රු.මිලියන 112.50 |
| 2017 | 3000 | රු.150,000.00 | රු.මිලියන 450.00 |
| **2018** | **1000** | **රු.300,000.00** | **රු.මිලියන 300.00** |

තුරුණු ශ්‍රම ශක්ති ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති ජයග්‍රහණ

**ප්‍රථම - කුරුණෑගල**



නිමි වටිනාකම රු.9,630,000.00

**දෙවන - නුවරඑළිය**



නිමි වටිනාකම රු.3,750,000.00

**තෙවන - මාතලේ**



නිමි වටිනාකම රු.4,582,548.50

## Youth With Talent Show - 2018

**(සුවිශේෂී තරුණයා තේරීමේ තරඟය)**




සුවිශේෂී හැකියාවන් ඇති තරුණ තරුණියන් හඳුනාගෙන දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් තරඟ පවත්වා ඔවුන්ගේ කුසලතාවයන් ඔප නංවා ජාතික තලයට ඔසවා තැබීම මෙහි අරමුණයි.

❖ ජාතික තරුණ සේවා සභාව සහ ස්වාධීන රූපවාහිනී මාධ්‍යජාලය එක්ව සංවිධානය කරනු ලබයි.

❖ මේ තුළින් එම කුසලතාවයෙන් පිරි තාරුණ්‍යයේ ආර්ථික හා සාමාජීය මට්ටම වර්ධනය කරනු ඇත.

**විශේෂ සංගීත කණ්ඩායම**

සංගීත විෂය පිළිබඳව සුවිශේෂී හැකියාවන් හා දක්ෂතාවයන් දක්වන තරුණ තරුණියන්ගේ දක්ෂතා වැඩි දියුණු කරමින් සංදර්ශණ සඳහා ඉදිරිපත් කිරීම.

අරමුණු



- සංගීතය පිළිබඳ කුසලතා පූර්ණ තරුණ තරුණියන් ජාතික තලයට හඳුන්වා දීම.
- ඔවුනට තරඟකාරී ප්‍රවේශන් තුළ තම දක්ෂතා දැක්වීමට අවස්ථාව උදාකර දීම.
- ආර්ථික සංවර්ධන තුළින් එම තරුණ තරුණියන්ගේ අනාගතය සාර්ථක කර ගැනීමට අවස්ථාව උදාකර දීම.
- සංගීතයේ වටිනාකම් ආරක්ෂා කරගැනීමට නූතන තරුණ පරපුර දිරි ගැන්වීම හා අධ්‍යාත්මික සංවර්ධනයක් ඇතිකිරීම.



- ගුණාත්මක භාවයෙන් පිරි නව සංගීත නිර්මාණ බිහි කිරීම තුළින් ජාත්‍යන්තරය ජය ගැනීමට අවස්ථාව සඳහා උදාකර දීම.
- රාජ්‍ය හා රාජ්‍ය නොවන උත්සව අවස්ථාව සඳහා සංගීත කණ්ඩායම් සැපයීම තුළින් ජාතික තරුණ සේවා සභාව වෙත ආදායම් උපයාදීමේ මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම.

**විශේෂ නර්තන කණ්ඩායම**

නර්තන විෂය පිළිබඳව සුවිශේෂී හැකියාවන් හා දක්ෂතාවයන් දක්වන තරුණ තරුණියන්ගේ දක්ෂතා වැඩි දියුණු කරමින් සංදර්ශණ සඳහා ඉදිරිපත් කිරීම.

**අරමුණු**

- නර්තන පිළිබඳ කුසලතා පූර්ණ තරුණ තරුණියන් ජාතික තලයට හඳුන්වා දීම.
- ඔවුනට තරඟකාරී ප්‍රවේශන් තුළ තම දක්ෂතා දැක්වීමට අවස්ථාව උදාකර දීම.
- ආර්ථික සංවර්ධන තුළින් එම තරුණ තරුණියන්ගේ අනාගතය සාර්ථක කර ගැනීමට අවස්ථාව උදාකර දීම.



- නර්තනයේ වටිනාකම් ආරක්ෂා කරගැනීමට නූතන තරුණ පරපුර දිරි ගැන්වීම හා අධ්‍යාත්මික සංවර්ධනයක් ඇතිකිරීම.
- ගුණාත්මක භාවයෙන් පිරි නව නර්තන නිර්මාණ බිහි කිරීම තුළින් ජාත්‍යන්තරය ජය ගැනීමට අවස්ථාව සඳහා උදාකර දීම.
- රාජ්‍ය හා රාජ්‍ය නොවන උත්සව අවස්ථාව සඳහා නර්තන කණ්ඩායම් සැපයීම තුළින් ජාතික තරුණ සේවා සභාව වෙත ආදායම් උපයාදීමේ මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම.



## 4.15 යෞවන තිළිණ අධිකාරිය.

1956 වර්ෂයේ එංගලන්තයේ එඩින්බරෝ ආදිපාද ජාත්‍යන්තර තිළිණ පදනම මගින් ආරම්භ කරන ලද එඩින්බරෝ ආදිපාද ජාත්‍යන්තර තිළිණ වැඩසටහන 1980 වර්ෂයේ සිට ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 13-24ත් අතර තරුණ තරුණියන් සඳහා හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම ජාතික යෞවන තිළිණ ප්‍රදාන අංශයේ ප්‍රධානතම කාර්ය වේ.

අධ්‍යාපන අමාත්‍යාංශයේ හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතියෙන් ක්‍රියාත්මක කරන මෙම වැඩසටහන,රජයේ පාසල්,අධ්‍යාපන විද්‍යාපීඨ,තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථාන,ළමා නිවාස,භාදිත හා විශේෂ පාසල් හා විවෘත තිළිණ ඒකක ආශ්‍රිත තරුණ/තරුණියන් වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලැබේ.




ඒ සඳහා තරුණ තරුණියන් ක්‍රියාකාරකම් හතරක (ස්වෙච්ඡා සේවය, කුසලතාරුචිකත්වය, ශාරීරික යෝග්‍යතා හා අභියෝගාත්මක චාරිකා)නිශ්චිත කාළ පරසායක් තුල නිරතකර එම ක්‍රියාකාරකම් ඇගයීමකට ලක්කර ලෝකඩ,රජත,ස්වර්ණ ලෙස ජාත්‍යන්තර තිළිණ හා සහතිකපත් ප්‍රදානය කරනු ලැබේ.එහිදී ඔවුනගේ ස්වයං සංවර්ධනය සඳහා බලපාන නායකත්ව ගුණාංග,සාරධර්ම,පාරිසරික හැගීම්,කුසලතා,අන්‍යෝන්‍ය සබඳතා සංවර්ධනය,තුලින් ඇතිවන පෞරුෂත්ව සංවර්ධනය පුද්ගල සංවර්ධනය සඳහා ඉමහත් පිටුවහලක් වනු ඇත.එසේ පුද්ගල සංවර්ධනයක් තුලින් අත්පත් කරගන්නා තරුණ ජවය රට සංවර්ධනය කිරීමේ කාර්යට දායක කරලීම වක්‍රව ලැබෙන විශේෂ ප්‍රතිලාභයකි.



විශ්ව විද්‍යාල ප්‍රවේශයේදී සාමාන්‍ය ප්‍රවේශය යටතේ නොතේරුණු සිසුන් අ.පො.ස.(උ/පෙ) විභාගයට ඉදිරිපත්වන කාල සීමාව තුලදී යෞවන තිළිණ අංශය මගින් සිසුන් වෙත ලබා දෙනු ලබන මෙම තිළිණය සම්පූර්ණ කර ඇත්නම් විශ්වවිද්‍යාල තුලට ඇතුලත් වීමේ දී හා අධ්‍යාපන විද්‍යාපීඨ සඳහා ඇතුලත් වීමේ දී ඔවුන් සඳහා ප්‍රසාද ලකුණු පිරිනැමීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නීතිමය අවසරය ලබා දී ඇත. **2018 වර්ෂයේ වැඩසටහන් 37ක් ක්‍රියත්මක කළ අතර ඒ සඳහා 3211ක සහභාගීත්වයක් පවතී.**

## 4.16 තරුණ සමූපකාර හා ව්‍යාපාර සහ සංවර්ධන අංශය.

ලාංකික තරුණ ප්‍රජාවගේ ආර්ථික අස්ථාවරත්වය අවම කිරීමට මඟ පෙන්වමින් ව්‍යවසායක සංස්කෘතියක් රට තුළ ගොඩනංවන පුරෝගාමී ආයතනයක් වීම.

උපරිම ඵලදායීතාවයකින් හා කාර්යක්ෂමතාවයකින් යුතුව දැනුම, ආකල්ප හා කුසලතා පරිපූර්ණ සේවක මණ්ඩලයකින් විවිධ උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් තරුණ ව්‍යවසායකයින්ට සේවා සැපයීම සඳහා තරුණ සමූපකාර ජාලය ගුණාත්මක, ප්‍රමාණාත්මක හා තිරසාර ලෙස සංවර්ධනය කිරීම අපගේ මෙහෙවරයි

2018 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්



- ව්‍යවසායකත්ව එක්දින වැඩසටහන සඳහා සහභාගීත්වය - 4408 ක් වන අතර පැවැත්වූ වැඩසටහන් ප්‍රමාණය - 26 කි.
- ව්‍යවසායකත්ව එක්දින වැඩසටහන සඳහා සහභාගීත්වය - 438 ක් වන අතර වැඩසටහන් ප්‍රමාණය - 16 ක් පවත්වන ලදි
- නිස්කෝ දිස්ත්‍රික් සමිති ප්‍රගති සමාලෝචන වැඩසටහන සඳහා සහභාගීත්වය - 47 කි.
- ස්වයංරැකියා තාක්ෂණික පුහුණු වැඩසටහන සඳහා සහභාගීත්වය - 122 ක් වන අතර වැඩසටහන් ප්‍රමාණය - 05 ක් පවත්වන ලදි.
- නිස්කෝ අධ්‍යක්ෂ මණ්ඩල වැඩසටහන් - 04 යටතේ සහභාගිකයන් - 85 ක් විය. ୨1ඉහත සඳහන් වැඩසටහන් පැවැත්වීම තුලින් ස්වයංරැකියා කෙරෙහි තරුණ තරුණියන් පෙළඹවීම හා ඔවුන්ට ලබා දුන් ප්‍රතිලාභ පහත පරිදි විය.

I. නිස්කෝ සමිති මඟින් රු: 5000.00 සිට 350,000.00 දක්වා ණය ලබාදී ඇති ප්‍රතිලාභීන් - 27 රු:920,000.00 ක ණය ලබාදී ඇත.



II. ව්‍යවසායකත්ව වැඩසටහන් පැවැත්වීමෙන් පසු ස්වයංරැකියා සඳහා රු: 500,000.00 ණය නිකුත් කරන ලද ප්‍රතිලාභීන් - 08 මුදල - රු: 4,000,000.00

III. ව්‍යාපාර තාක්ෂණ පාසල වැඩසටහන් 16 ක් දිස්ත්‍රික්ක තුල පවත්වා ව්‍යවසායකයින් 438 දෙනෙක් සඳහා පුහුණුව ලබාදි ස්වයං රැකියා පිළිබඳ උනන්දුව හා මඟ පෙන්වීම කරන ලදි.

IV. ස්වයංරැකියා තාක්ෂණික පුහුණු වැඩසටහන් පවත්වා ස්වයංරැකියාලාභින් 122 ක් බිහිකිරිම.

# 5.පාලන අංශයේ ක්‍රියාකාරකම් - 2018

## 5.1ආයතනික කටයුතු.

2018.01.01 සිට 2018.12.31 දින දක්වා ජාතික තරුණ සේවා සභාවේ ආයතන අංශය විසින් ඉටු කරන ලද කාර්ය භාරයයන්

1979 අංක 69 දරණ ජාතික තරුණ සේවා පනත යටතේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය වන සේවක සංඛ්‍යාව බඳවා ගැනීම යටතේ ආයතන අංශයට පැවරී ඇති කාර්යභාරය අනුව 2018 වර්ෂය තුලදී උසස්වීම් ලබා දී ඇත.එහෙත් ස්ථාන මාරුවීම්,විනයානුකූල නියෝග අනුව සේවයෙන් පහ කිරිම්,ධුරය අතහැර යැම,වැටුප් හා වේතනයන්,සේවයෙන් විශ්‍රාම ගැන්වීම හා සේවයෙන් ඉල්ලා අස්වීම් ද පූර්ණ වර්ෂවලදී කටයුතු කර ඇති ආකාරයෙන්ම සිදුවී ඇත.අක්‍රමික සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

- **නව බඳවා ගැනීම්(ස්ථිර)**

2018 වර්ෂය සඳහා පහත සඳහන් නව බඳවා ගැනීම් 11 ක් ( නිවාස පාලිකා 6 ක් හා රියදුරු 5ත්) සිදු කර ඇත.

- **නව බඳවා ගැනීම්(අනියම්)**

නව බඳවා ගැනීම් 02 ක් (ස.ත.සේ.නි - 01 ක් හා කළ.සහකාර -01 ක් ) සිදු කර ඇත.

- **නව බඳවා ගැනීම් (කොන්ත්‍රාත්)**

නව බඳවා ගැනීම් 10 ක් (උපදේශක - 10 ක්) සිදු කර ඇත.

- **සන්නිවේදනය හා තොරතුරු තාක්ෂණය**

නව බඳවා ගැනීම් 01 ක් (උපදේශක -01 ක්) සිදු කර ඇත.

- **පරිගණක චිත්‍රක නිර්මාණය**

නව බඳවා ගැනීම් 01 ක් (උපදේශක -01 ක්) සිදු කර ඇත.

- **රූපලාවන්‍ය හා කේෂලාවන්‍ය**

නව බඳවා ගැනීම් 01 ක් (උපදේශක -01 ක්) සිදු කර ඇත.

- **මෝටර් රථ කාර්මික**

නව බඳවා ගැනීම් 02 ක් (උපදේශක -02 ක්) සිදු කර ඇත.

- **උසස්වීම් ලබා දීම**

තරුණ සේවා නිළධාරි 1 ශ්‍රේණියේ සිටින නිළධාරීන් සඳහා උසස් වීම් ලබා දී ඇත.එනම්, ජොෂ්ඨ තරුණ සේවා නිළධාරි 32 ක් සඳහා විය.

- **අනියම් සේවකයින්ට ස්ථිර පත්වීම් ලබා දීම**

අනියම් සේවකයින් සඳහා ස්ථිර පත්වීම් 20ක් (නිවාස පාලිකා -02 ද කාර්යාල කාර්යය සහයක - 17 ද අරක්කැමි - 01) ලබා දී ඇත.

- **විශ්‍රාම ගැන්වීම**

නිළධාරින් 38 දෙනෙතු විශ්‍රාම ගන්වන ලදි.

- **සේවයෙන් ඉල්ලා අස්වීම**

විවිධ හේතූන් මත 2018 වර්ෂයේ ද පහත නම් සඳහන් නිළධාරින් 50 ක් සභාවේ සේවයෙන් ඉල්ලා අස්වී ඇත.

- **ධූරය අතහැර යෑම**

විවිධ හේතූන් මත නිළධාරින් 09 ක් 2018 වර්ෂයේ ධූරය අතහැර ගියාසේ සලකා කටයුතු කර ඇත.

- **නැවත සේවයේ පිහිටුවීම**

2018 වසර සඳහා නිළධාරින් දෙදෙනෙක් නැවත සේවයේ පිහිටුවා ඇත.

- **සේවක අවසන් කිරීම**

විවිධ හේතූන් මත න්ළධාරින් 03ක් 2018 වර්ෂයේද සේවය අවසන් කර ඇත.

- **වැඩ තහනම් කිරීම**

2018 වසරේ එක් නිළධාරියෙකුගේ වැඩ තහනම් කර ඇත.

- **කාර්යක්ෂමතා කඩඉම් පර්යේෂණය**

2013 වසරේ සිට 2018 දක්වා වර්ෂවලට අදාල සියලුම තනතුරු සඳහා කාර්යෂමතා කඩඉම් පර්යේෂණ පවත්වා ඇත.

- **අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිභාර අරමුදල**

2018 වර්ෂය තුලදී විශ්‍රාම ගන්වන ලද සහ විශ්‍රාම වැටුප් සහිත ස්ථිර රැකියා සඳහා යෑමට සභාවෙන් ඉල්ලා අස්වී ඇති කාර්යය මණ්ඩලය සඳහා සේවක අර්ථ සාධක අරමුදල් සහ සේවා නියුක්ති භාර අරමුදල් දායකය ලබාදීමට කටයුතු කර ඇත.

- **මිය යෑම්**

2018 වර්ෂයේ දී සභාවේ නිළධාරින් 06 ක් විය.

- **සිය කැමැත්තෙන් විශ්‍රාම ගිය නිළධාරීන්ගේ**

2018 වර්ෂයේ දී සභාවේ නිළධාරින් 02 ක් විය.

## 5.2 සැපයුම් අංශය.

ප්‍රසම්පාදන අංශය ප්‍රධාන වශයෙන් කරනු ලබන්නේ ප්‍රධාන කාර්යාලය, පළාත් කාර්යාලය, දිස්ත්‍රික් කාර්යාල, පුහුණු මධ්‍යස්ථාන යන මේවායේ ඇති වන අවශ්‍යතා (සේවා හා භාණ්ඩ වශයෙන්) විධිමත් අනුමැතියක් සමග කරනු ලබන ඉල්ලීමෙන් පසු ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් එම කාර්යයන් ඉටු කිරීමයි.

2018 වර්ශයේදී ජාතික තරුණ සේවා සභාවේ ප්‍රධාන කාර්යාලය මඟින්, අනෙකුත් කාර්යාල මඟින් හා පුහුණු මධ්‍යස්ථාන මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සඳහා භාණ්ඩ හා සේවා සපයමින් කටයුතු කර ඇත.

## 5.3 ප්‍රවාහන ක්‍රියාකාරකම්.

ජාතික තරුණ සේවා සභාවේ මූලික අරමුණු ඉටුකර ගැනීම සඳහා විවිධ අංශ වලින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් වලදී ප්‍රධානතම සහය සේවාවක් වශයෙන් කාර්යක්ෂම ප්‍රවාහන සේවයක් ලබා දෙමින් වැඩසටහන් සාර්ථක කර ගැනීමට කටයුතු කරයි.

- ප්‍රධාන කාර්යාල සංචිතය පළාත් කාර්යාල, දිස්ත්‍රික් කාර්යාල, පුහුණු මධ්‍යස්ථාන, ගොවිපල සඳහා අනුයුක්ත කර ඇති වාහන සේවා කිරීම හා අළුත්වැඩියා කිරීම.
- රියඅනතුරු සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු කිරීම.
- රියදුරු පාලනය,ධාවන සටහන් ගෙන්වා ගැනීම, පරීක්ෂා කිරීම, දෝෂ සහගත තත්වයන් සම්බන්ධයෙන් කරුණු විමසීම, ධාවන සටහන් රජයේ විගනනයට යොමු කිරීම.
- වාර්ෂිකව වාහන සඳහා දුම්පරීක්ෂණ වාර්තා ආදායම් බලපත්‍ර රක්ෂණ සහතික ලබා ගැනීම.
- වැඩසටහන් සඳහා ගමනාගමන මණ්ඩලයෙන් බස්රථ ලබා ගැනීම සම්බන්ධීකරණය කිරීම.

- 2018.07.05 දින වෙන්දේසි කරන ලද වාහන ලේඛණය - 03
  (58 – 3574 ,18 -7600, 51 -7263)

- ❖ 2018.10.29 දින පැරණි වාහන 04 ක් අපහරණයට යෝජනා විය. අපහරණයට යෝජනා වූ වාහන ලේඛණය
    1. 29 ශ්‍රී 6264
    2. 41 ශ්‍රී 3420
    3. 27 ශ්‍රී 5984
    4. 27 ශ්‍රී 5985

## 5.4 අභ්‍යන්තර විගණක අංශය.

ජාතික තරුණ සේවා සභාවට අදාළව විගණකාධිපති විසින් අනුමත කර ඇති විගණන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා සභාපතිතුමාගේ උපදෙස් මත කෙරෙන විමර්ෂන හා වෙනත් විශේෂ රාජකාරී ඉටුකිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

## 5.5 ලේකම් අංශය.

ලේකම් අංශය මගින් ජාතික තරුණ සේවා සභාවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංවිධානය කිරීම, පවත්වාගෙන යාම, එහිදී ගන්නා ලබන තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අදාල අංශ සහ අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් වෙත බෙදාදීම සිදු කරනු ලබයි. ඊට අමතරව ජාතික තරුණ සේවා සභාවේ වෙනත් වැඩ සටහන් වලට අදාලව අවස්ථානුකූලව පවරනු ලබන රාජකාරී කටයුතු ද ඉටු කරනු ලැබේ.

## 5.6 නීති විමර්ෂණ ක්‍රියාකාරකම්.

නිති විමර්ශන අංශය ජාතික තරුණ සේවා සභාව විසින් පහත සඳහන් ආයතනවල පවරා ඇති නඩු සම්බන්ධව හා මෙම සභාවට එරෙහිව පවරා ඇති නඩු පිලිබඳව මෙම සභාව වෙනුවෙන් හා/හෝ සභාපති අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට පෙනී සිටීම හා කරුණු ඉදිරිපත් කිරීම සිදු කෙරේ.

| අධිකරණය | | නඩු ගණන |
|---|---|---|
| 1) | ශ්‍රේෂ්ඨාධිකරණය | 01 |
| 2) | මහාධිකරණය | 01 |
| 3) | දිසා අධිකරණය | 12 |
| 4) | මහේස්ත්‍රාත් අධිකරණය | 04 |
| 5) | කම්කරු විනිශ්චය සභාව | - |
| 6) | කම්කරු වන්දි උසාවිය | - |
| | | 18 |

03. තවද මේ වන විට නෛතික ආයතන මගින් පවත්වාගෙන යන පැමිණිලි පහත පරිදි වේ.

| ආයතනය | | පැමිණිලි ගණන |
|---|---|---|
| 1) | මානව හිමිකම් කොමිෂන් සභාව | 14 |
| 2) | කම්කරු කාර්යාලීය පැමිණිලි | 03 |

01. එමෙන්ම ආයතනික විනය ක්‍රියාමාර්ග වලදී විනය බලධාරියාගේ නියෝග මත විනය පරික්ෂණ පැවැත්වීම, විනය නියෝග ලබාදීම සඳහා වන නිර්දේශ හා /හෝ නිරීක්ෂණ ලබාදීම හා ඉහල නිලධාරින් විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි ඉටු කෙරේ.

## 5.7 ඉදිකිරීම් ක්‍රියාකාරකම්.



ඉදිකිරීම් / නඩත්තු අංශය මගින්, දිවයින පුරා පවතින සියළුම පළාත් කාර්යාල , දිස්ත්‍රික් කාර්යාල හා තරුණ මධ්‍යස්ථාන වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා වෘත්තීය පුහුණුවට අදාළ ගොඩනැගිලි ඉදිකිරීම් හා නවීකරණය කරන අතර තරුණ මධ්‍යස්ථාන දෛනික නඩත්තු කටයුතු සහ මධ්‍යස්ථාන නවීකරණය හා අළුත්වැඩියා කටයුතු ඉටුකරනු ලබයි.



ඒ අනුව 2018 වර්ෂය සඳහා අමාත්‍යාංශ ප්‍රතිපාදන රු.මිලියන 376.300 ලැබුණු අතර, එමගින් ඉදිකිරීම්/නවීකරණ ව්‍යාපෘති 12 ක් ක්‍රියාත්මක කරන ලද අතර, 9.7 ප්‍රාග්ධන ප්‍රතිපාදන රු.මිලියන 169.80ක් ලැබුණු අතර, එමගින් ව්‍යාපෘති 11ක් ක්‍රියාත්මක කරන ලද අතර, නිපුණතා ආංශික වැඩසටහන් වලින් රු. මිලියන 65ක් ප්‍රතිපාදන ලැබුණු අතර, එමගින් ව්‍යාපෘති 3ක් ක්‍රියාත්මක කරන ලදී. එම ව්‍යාපෘති 8ක් සම්පූර්ණයෙන් අවසන් කර අදාළ මධ්‍යස්ථානයට භාර දී ඇති අතර, අනෙකුත් ව්‍යාපෘති 2019 වර්ෂයේ අවසන් වීමට නියමිතය. වැඩිමනක් තොරතුරු පහත පරිදි වේ.

# 6. ස්වේච්ඡා වැඩසටහන්.

ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස වල සේවය කරන තරුණ සේවා නිලධාරීන් යෞවන සමාජ වල සාමාජික සමාජිකයන් සමග ප්‍රාදේශීයව හා කාලීන අවශ්‍යතාවයන් අනුව ස්වේච්ඡාවෙන් සොයා ගත් ප්‍රතිපාදන මගින් විවිධ වැඩසටහන් සංවිධානය කරන ලදී.

පහත වගුවේ දක්වා ඇති ක්ෂේත්‍රයන් ආශ්‍රිතව එම වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. මෙම වැඩසටහන් තුළින් යෞවන සමාජ වල සාමාජික සාමාජිකාවන් තුළ පමණක් නොව ප්‍රදේශවාසීන් හා යෞවන යෞවනියන් අතර අන්තර් සහජීවනය සමගිය ඇතිවන අතර, සංවර්ධන කාර්යය සඳහා ස්වේච්ඡාවෙන් තරුණ පිරිස් යොදා ගැනීම මෙම ස්වේච්ඡා වැඩසටහන් තුළින් සිදුකෙරේ.

2018 වසරේ ස්වේච්ඡා වැඩසටහන් 27455 ක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව මේ සඳහා තරුණ පිරිස 473,222 ක් සහභාගිව ඇත. එමෙන්ම ස්වේච්ඡා වැඩසටහන්හි සමස්ත මූල්‍ය වටිනාකම රුපියල් 14,518,634.00 ක් ලෙස සඳහන් කළ හැක.

ස්වේච්ඡා වැඩසටහන් ප්‍රගති වගුව - 2018

## Progress of Voluntary Programmes Implemented in 2018

| District | Community & Social Development | | | Environmental Programmes | | | Health & Sanitary Service Programme | | | Sports Development Programme | | | Educational & Development Programme | | | Youth Participatory Development Programme | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Number of Programme | Number of Participation | Expenditure | Number of Programme | Number of Participation | Expenditure | Number of Programme | Number of Participation | Expenditure | Number of Programme | Number of Participation | Expenditure | Number of Programme | Number of Participation | Expenditure | Number of Programme | Number of Participation | Expenditure |
| rban You | 20 | 638 | 25,345 | 11 | 835 | 45,000 | 5 | 600 | 66,000 | 23 | 1100 | 78,000 | 5 | 300 | 95,000 | 18 | 978 | 11,250 |
| Colombo | 10 | 255 | 26,500 | 13 | 752 | 65,400 | 10 | 300 | 10,000 | 20 | 656 | 30,000 | 7 | 650 | 65,220 | 50 | 700 | 32,500 |
| Kaluthara | 7 | 95 | 16,000 | 17 | 1200 | 42,000 | 65 | 1020 | 60,000 | 15 | 825 | 75,000 | 5 | 614 | 11,200 | 12 | 1295 | 15,670 |
| Gampaha | 5 | 15 | 29,160 | 6 | 45 | 74,000 | 14 | 1050 | 17,550 | 18 | 850 | 95,000 | 8 | 60 | 15,500 | 13 | 1058 | 21,300 |
| Galle | 95 | 17800 | 15,620 | 21 | 205 | 17,000 | 11 | 152 | 60,000 | 30 | 650 | 70,000 | 4 | 708 | 89,000 | 20 | 800 | 65,000 |
| Matahara | 100 | 3165 | 25,520 | 11 | 123 | 18,000 | 5 | 390 | 65,000 | 9 | 680 | 736,000 | 10 | 203 | 85,000 | 24 | 3453 | 42,733 |
| mbanthc | 26 | 2345 | 10,585 | 3 | 60 | 32,000 | 6 | 120 | 15,500 | 14 | 2320 | 153,500 | 2 | 68 | 1,100 | 882 | 386 | 56,500 |
| Kandy | 25 | 121 | 45,000 | 5 | 45 | 11,200 | 8 | 312 | 78,500 | 12 | 300 | 45,000 | 5 | 65 | 1,450 | 23 | 112 | 75,000 |
| Mathale | 23 | 23 | 14,500 | 8 | 25 | 3,600 | 10 | 100 | 65,120 | 10 | 102 | 11,500.0 | 6 | 89 | 4,500 | 20 | 203 | 57,000 |
| uwara Eli | 15 | 70 | 23,512 | 11 | 67 | 15,000 | 1 | 180 | 50,000 | 8 | 1394 | 325,000 | 5 | 56 | 40,000 | 14 | 301 | 14,000 |
| athnapur | 18 | 15 | 37,150 | 8 | 551 | 95,550 | 15 | 621 | 21,250 | 18 | 1697 | 502,000 | 8 | 25 | 20,000 | 5 | 328 | 6,800 |
| Kegalle | 15 | 65 | 12,400 | 5 | 195 | 54,000 | 12 | 95 | 11,500 | 6 | 120 | 7,500 | 9 | 14 | 65,000 | 12 | 8000 | 14,500 |
| Badulla | 12 | 66 | 12,500 | 10 | 600 | 65,302 | 10 | 250 | 16,500 | 45 | 30352 | 15,000 | 6 | 10 | 5,800 | 12 | 325 | 16,000 |
| Monaragal | 10 | 120 | 65,000 | 4 | 312 | 56,000 | 6 | 65 | 45,000 | 5 | 112 | 32,100 | 2 | 25 | 8,900 | 11 | 456 | 25,000 |
| olonnaruv | 15 | 420 | 11,500 | 6 | 450 | 95,000 | 3 | 45 | 36,500 | 18 | 36 | 45,000 | 6 | 78 | 4,500 | 9 | 75 | 89,000 |
| uradhapu | 80 | 171 | 12,500 | 8 | 43 | 5,000 | 9 | 60 | 6,500 | 25 | 997 | 116,000 | 6 | 55 | 6,000 | 7 | 95 | 6,500 |
| incomale | 20 | 1560 | 15,120 | 12 | 600 | 17,500 | 25 | 1045 | 12,500 | 15 | 3924 | 11,200 | 11 | 300 | 11,000 | 36 | 1241 | 17,000 |
| Ampara | 8 | 20 | 1,200 | 8 | 152 | 12,000 | 8 | 554 | 18,000 | 9 | 554 | 18,000 | 5 | 99 | 9,500 | 8 | 115 | 7,500 |
| Batticaloa | 15 | 95 | 2,700 | 8 | 50 | 8,000 | 16 | 1000 | 80,000 | 10 | 116 | 260,000 | 10 | 110 | 1,200 | 7 | 189 | 44,600 |
| urunegal | 706 | 37445 | 56,000 | 13 | 270 | 26,000 | 18 | 608 | 23,850 | 22 | 730 | 64,000 | 6 | 170 | 2,030 | 18 | 595 | 45,250 |
| Puttalam | 31 | 640 | 30,495 | 7 | 73 | 5,000 | 9 | 219 | 15,000 | 21 | 1747 | 15,600 | 10 | 301 | 6,000 | 8 | 90 | 3,000 |
| Jaffna | 6 | 95 | 45,000 | 3 | 25 | 45,000 | 2 | 23 | 56,500 | 6 | 100 | 25,000 | 4 | 58 | 5,000 | 11 | 85 | 45,000 |
| Vavuniya | 22 | 65 | 15,000 | 6 | 30 | 32,000 | 4 | 25 | 36,000 | 16 | 95 | 15,000 | 4 | 45 | 8,000 | 13 | 56 | 56,000 |
| Mannar | 8 | 60 | 7,450 | 11 | 102 | 36,000 | 15 | 112 | 8,000 | 12 | 56 | 10,000 | 13 | 150 | 8,000 | 18 | 800 | 14,000 |
| Mulathivu | 10 | 50 | 45,000 | 52 | 450 | 16,000 | 6 | 65 | 4,000 | 18 | 300 | 13,500 | 5 | 201 | 4,300 | 3 | 300 | 60,000 |
| Kilinocchi | 7 | 100 | 65,345 | 8 | 35 | 2,500 | 9 | 88 | 63,000 | 10 | 185 | 10,000 | 12 | 11 | 4,500 | 47 | 5220 | 80,325 |
| Total | 1309 | 65514 | 666102 | 275 | 7295 | 894052 | 302 | 9099 | 941770 | 415 | 49998 | 2778900 | 174 | 4465 | 577700 | 1251 | 27256 | 921428 |

| District | Providing of job information | | | Religious Programme | | | Enterprenurship & Economic Development Programme | | | Leadership & Personality Development Programme | | | Counseling Programme | | | Easthetic Programme | | | Decision Making & policy Development Programme | | | Other Programmes | | | Total Number of Programme | Total Number Youth participation | Total Expenditure |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Number of Programme | Number of Participation | Expenditure | Number of Programme | Number of Participation | Expenditure | Number of Programme | Number of Participation | Expenditure | Number of Programme | Number of Participation | Expenditure | Number of Programme | Number of Participation | Expenditure | Number of Programme | Number of Participation | Expenditure | Number of Programme | Number of Participation | Expenditure | Number of Programme | Number of Participation | Expenditure | | | |
| rban You | 23 | 755 | 11,023 | 13 | 522 | 75,000 | 10 | 31 | 12,100 | 20 | 650 | 132,000 | 4 | 320 | 3,100 | 18 | 60 | 76,000 | 7 | 25 | 5,000 | 11 | 650 | 30,000 | 188 | 7464 | 664,818 |
| Colombo | 20 | 645 | 17,485 | 20 | 850 | 80,000 | 12 | 330 | 55,000 | 80 | 1100 | 144,500 | 5 | 125 | 12,000 | 12 | 145 | 55,000 | 7 | 15 | 3,000 | 13 | 81 | 20,000 | 279 | 6604 | 616,605 |
| Kaluthara | 36 | 503 | 15,200 | 13 | 122 | 40,000 | 10 | 120 | 75,000 | 145 | 1450 | 150,000 | 10 | 45 | 165,000 | 8 | 330 | 156,000 | 6 | 52 | 4,000 | 6 | 13 | 7,500 | 355 | 7684 | 832,570 |
| Gampaha | 15 | 200 | 17,000 | 16 | 783 | 30,000 | 5 | 133 | 66,000 | 50 | 65 | 22,000 | 11 | 183 | 45,000 | 10 | 100 | 45,000 | 8 | 215 | 5,500 | 8 | 145 | 75,000 | 187 | 4902 | 558,010 |
| Galle | 15 | 300 | 16,000 | 45 | 1020 | 15,000 | 10 | 250 | 35,000 | 30 | 250 | 65,000 | 11 | 123 | 65,000 | 11 | 415 | 95,400 | 6 | 45 | 5,000 | 16 | 123 | 23,200 | 18104 | 22841 | 636,220 |
| Matahara | 20 | 150 | 17,800 | 15 | 835 | 31,500 | 11 | 115 | 45,000 | 35 | 110 | 13,200 | 5 | 96 | 15,000 | 6 | 60 | 14,000 | 5 | 95 | 1,200 | 19 | 965 | 58,000 | 3429 | 10440 | 1,167,953 |
| mbanthc | 30 | 112 | 18,000 | 23 | 1694 | 66,500 | 10 | 102 | 14,500 | 23 | 80 | 12,500 | 6 | 56 | 15,000 | 1 | 60 | 480 | 7 | 200 | 2,000 | 12 | 122 | 40,000 | 995 | 7725 | 438,165 |
| Kandy | 20 | 101 | 25,000 | 10 | 401 | 18,000 | 12 | 89 | 15,000 | 12 | 102 | 58,000 | 7 | 45 | 78,000 | 13 | 180 | 4,500 | 4 | 65 | 3,000 | 10 | 52 | 20,000 | 166 | 80178 | 472,650 |
| Mathale | 12 | 103 | 45,000 | 5 | 250 | 56,000 | 23 | 125 | 13,500 | 12 | 302 | 16,500 | 5 | 23 | 4,500 | 5 | 95 | 1250 | 7 | 60 | 5,000 | 4 | 32 | 15,000 | 150 | 2687 | 312,970 |
| uwara Eli | 5 | 35 | 4,500 | 4 | 125 | 13,000 | 11 | 45 | 40,000 | 13 | 102 | 75,000 | 6 | 120 | 56,000 | 10 | 120 | 65,000 | 10 | 120 | 6,000 | 15 | 45 | 30,000 | 128 | 2780 | 757,012 |
| athnapur | 12 | 300 | 12,500 | 38 | 373 | 134,500 | 14 | 230 | 65,000 | 11 | 666 | 175,000 | 3 | 100 | 14,000 | 8 | 250 | 55,000 | 11 | 125 | 4,000 | 5 | 60 | 3,000 | 174 | 179675 | 1,145,750 |
| Kegalle | 15 | 198 | 23,000 | 4 | 2318 | 26,000 | 13 | 165 | 40,000 | 8 | 189 | 27,500 | 7 | 321 | 14,500 | 7 | 76 | 48,500 | 13 | 201 | 6,000 | 5 | 25 | 7,500 | 131 | 11982 | 357,900 |
| Badulla | 6 | 400 | 15,000 | 15 | 174 | 121,000 | 10 | 362 | 35,000 | 10 | 200 | 25,000 | 5 | 200 | 20,000 | 10 | 275 | 75,000 | 11 | 25 | 5,000 | 10 | 175 | 8,500 | 172 | 33414 | 435,602 |
| Monaragal | 15 | 120 | 20,220 | 12 | 133 | 25,000 | 8 | 201 | 15,500 | 8 | 112 | 13,500 | 8 | 100 | 15,600 | 5 | 56 | 18,500 | 5 | 32 | 2,000 | 4 | 32 | 4,500 | 103 | 1876 | 346,820 |
| olonnaruv | 14 | 203 | 456 | 10 | 218 | 45,000 | 7 | 455 | 75,000 | 15 | 500 | 4,000 | 15 | 613 | 264,000 | 12 | 300 | 35,000 | 13 | 145 | 9,000 | 30 | 675 | 4,500 | 173 | 4213 | 718,456 |
| uradhapu | 10 | 300 | 6,000 | 8 | 102 | 109,500 | 13 | 856 | 45,000 | 21 | 600 | 60,000 | 8 | 781 | 6,000 | 13 | 220 | 78,000 | 5 | 133 | 6,500 | 10 | 23 | 2,500 | 223 | 16765 | 466,000 |
| incomale | 21 | 966 | 15,600 | 15 | 165 | 193,700 | 12 | 725 | 66,900 | 12 | 200 | 75,000 | 10 | 120 | 7,000 | 8 | 300 | 45000 | 10 | 150 | 7,500 | 4 | 20 | 2,300 | 211 | 24876 | 497,320 |
| Ampara | 11 | 825 | 45,000 | 7 | 85 | 3,000 | 15 | 300 | 35,000 | 10 | 400 | 5,000 | 13 | 120 | 7,000 | 11 | 360 | 36,000 | 15 | 205 | 8,000 | 14 | 21 | 1,250 | 142 | 3810 | 206,450 |
| Batticaloa | 13 | 200 | 15,000 | 12 | 359 | 4,700 | 18 | 200 | 121,000 | 11 | 450 | 75,000 | 11 | 450 | 8,000 | 15 | 560 | 63,000 | 12 | 210 | 10,000 | 6 | 65 | 5,000 | 169 | 5519 | 710,620 |
| urunegal | 23 | 120 | 10,300 | 36 | 1295 | 24,450 | 15 | 502 | 96,000 | 123 | 7495 | 60,000 | 4 | 210 | 13,710 | 18 | 1002 | 232,000 | 12 | 450 | 56,000 | 25 | 56 | 35,158 | 1039 | 13523 | 744,748 |
| Puttalam | 15 | 603 | 50,000 | 11 | 549 | 50,500 | 10 | 158 | 15,000 | 14 | 895 | 172,035 | 20 | 45 | 8,000 | 10 | 326 | 25,000 | 13 | 36 | 5,000 | 6 | 92 | 29,000 | 185 | 5774 | 429,630 |
| Jaffna | 15 | 455 | 60,000 | 12 | 366 | 12,500 | 9 | 111 | 15,000 | 6 | 45 | 80,000 | 12 | 300 | 56,000 | 12 | 400 | 45,000 | 8 | 102 | 6,000 | 2 | 32 | 15,000 | 108 | 2197 | 511,000 |
| Vavuniya | 12 | 142 | 32,000 | 9 | 95 | 36,000 | 11 | 56 | 14,000 | 5 | 55 | 45,000 | 6 | 45 | 32,000 | 2 | 25 | 5,000 | 5 | 33 | 5,000 | 11 | 125 | 22,000 | 126 | 892 | 353,000 |
| Mannar | 12 | 125 | 8,000 | 14 | 300 | 25,000 | 13 | 145 | 3,000 | 16 | 400 | 7,000 | 14 | 276 | 40,000 | 11 | 121 | 75,000 | 9 | 45 | 3,000 | 5 | 50 | 3,000 | 171 | 2742 | 247,450 |
| Mulathivu | 8 | 200 | 45,000 | 14 | 400 | 46,000 | 10 | 800 | 65,000 | 12 | 200 | 45,400 | 8 | 400 | 65,000 | 10 | 120 | 45,000 | 8 | 60 | 2,000 | 9 | 60 | 4,000 | 173 | 3606 | 460,200 |
| Kilinocchi | 13 | 684 | 6,000 | 11 | 345 | 20,000 | 11 | 1924 | 35,345 | 10 | 67 | 44,200 | 10 | 169 | 15,000 | 8 | 25 | 56,000 | 10 | 138 | 25,000 | 8 | 62 | 3,500 | 174 | 9053 | 430,715 |
| Total | 411 | 8745 | 551084 | 392 | 13879 | 1296850 | 303 | 8530 | 1112845 | 712 | 16685 | 1602335 | 224 | 5386 | 1044410 | 254 | 5981 | 1449630 | 227 | 2982 | 199700 | 268 | 3801 | 469408 | 27455 | 473222 | 14518634 |

## 7. කාර්යය සාධන වාර්තාව - 2018

### ජාතික තරුණ සේවා සභාව

**අ.ආයතනයේ කාර්ය සාධනය**

**1. ප්‍රතිපාදන සැලසීම**

2018 වර්ෂය තුළ ජාතික තරුණ සේවා සභාවේ සමස්ත ලැබීම් වලින් රු. මි. 1,752.4 ක් භාණ්ඩාගාරයෙන් ද අමාත්‍යාංශය හා රාජ්‍ය ආයතන හරහා රු. මි. 979.98 ක් ද ලැබී ඇත. එයින් රු. මි. 1,482.5 ක් පුනරාවර්ථන වියදම් වශයෙන් හා රු. මි. 1,206 ක් සංවර්ධන හා ප්‍රාග්ධන වියදම් වශයෙන් වැයකර ඇත. එම වසරේ ජාතික තරුණ සේවා සභාව සිය අභ්‍යන්තර ආදායම් මාර්ගවලින් රු. මි. 243 ක් උපයාගෙන තිබේ.

**2. සංවර්ධන වැඩසටහන්**

ජාතික තරුණ සේවා සභාව වර්ෂය තුළ ක්‍රියාත්මක කළ සංවර්ධන වැඩසටහන් යටතේ තරුණ කුසලතා සංවර්ධනය සඳහා වූ දේශීය වැඩසටහන් 13,059 ක් 701,025 ක තරුණ පිරිසකගේ සහභාගීත්වයෙන් පවත්වා ඇත. ඒ සඳහා වැයකර ඇති මුදල රු. මි. 351.90 කි. 2018 දී පැවැත්වූ තරුණ ක්‍රීඩා සංවර්ධන ක්‍රියාකාරකම් අතර 30 වැනි ජාතික යෞවන ක්‍රීඩා උළෙල, 31 වැනි තරුණ සේවා රූපවාහිනී වොලිබෝල් තරඟාවලිය හා ක්‍රීඩා පුහුණු කඳවුරු කැපී පෙනේ. සෞන්දර්ය කුසලතා සංවර්ධන ක්‍රියාකාරකම් යටතේ පැවැත්වූ ජාතික යෞවන සම්මාන තරඟාවලිය හා සම්මාන උළෙල, ජාතික යොවුන් නාට්‍ය උළෙල කැපී පෙනේ. ඊට අමතරව නාට්‍ය හා රංග කලා ඩිප්ලෝමා පාඨමාලා, යොවුන් නාට්‍ය දර්ශණ හා ජාතික සංස්කෘතික වැඩසටහන් පැවැත්වීමට ද ජාතික තරුණ සේවා සභාව කටයුතු කර ඇත.

**3. කාර්මික හා වෘත්තීය පුහුණු ක්‍රියාකාරකම්**

කාර්මික හා වෘත්තීය පුහුණු ක්‍රියාකාරකම් යටතේ ජාතික තරුණ සේවා සභාව පුහුණු මධ්‍යස්ථාන 51කදී පැවැත්වූ පූර්ණකාලීන හා අර්ධකාලීන පුහුණු පාඨමාලා 454 ක් සඳහා බඳවාගත් සිසුන් සංඛ්‍යාව 21,025 ක් වේ. එයින් සිසුන් 15,601 ක් එනම් 74.2% ක් පාඨමාලා අවසන් කර ඇත. ජාතික තරුණ සේවා සභාව 2018 වර්ෂයේදී වෘත්තීය පුහුණු සංවර්ධනය සඳහා රු. මි. 77.2 ක් වැය කර ඇත.

**4. ව්‍යවසායකත්ව හැකියා සංවර්ධනය**

ජාතික ව්‍යවසායකත්ව හැකියාවන් වර්ධනය කිරීම අරමුණු කරගෙන ජාතික තරුණ සේවා සභාව විසින් පැවැත්වූ වැඩසටහන් සඳහා 2018 දී රු. මි. 6.7 ක් වැය කර ඇති අතර ඒ යටතේ පැවැත්වූ පුහුණු වැඩසටහන් 79 ක් සඳහා 4392 ක් සහභාගීවී ඇත

**5. ගොවිපල සංවර්ධනය**

ජාතික තරුණ සේවා සභාව 2018 වර්ෂය තුළ ගොවිපල මධ්‍යස්ථාන 11 ක් නඩත්තු කර පවත්වාගෙන ගොස් ඇති අතර මධ්‍යස්ථාන 10 කදී කෘෂි පාඨමාලා 10ක් පවත්වා ඇත. ඒ සඳහා තරුණ තරුණියන් 286 ක් සහභාගිවී තිබේ.

**6. ජාත්‍යන්තර තරුණ සබඳතා**

ජාත්‍යන්තර තරුණ සබඳතා විෂයයට අදාළව 2018 දී පැවැත්වූ තරුණ හුවමාරු වැඩසටහන් සඳහා 172 ක්, ජගත් තරුණ නෞකා වැඩසටහන සඳහා 02 ක් හා කලාපීය තරුණ සමුළු හා වැඩමුළු සඳහා 75 ක් වශයෙන් තරුණ නියෝජිතයින් සහභාගීවී ඇත. එඩින්බරෝ ආදිපාද ජාත්‍යන්තර තිළිණ වැඩසටහන ජාතික තරුණ සේවා සභාව විසින් 2018 වර්ෂයේද  තිළිණ ප්‍රදානය වැඩසටහන් 02ක් යටතේ 1400 ක සහභාගීත්වයකින්  ක්‍රියාත්මක කරන ලදි.

**7. යොවුන් පාර්ලිමේන්තු වැඩසටහන**

රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සඳහා හා ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීමට තරුණ ප්‍රජාවට ඉඩසැලසීමේ අරමුණ ඇති ව යොවුන් පාර්ලිමේන්තු වැඩසටහන 2018 දී ද ක්‍රියාත්මක කර ඇත. එහිදී "Youth with Talent තුරුණු ශ්‍රම ශක්ති" ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති 3000 වැඩසටහන ග්‍රාමීය හා නාගරික ජනතාව මුහුණ දෙන විවිධ ගැටළු හඳුනාගෙන ඒවාට විසඳුම් සෙවීම සඳහා තරුණ ප්‍රජාව සහභාගි කරවා ගැනීමේ අරමුණ ඇතිව ක්‍රියාත්මක කර තිබේ. තවද, Youth with Talent Show - 2018 නමින් කුසලතාවයෙන් හා දක්ෂතාවයෙන් පිරිපුන් සුවිශේෂී තරුණයා සෙවීමේ ප්‍රසාංගික වැඩසටහනක් ද ජාතික තරුණ සේවා සභාව විසින් 2018 වර්ෂයේ ක්‍රියාත්මක කර ඇත.

**8. කාර්ය මණ්ඩල කටයුතු හා සංවර්ධනය**

වර්ෂය තුළ ජාතික තරුණ සේවා සභාවේ ස්ථිර කාර්ය මණ්ඩලයට නිලධාරීන් 11 ක් අළුතෙන් බඳවාගෙන ඇත. වර්ෂය තුළ රු. මි. 25.2 ක් වැය කරමින් නිලධාරීන් 7,186 ක් සඳහා නිලධාරී පුහුණු වැඩසටහන් 26 ක් ද, ධාරිතා සංවර්ධන වැඩසටහන් 03 ක් පවත්වා නිලධාරීන් 26,350 ක් පුහුණු කිරීමට ද කටයුතු කර ඇත.

**9. ඉදිකිරීම් කටයුතු**

මීට අතිරේකව 2018 දී අමාත්‍යාංශ ප්‍රතිපාදන රු. මි. 376.3 යොදවා ඉදිකිරීම් හා නවීකරණ ව්‍යාපෘති 12 ක් ද නිපුණතා ආංශික වැඩසටහන යටතේ ලැබුණු රු. මි. 65 යොදවා ව්‍යාපෘති 03 ක් ක්‍රියාත්මක කිරීමට ද ජාතික තරුණ සේවා සභාව කටයුතු කර ඇත

**ආ. කෙටිකාලීන හා මධ්‍යකාලීන ක්‍රියාමාර්ග**

ආයතනයේ කාර්යසාධනය වර්ධනය කර ගැනීම සඳහා ඉදිරියේදී අනුගමනය කිරීමට අපේක්ෂිත කෙටිකාලීන හා මධ්‍යකාලීන ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

<u>කෙටි කාලීන ක්‍රියාමාර්ග</u>

1. ජාතික තරුණ සේවා සභාව සමඟ බැඳී සිටින තරුණ තරුණියන්ගේ කුසලතා (ක්‍රීඩා, සෞන්දර්ය, වෘත්තීය පුහුණු, ව්‍යවසායකත්ව,................) සංවර්ධනය කිරීම සඳහා නව වැඩසටහන් දියත් කිරීම.
2. පෞද්ගලික, රාජ්‍ය හා රාජ්‍ය නොවන දේශීය හා විදේශීය ආයතන සමඟ සහයෝගීතාවයෙන් ක්‍රියා කිරීම.
3. නිළධාරී දක්ෂතා හඳුනාගෙන ඔවුන් නියමිත පරිදි ස්ථාන ගත කිරීම.
4. තාරුණ තරුණියන්ගේ ආර්ථිකය සවිබල ගැන්වීමට අවශ්‍ය කාලීන පුහුණු, නව තාක්‍ෂණික දැනුම හා පහසුකම් සැපයීම.
5. ජාත්‍යන්තරය හා තරඟ කිරීමට හැකි පරිදි තරුණ තරුණියන් හට ජාත්‍යන්තර භාෂා පාඨමාලා ආරම්භ කිරීම.
6. සංස්කෘතික, අධ්‍යාපනික, දේශපාලනික ක්ෂේත්‍රයන් හරහා තරුණ ප්‍රජාව තුළ අන්‍යෝන්‍ය අවබෝධය ඇති කිරීම හා නායකත්වය වර්ධනය කිරීම.
7. තරුණ ප්‍රජාව තුළ ධනාත්මක ආකල්ප ඇති කිරීම සඳහා විවිධ වැඩසටහන් සංවිධානය කිරීම.

<u>මධ්‍යකාලීන ක්‍රියාමාර්ග</u>

1. ඵලදායී සේවයක් සඳහා අවශ්‍ය නව තාක්‍ෂණික පද්ධති (System) වර්ධනය කිරීම.
2. කාලීන අවශ්‍යතා මත සුභසාධන, අභිප්‍රේරණය වර්ධනය හා නිපුන කාර්ය මණ්ඩලයක් ඇති කිරීම සඳහා පුහුණු , ඇඟයීම් අවස්ථා ලබා දීම හා හිතකර වැඩ පරිසරයක් නිර්මාණය කිරීම.
3. ආයතනයේ සංවර්ධනයට ගැලපෙන පරිදි පරිපාලන ව්‍යුහය නවීකරණය කිරීම.
4. තරුණ කුසලතා වර්ධනය සඳහා ජාතික හා ජාත්‍යන්තර ව හඳුන්වා දෙන නව වැඩසටහන්වලට අනුකූලව ක්‍රියාත්මක වැඩසටහන් නවීකරණය කිරීම.
5. තරුණයන්ගේ ව්‍යවසායකත්ව හැකියාව දියුණු කිරීම තුළින් ආර්ථිකය සවිබල ගැන්වීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
6. ශ්‍රී ලාංකීය තරුණයන් අතර ශ්‍රී ලාංකේය අභිමානය ඇති කිරීම.

## 8. 2018 වර්ෂයට අදාල විගණන විමසුම් මගින් දක්වා ඇති කරුණු නිවැරදි කිරීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව.

| විගණන විමසුම් අංකය | විගණන විමසුම හා එමගින් පෙන්වා දී ඇති කරුණු | නිවැරදි කිරීමට ගනු ලැබූ හා ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග |
|---|---|---|
| VTY/A/NYSC/ 2017/10 | නිස්කෝ වීඩියෝ අංශයේ කටයුතු පිළිබඳ පරීක්ෂාව. | නිස්කෝ වීඩියෝ අංශයේ නවීකරණය කිරීම සඳහා අවශ්‍ය උපාංග මිලදී ගැනීම සඳහා කටයුතු කර ඇත. |
| VTY/A/NYSC/ 2017/11 | එක්සත් ජාතීන්ගේ ආසියානු හා පැසිපික් කලාපයේ ආර්ථික හා සමාජයීය කොමිසමේ (UNESCAP) මූල්‍ය දායකත්වය මත ක්‍රියාත්මක කරන ව්‍යාපෘතිය Strengthening the capacity of Governments in the ESCAP ECA and ESCWA regains to respond to the needs of youth in formulating inclusive sustainable Development policies | රජයේ ආයතන සඳහා විදේශ සංවිධාන වලින් ආධාර ලබා ගැනීමට පෙර භාණ්ඩාගාරය සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව ආධාර ලබා ගැනීම සඳහා වන චක්‍ර ලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගෙන ඇත. |
| VTY/A/NYSC/ 2017/12 | 2017මාර්තු මස පැවති යොවුන්පුර වැඩසටහන සඳහා කුලී පදනම මත වීඩියෝ වෝල් ලබා ගැනීමට අදාල පරීක්ෂාව | අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ Air Supply Production (pvt)Ltd වෙත ප්‍රසම්පාදන කාර්යය ලබා දී ඇති අතර, වැඩිපුර ගෙවා ඇති මුදල අයකිරීමට කටයුතු කර ඇත. |
| VTY/A/NYSC/ 2017/13 | නිල්වලා යොවුන් උද්‍යානය ඉදිකිරීම - මාතර | යොවුන් උද්‍යානය ඉදිකිරීමට අදාල ඉඩම නීත්‍යානුකූලව පවරා ගැනීමට එවකට යෞවන කටයුතු හා නිපුනතා සංවර්ධන අමාත්‍යාංශය විසින් පවරා ගැනීමට අදාල කටයුතු සිදුකර ඇත.<br>2015 වර්ෂයෙන් පසු ඉදිකිරීම් කටයුතු කරගෙන යාම සඳහා ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් ඉදිරි කටයුතු සිදුකිරීමට නොහැකි විය. |
| VTY/A/NYSC/ 2017/14 | ඉඩම් පිළිබඳ පරීක්ෂාව | බේරුවල හා සූරියආරච්චි පදනමින් ලබාදී ඇති ඉඩම් අදාලව ප්‍රතිපාදන ලබාගැනීමේ අපහසුතාවය මත සංවර්ධන කටයුතු කිරීමේ හැකියාවක් නොමැත.<br><br>විමසුමෙන් පෙන්වා දී ඇති නීත්‍යානුකූල අයිතිය නොමැති ඉඩම් වල අයිතිය පවරා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. |
| VTY/A/NYSC/ 2017/15 | නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ ක්‍රියාකාරිත්වය - ජාතික තරුණ සේවා සභාව | දඹුල්ල හා හලාවත පුහුණු මධ්‍යස්ථානයන්හි ඉදිකිරීම් කටයුතු නිමකර නොමැති බැවින් තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් ලබාගත යුතු තත්ත්ව සහතික ලබා ගැනීමේ කටයුතු ප්‍රමාද වී ඇත. |
| VTY/A/NYSC/S SDP/2017/16 | නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන යටතේ | කාර්යසාධන දීමනා ලබා ගැනීම සඳහා පැමිණීමේ ප්‍රතිශතයන් පදනම් කරගෙන |

| | | |
|---|---|---|
| | නිළධාරීන්ට කාර්යසාධන දීමනා ගෙවීම<br>ජාතික තරුණ සේවා සභාව | ගෙවීම් සිදුකරනු ලබන අතර කාර්යසාධන මට්ටම දුර්වල තත්ත්වයේ පවතින නිළධාරීන් සම්බන්ධයෙන් ගෙවීම් කටයුතු කර නොමැත. |
| VTY/A/NYSC/2017/A/17 | මූල්‍ය ප්‍රකාශන විගණනය - 2017 | විමසුමෙන් පෙන්වා දී ඇති ගණකාධිකරණ අඩුපාඩු මේ වන විට නිරවුල් කර ඇත.<br>ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ කටයුතු අවසන් කර නොමැත. |
| VTY/A/NYSC/2017/B/18 | විගණකාධිපති වාර්තාව - 2017 | විමසුම මගින් පෙන්වා දී ඇති අභ්‍යන්තර විගණන වාර්තාවන්හි නිර්දේශ සම්බන්ධ පසුහාර කටයුතු මේ වන විට අවසන් කර ඇත. |
| VTY/A/NYSC/2017/B/19 | ප්‍රමාද වූ ඉදිකිරීම් පරීක්ෂාව - 2017 - ජාතික තරුණ සේවා සභාව | විමසුමට ලක්කර ඇති මහරගම තරුණ මධ්‍යස්ථානයේ භූගත පල්දෝරු පද්ධතිය නවීකරණය කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලය වෙත අවබෝධතා ගිවිසුමක් මගින් භාරදී ඇත.<br>ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලය විසින් 2016.08.25 දින කොන්ත්‍රාත්කරුවකු වෙත අදාල කොන්ත්‍රාත්තුව සපයා ඇත. ඒ අනුව එම කොන්ත්‍රාත්තුව 2018.02.22 වන දින අවසන් කර තරුණ මධ්‍යස්ථානය වෙත භාර දී ඇත.<br>මේ වන විට උපදේශන ගාස්තු ඇතුළුව රු.මි.28.85 ගෙවා ඇති අතර, අවසාන ගෙවීම් සිදුකිරීමේ දී ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකිරීම සඳහා කටයුතු කර ඇත.<br><br>දඹුල්ල හා ලව්ලේන් පුහුණු මධ්‍යස්ථානයන්හි නවීකරණ කොන්ත්‍රාත්තු වල මුළු වැඩ වටිනාකමින් අවසන් කර ඇති වැඩ වටිනාකම සලකා බලන විට ප්‍රගතියෙන් සෑහීමකට පත්විය නොහැකි බව උපදේශක ආයතන විසින් පෙන්වා දී ඇති බැවින් හා කොන්දේසි ප්‍රකාරව කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම් අවස්ථා කිහිපයක් ද ලබාදීම් කලද ඉදිකිරීම් කාර්යයන් මන්දගාමී ස්වරූපයෙන් ඉටුකරනු ලබන බැවින් ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්තුව නවතා දමන ලෙස ලබාදී ඇති නිර්දේශ පරිදි කොන්ත්‍රාත්තු තහනම් කිරීමේ නිවේදන නිකුත් කර ඇත. |
| VTY/A/NYSC/2017/B/20 | විගණකාධිපති වාර්තාව - 2017 | විමසුමට ලක්කර ඇති ඇඟිලි සළකුණු යන්ත්‍ර සවිකිරීම් හා ක්‍රියාකාරිත්වයන් පිළිබඳ ගැටළු නිරවුල් කිරීම සඳහා සවිකර ඇති යන්ත්‍ර අතුරින් මෘදුකාංග ඇතුලත් නොකිරීම හේතුවෙන් ක්‍රියාකාරී තත්ත්වයේ නොමැති යන්ත්‍ර, මෘදුකාංග ඇතුලත් කලද ක්‍රියාකාරී තත්ත්වයේ නොමැති යන්ත්‍ර, පැමිණීම් වාර්තා ලබාගත නොහැකි වීම, අකුණුසැර වැදීම හේතුවෙන් අක්‍රියවීම් හා අක්‍රිය තත්ත්වයේ පවතින යන්ත්‍ර පිළිබඳව හා ඒවා නැවත සකස් කිරීම සඳහා සැපයුම්කරු වෙත දැනුම් දී ඇත. |

| | | |
|---|---|---|
| VTY/A/NYSC/2018/AQ/01 | 2018 මැයි 25 දින පැවැත්වූ භාණ්ඩ වෙන්දේසිය හා අබලි භාණ්ඩ විනාශ කිරීම | මෙම විමසුම මගින් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් ඉදිරි වෙන්දේසියන්හිදී නිවැරදි කිරීම් සඳහා පියවර ගෙන ඇත. ගැණුම්කරුවන් විසින් ඉදිරිපත් කල මිල පිළිබඳව සෑහීමකට පත්වීම නොවීම හේතුවෙන් වෙන්දේසි නොකල ටයර් බටංගල පුහුණු මධ්‍යස්ථානයේ වගා කටයුතු හා සෝදාපාළුවීම් වළක්වා ගැනීම පිණිස ප්‍රයෝජනයට ගන්නා ලදි. |
| VTY/A/NYSC/2018/AQ/02 | බෙල්වුඩ් පුහුණු මධ්‍යස්ථානයේ ප්‍රයෝජනය සඳහා පැවති GI බට 23 ක් කපා දැමීම පිළිබඳ පරීක්ෂාව | විමසුම අනුව ප්‍රයෝජනයට ගතහැකි GI බට 23 ක් කපා දැමීම පිළිබඳව මධ්‍යස්ථාන භාර නිළධාරීගෙන් කරුණු විමසීම් සිදුකර අනවසරයෙන් කපා දැමීම් කල බට වෙනුවට බට ලබාදෙන ලෙසට දැනුම්දීමෙන් අනතුරුව අළුතින් බට ලබාදීමට කටයුතු කර ඇත. එම බට 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයට භාජනය වී ඇත. අදාල නිළධාරියාට තරයේ අවවාද කර ඇත. |
| VTY/A/NYSC/2018/AQ/03 | ජාතික තරුණ සේවා සභාවේ වාර්ෂික සේවක සුහද හමුවේ ගෙවීමට ඇති හිඟ මුදල පිළිබඳ පරීක්ෂාව. | මුලින් අනුග්‍රාහකත්වය සැපයීමට එකඟ වූ පාර්ශ්වය අනුග්‍රාහකත්වය නොදැක්වීම හේතුවෙන් නව අනුග්‍රාහකයකු සොයා ගැනීම ප්‍රමාදවීම තුල මෙම ගෙවීම ප්‍රමාද වූ අතර, 2018.11.30 වන දින ගෙවීම් කරන ලදි. |

## ආශ්‍රිත වාර්තා / ලේඛන.

- මූල්‍ය වාර්තාව 2013, ජාතික තරුණ සේවා සභාව.
- මූල්‍ය වාර්තාව 2014, ජාතික තරුණ සේවා සභාව.
- මූල්‍ය වාර්තාව 2015, ජාතික තරුණ සේවා සභාව.
- මූල්‍ය වාර්තාව 2016, ජාතික තරුණ සේවා සභාව.
- මූල්‍ය වාර්තාව 2017, ජාතික තරුණ සේවා සභාව.
- මූල්‍ය වාර්තාව 2018, ජාතික තරුණ සේවා සභාව.
- සංයුක්ත සැලැස්ම 2013 – 2018, ජාතික තරුණ සේවා සභාව.
- ක්‍රියාත්මක සැලැස්ම 2018 ජාතික තරුණ සේවා සභාව.
- දිස්ත්‍රික් ප්‍රගති වාර්තා, ජාතික තරුණ සේවා සභාව.
- ජාතික තරුණ සේවා සභාව ප්‍රධාන කාර්යාලීය අංශ ප්‍රගති වාර්තා.
- භාණ්ඩාගාර /අමාත්‍යාංශ සංවර්ධන වියදම් වාර්තාව - 2018, ජාතික තරුණ සේවා සභාව.

## ඇමුණුම 01

**විගණක කමිටු වාර්තාව**

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සම්බන්ධව නිකුත් කර ඇති චක්‍රලේඛ ප්‍රකාරව පැවැත්විය යුතු කමිටු සංඛ්‍යාව 04 ක් ලෙස නීර්ණය කර ඇත. 2018 වර්ෂයේ මාර්තු මස වන තෙක් රේඛීය අමාත්‍යාංශය ලෙස පැවති ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් පත්කරන ලද සභා අධ්‍යක්ෂ මණ්ඩල ධූර කාලය අවසන්වීමත්, 2018 වර්ෂයේ අප්‍රේල් මාසය වන විට ව්‍යාපෘති කළමනාකරණ, තරුණ කටයුතු හා දක්ෂිණ සංවර්ධණ ලෙස අමාත්‍යාංශය සංශෝධනය වීමත්, නැවත 2018 අගෝස්තු මස වන විට තරුණ කටයුතු, ව්‍යාපෘති කළමනාකරණ හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය ලෙස සංශෝධණය වීමත්, 2018 නොවැම්බර් මස වන විට බුද්ධ ශාසන හා ආගමික කටයුතු ලෙස අමාත්‍යාංශය සංශෝධනය වීමත් යන කරුණු මත විගණන හා කළමනාකරණ කමිටුව පත්කිරීම සිදුව ඇත්තේ 2018.12.05 දිනදීය. එම පත්කිරීමෙන් අනතුරුව 2018.12.21 දිනට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් කැඳවීමට කටයුතු කලද එම අවස්ථාවේ සිදුවූ දේශපාලන වෙනස්වීම් හේතුකොට ගෙන එයද පැවැත්වීමට නොහැකි විය.

## ඇමුණුම 02 - මූල්‍ය විගණක ප්‍රකාශය.

(03)

ජාතික තරුණ සේවා සභාව
**2018** දෙසැම්බර් **31** දිනට
මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය

| | සටහන් අංක | 2018 | 2017 |
|---|---|---|---|
| | | **(රු.'000)** | (රු'.) |
| වත්කම් | | | |
| ජංගම වත්කම් | | | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 1 | 3,944 | 8,268 |
| ලැබිය යුතු දෑ | 2 | 311,968 | 298,665 |
| තොග | 3 | 10,081 | 13,272 |
| වෙනත් ජංගම වත්කම් | 4 | 330 | 319 |
| | | 326,323 | 320,524 |
| ජංගම නොවන වත්කම් | | | |
| වෙනත් මූල්‍ය වත්කම් | 5 | 919,500 | 755,703 |
| පිරියත හා උපකරණ | 6 | 582,248 | 333,793 |
| ඉඩම් හා ගොඩනැගිලි | 7 | 1,128,090 | 748,046 |
| | | 2,629,338 | 1,837,542 |
| මුළු වත්කම් | | 2,956,161 | 2,158,066 |
| බැරකම් | | | |
| ජංගම බැරකම් | | | |
| ගෙවිය යුතු දෑ | 8 | 110,554 | 129,506 |
| වෙනත් බැරකම් | 9 | 10,870 | 18,590 |
| | | 121,424 | 148,096 |
| ජංගම නොවන බැරකම් | | | |
| පාරිතෝෂික වෙන්කිරීම් | 10 | 432,190 | 433,167 |
| මුළු බැරකම් | | 553,614 | 581,263 |
| ශුද්ධ වත්කම් | | **2,402,547** | **1,576,803** |
| ශුද්ධ වත්කම්/ ස්කන්ධය | | | |
| වෙනත් රාජ්‍ය අස්තිත්වයන්ගේ දායක වූ | | | |
| ප්‍රාග්ධනය | 11 | 5,298,333 | 4,506,286 |
| සංචිත | 12 | 177,208 | 34,155 |
| සමුච්චිත අතිරික්තය /(ඌනතාවය) | | (3,072,994) | (2,963,638) |
| මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධය | | **2,402,547** | **1,576,803** |

..............................................
ජී.ඩී.වී.එස්. පෙරේරා
අධ්‍යක්ෂ (මුදල්)
ජාතික තරුණ සේවා සභාව

..............................................
නීතිඥ ඩබ්. ජී. එස්.එරන්දික
සභාපති / අධ්‍යක්ෂ ජෙනරාල්
ජාතික තරුණ සේවා සභාව

ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 01 සිට 02 දක්වා ද, ගිණුම්කරණ සටහන් පිටු අංක 05 සිට 08 දක්වා ද, ඇතුලත් මෙම මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම සභාවේ කළමනාකරණ මණ්ඩලය විසින් දරනු ලැබේ. මෙම මූල්‍ය ප්‍රකාශනය කළමනාකරණ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර පහත අත්සන් යොදා මේ සමඟ ඉදිරිපත් කෙරේ.

| | | | | |
|---|---|---|---|---|
| 01. | නීතිඥ දසුන් නාගස්සේන | - | සභා අධ්‍යක්ෂ | .............................. |
| 02. | සම්පත් දික්කුඹුර | - | සභා අධ්‍යක්ෂ | .............................. |

(04)

ජාතික තරුණ සේවා සභාව
**2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

රු ' 000

| විස්තරය | සටහන් අංක | රු. 2018 | රු. 2017 |
|---|---|---|---|
| ආදායම් | | 999,930 | 918,170 |
| රජයේ දායකය (පුනරාවර්තන) | | 531,475 | 304,969 |
| රජයේ දායකය සංවර්ධන (පුනරාවර්තන) | | 1,531,405 | 1,223,139 |
| බාහිර දායකය (පුනරාවර්තන) | | 147 | 150 |
| පළාත් සභා | | 482,625 | 749,745 |
| අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතන (පුනරාවර්තන) | | 10,972 | 30,128 |
| විදේශ සංවිධාන | | 3,483 | 2,090 |
| වෙනත් බාහිර ආයතන | | 497,227 | 782,113 |
| අභ්‍යන්තර ඉපයීම් | 6-1 | 45,731 | 41,594 |
| ජාතික තරුණ මධ්‍යස්ථාන ආදායම් (මහරගම) | 6-2 | 158,044 | 146,888 |
| පුහුණු මධ්‍යස්ථාන ආදායම් | 6-4 | 23,057 | 10,932 |
| විවිධ ආදායම් | | 3,001 | 3,823 |
| සංදර්ශන ආදායම් | | 4,518 | 597 |
| ස්ථාවර වත්කම් ඉවත් කිරීම් ලාභය | 6-5 | 8,269 | 7,931 |
| කොවිපල කාරක ගිණුම් ලාභය | | 440 | 993 |
| අඩමාණ ණය අඩි වෙන්කිරිම | | 243,060 | 212,758 |
| | | 2,271,692 | 2,218,010 |
| මෙහෙයුම් වියදම් | | | |
| අඩු කළා :- | 7-1 | 1,124,736 | 1,075,990 |
| ආයතන හා පරිපාලන වැය | 2-4 | 154,759 | 189,495 |
| ස්ථාවර වත්කම් ක්ෂය | | (1,279,495) | (1,265,485) |
| | | 992,197 | 952,525 |
| | 07 | | |
| තරුණ සංවර්ධන වියදම් | 2-1 | 94,017 | 39,019 |
| සෞන්දර්ය කුසලතා සංවර්ධන අංශය | 2-2 | 10,569 | 6,438 |
| මාධ්‍ය අංශය | 2-3 | 2,505 | 1,803 |
| පර්යේෂණ හා සැලසුම් අංශය | 2-4 | 6,154 | |
| වෘත්තිය මාර්ගෝපදේශන හා උපදේශන අංශය | 2-6 | 29,223 | 56,289 |
| කාර්මික හා වෘත්තිය පුහුණු අංශය | 2-7 | 3,360 | 2,121 |
| ජාතික තරුණ මධ්‍යස්ථාන නඩත්තු අංශය | 2-8 | 44,395 | 45,315 |
| ජාත්‍යන්තර තරුණ සම්බන්ධතා අංශය | 2-9 | 10,121 | 6,564 |
| යෞවන නිළිණ අධිකාරී අංශය | 2-10 | 120,955 | 107,630 |
| ක්‍රීඩා සංවර්ධන අංශය | 2-11 | 101,991 | 94,778 |
| තරුණ සංවිධාන හා සංවර්ධන අංශය | 2-12 | 13,433 | 9,509 |
| ගොවිපල සංවර්ධන අංශය | 2-13 | 6,906 | 2,600 |
| තරුණ සමුපකාර හා ව්‍යාපාර සංවර්ධන අංශය | 2-14 | 3,765 | 3,277 |
| තිස්කෝ විඩියෝ අංශය | 2-15 | 9,774 | 8,356 |
| ඇගයීම් අංශය | 2-17 | 15,422 | 1,714 |
| තොරතුරු තාක්ෂණ අංශය | 2-18 | 447,738 | 697,245 |
| විශේෂ ව්‍යාපෘති අංශය | 2-19 | 154 | - |
| ඉඩම් සංවර්ධන අංශය | 2-6 | 146,071 | 145,524 |
| පුහුණු මධ්‍යස්ථාන | 2-6-1 | 35,000 | 16,863 |
| ජාතික තරුණ මධ්‍යස්ථානය - මහරගම | | 1,101,553 | 1,245,045 |
| | | (109,356) | (292,520) |
| වර්ෂයේ වියදම් අතිරික්තය | | | |
| එකතු කළා :- | | (2,963,638) | (2,671,118) |
| **වියදම් අතිරික්තය (2018.01.01)** | | | |
| ඉදිරියට ගෙනා ශේෂය | | (3,072,994) | (2,963,638) |

**ඇමුණුම 03 - විගණකාධිපති වාර්තාව හා 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

(ෆ)

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date |
| විටීවයි/ඒ/එන්වයිඑස්සී/1/18/14 | | 2019 මැයි 29 දින |

සභාපති,
ජාතික තරුණ සේවා සභාව

**ජාතික තරුණ සේවා සභාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික තරුණ සේවා සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

(8)

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ජාතික තරුණ සේවා සභාවේ සියයට 98 ක කොටස් හිමිකාරත්වයක් ඇතිව සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම 1981 වර්ෂයේදී ආරම්භ කර තිබුණද, සමාලෝචිත වර්ෂය දක්වා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

(ආ) පුහුණු මධ්‍යස්ථාන 11 ක් පවත්වාගෙන යාම සඳහා 1984 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලසීමාව තුළදී පවරාගෙන තිබූ ඉඩම් හා සභාවට නීත්‍යානුකූල අයිතිය තිබූ ඉඩම් 5 ක වටිනාකම හා සභාව සතු වාහන 06 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඇ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ස්කන්ධය යටතේ රජයේ ප්‍රදාන හා විදේශ රාජ්‍ය වලින් ලැබී තිබූ ප්‍රදාන වශයෙන් රු.5,298,332,712 ක ප්‍රාග්ධන ප්‍රදාන දක්වා තිබුණද ඒවා ක්‍රමානුකූල පදනමක් යටතේ ආදායම් ලෙස හඳුනාගැනීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් ප්‍රවර්ථන වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු ගොඩනැගිලි 477 ක්, ලී බඩු උපකරණ ඒකක 28,555 ක් හා යන්ත්‍රෝපකරණ ඒකක 1,797 ක් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව, ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. තවද එහි දළ ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09 හි 15 ඡේදයට අනුව පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන වටිනාකමින් අඩු අගයට තොග අගය කළ යුතු වුවද එයට පටහැනිව පිරිවැයට අගය කරන පරිදි තොග ප්‍රතිපත්තිය හඳුනාගෙන තිබුණි.

(7)

(ඊ) ඉකුත් වර්ෂයට අදාල රු. 32,065,606 ක වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබූ අතර සමාලෝචිත වර්ෂයට අදාල රු. 13,988,144 ක උපචිත වියදම් ගිණුම්ගත කර නොතිබුණි.

(උ) සභාව විසින් සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම වෙත කුලී පදනම මත ලබාදී තිබූ වාහන 02 ක් වෙනුවෙන් 2012 නොවැම්බර් 06 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා අයවීමට ඇති රු. 4,075,000 ක මුදල ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) 2016 වර්ෂයේ සභා තීරණයක් මත ආපසු භාර නොගැනීමේ පදනම මත යොවුන් පාර්ලිමේන්තු මන්ත්‍රීන් වෙත බෙදාදුන් එකතුව රු. 14,016,500 ක් වූ මිනි ලැප්ටොප් 289 ක් 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි පරිගණක හා විද්‍යුත් උපකරණ වටිනාකම තුළ ඇතුළත් වී තිබුණි. එබැවින් වත්කම් එම වටිනාකමෙන්ද වාර්ෂික ක්ෂය හා ක්ෂය වෙන් කිරීමේ ගිණුමේ ශේෂය පිළිවෙලින් රු. 2,803,300 කින් හා රු. 8,409,900 කින් ද වැඩියෙන් දක්වා තිබුණි.

(එ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ට අනුව වත්කමක් ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආ පසුව වුවද, සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන තිබූ පිරිවැය රු. 125,492,259 ක් වූ වත්කම් සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්ෂය කර නොතිබුණි. තවද, 2017 දෙසැම්බර් මාසයේදී ප්‍රත්‍යාගණනය කරන ලද මෝටර් වාහන 57 කට අදාලව සමාලෝචිත වර්ෂය සඳහා රු. 29,575,000 ක් වූ ක්ෂයවීම ගිණුම්ගත කර නොතිබුණි.

(ඒ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09 හි 11 ඡේදය පරිදි තොග වශයෙන් හඳුනාගත යුතු දෑ වලට අදාල කර ගත නොහැකි, 2018 වර්ෂයේ පශු නිෂ්පාදනවලින් රු. 4,644,701 ක ආදායමක් උපයන ලද සභාවේ ගොවිපලවල්වල ඇතිකරනු ලබන එකතුව රු 2,986,920 ක් වූ පශු සම්පත් තොගය අනුචිත ලෙස තොග වශයෙන් හඳුනාගෙන ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

6

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

(4)

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- මෙම වාර්තාවේ 1.2 ඡේදයේ (අ) සිට (ඉ) දක්වා වූ නිර්දේශ හැර 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

(3)

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සභාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

ජාතික තරුණ සේවා සභාවේ 2016 පෙබරවාරි 11 දිනැති අංක 02/2016 දරන චක්‍රලේඛයට අනුව රු. මිලියන 100 ත් 200 ත් අතර වටිනාකමක් ඇති කොන්ත්‍රාත් අමාත්‍යාංශ ප්‍රසම්පාදන මණ්ඩල අනුමැතිය යටතේ සිදු කළ යුතු වුවත්, බෙල්වුඩ් සෞන්දර්ය නිකේතනය නවීකරණය හා නව ඉදිකිරීම පිළිගත හැකි පදනමකින් තොරව අදියර I සහ අදියර II වශයෙන් පිළිවෙලින් රු. මිලියන 99.66 ක් හා රු. මිලියන 97.79 ක් වශයෙන් කොටස් දෙකකට ඛණ්ඩනය කර 2017 වර්ෂයේ අවස්ථා දෙකකදී දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩල අනුමැතිය යටතේ එකම කොන්ත්‍රාත්කරුවකු වෙත ප්‍රදානය කර තිබුණි. තවද, අදියර I හි කාර්යයක් වූ පැරණි ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම අවසන් වීමට පෙර අදියර II සඳහා අත්තිකාරම් ලෙස රු. 22,491,900 ක් ගෙවා තිබුණි.

## 3. අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) 2018 වර්ෂයේදී සභාව විසින් පවත්වන ලද ජාත්‍යන්තර තරුණ දින සැමරුම හා යොවුන්පුර වැඩසටහන සඳහා අනුමත ප්‍රතිපාදනය ඉක්මවා පිළිවෙලින් රු. 9,602,715 ක් හා රු. 26,568,040 ක් වැය කර තිබුණි.

(ආ) 2018 අගෝස්තු 16 දින සිට 2019 අප්‍රේල් 25 දින දක්වා කාලය තුළ නිමකිරීමට නියමිත කොන්ත්‍රාත් වටිනාකම රු.759,698,584 ක් වූ ව්‍යාපෘති 08 ක සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 7 සිට සියයට 67 දක්වා ප්‍රතිශතයක් ගෙන තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

ජාතික තරුණ සේවා සභාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහාවූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

| විගණන නිරීක්ෂණය | වර්ථමාන තත්වය | විෂය භාර අධ්‍යක්ෂව රයා |
|---|---|---|
| **1. මූල්‍ය ප්‍රකාශන** | | |
| 1.1 මතය<br>කෙටුම්පත් වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන අදහස් සැලකිල්ලට ගැනීමෙන් පසු මතය තීරණය කරනු ලැබේ. | | |
| 1.2 මතය සඳහා පදනම | | |
| (අ) ජාතික තරුණ සේවා සභාවේ සියයට 98 ක කොටස් හිමිකාරත්වයක් ඇතිව සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම 1981 වර්ෂයේදී ආරම්භ කර තිබුණද සභාවේ මූල්‍ය ප්‍රකාශන සමග එම සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.<br>(විගණන විමසුමට යොමුව : - VTY/A/NYSC/2018/AQ/16) | 2019 වර්ෂයේදි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ | අධ්‍යක්ෂ (මුදල්) |
| (ආ) 2017 වර්ෂයට අදාල රු. 32,065,606 ක වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2017 වර්ෂයට අදාල වවුචර් වටිනාකම්, පහත සඳහන් කරුනු කෙරෙහි අවධානය යොමුකර ගිණුම් ගත කර නොතිබුණි.<br>1. වර්ෂයේ අදාල ප්‍රතිපාදන වෙන් කර ඇතත් ලැබුණු මුදල් අනුව වියදම් කළ අතර අතැති බිල්පත්, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ භාණ්ඩාගාර ලේකම් ගේ අංක BD/CPB/4/1/9/-2018 හා 2017-12-27 දිනැති චක්‍ර ලේඛ අංක 3/2017 04 ඡේදය අනුව 2018 වර්ෂයේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන ගෙවීම් කටයුතු සිදුකර ඇත. | අධ්‍යක්ෂ (මුදල්) |
| (ඇ) සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු රු. 13,988,144 ක වියදම් ගිණුම්ගත කර නොතිබුණි.<br>(විගණන විමසුමට යොමුව : - VTY/A/NYSC/2018/AQ/16) | ආරක්ෂක සේවා ගාස්තු 2018 දෙසැම්බර් 5,675,120 ක මුදල 2019 පෙබරවාරි මස ගෙවීම් කර ඇත.අනෙකුත් වවුචර් වලට අදාල ගෙවීම් මේවන විට පහත සඳහන් පරිදි ගෙවීම් කර ඇත,<br>( අංශ වලට අදාල)<br>5(34) පවිත්‍රතා වියදම් 2.836,283.40<br>5(9) මුද්‍රණ වියදම් 6,243,506.00<br>3(6 )5(12) ආහාර සහ සංග්‍රහ වියදම් 4,713,003.00 | අධ්‍යක්ෂ (මුදල්) |

| | | |
|---|---|---|
| (ඇ) සභාව විසින් සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම වෙත කුලී පදනම මත ලබාදී තිබූ වාහන 02 ක් වෙනුවෙන් 2012 නොවැම්බර් 06 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා අයවීමට ඇති රු. 4,075,000 ක මුදල ගිණුම්ගත කර නොතිබුණි.<br>(විගණන විමසුමට යොමුව : - VTY/A/NYSC/2018/AQ/15) | සී/ස තරුණ සේවා පුද්ගලික සමාගම විසින් අයවිය යුතු මාසික කුලිය ලෙස ගිණුම් ගතවියයුතු රු.4,075,000/- මුදල ණය ගැති ලෙස ගිණුම් ගත කරන ලදී. (ජර්නල් අංක 98 ) 2019 වර්ෂයේදී මෙම මුදල අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | අධ්‍යක්ෂ (මුදල්) |
| (ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් ප්‍රවර්ථන වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු ගොඩනැගිලි 477 ක්, ලී බඩු උපකරණ ඒකක 28,555 ක් හා යන්ත්‍රෝපකරණ ඒකක 1,797 ක් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව, ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. තවද එහි දළ ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.<br>(විගණන විමසුමට යොමුව : - VTY/A/NYSC/2018/AQ/18 | ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව 0 අගය දක්වා ගිය වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට ඉදිරියේදී කටයුතු කර දළ ධාරන අගය ගිණුම් වල හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | අධ්‍යක්ෂ (මුදල්) |
| (ඊ) පුහුණු මධ්‍යස්ථාන 11 ක් පවත්වාගෙන යාම සඳහා 1984 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලසීමාව තුළදී පවරාගෙන තිබූ ඉඩම් සභාවට නීත්‍යානුකූල අයිතිය තිබූ ඉඩම් 5 ක වටිනාකම හා සභාව සතු වාහන 8 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි. | මෙම පුහුණු මධ්‍යස්ථාන 11 හි ඉඩම් වල වටිනාකම තක්සේරු කර ගිණුම් අංශයට වාර්තා කිරීම සඳහා දැනුවත් කර ලිපි ඉදිරිපත් කර ඇත. තවද, මෙම ඉඩම් 05 හි වටිනාකම තක්සේරු කර අදාල තොරතුරු ඉදිරිපත් කරන ලෙස ඉඩම් අංශය දැනුවත් කර ඇති අතර වටිනාකම් ලැබුණු පසු ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලැබේ.<br>අංක 27-5984 සහ 27-5985 යන වාහන සභාව සතු නොවන බැවින් මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කර නොමැත. මෙම වාහන ජාතික තරුණ සේවා සභාවට අයත් නොවන අතර එය මිනිස් බල උපයෝගිතා අමාත්‍යාංශය වෙත භාර දී ඇති බව ප්‍රවාහන නිලධාරී විසින් 2013-12-06 දින ලිඛිතව දන්වා එවා ඇත.<br>පසුව මෙම වාහන දෙක නැවත ජාතික තරුණ සේවා සභාවට භාරදී ඇති බැවින් ඉදිරියේදී ගර්හිත කිරීම සඳහා නැවත සභාවට භාරගෙන සපුගස්කන්ද පුහුණු මධ්‍යස්ථානයේ ගාල් කර ඇත.<br>අංක 37-6665ට්‍රැක්ටරය ඇතුන්ගම පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු පාඨමාලාව සඳහා ලබාගන්නා ලද වාහනයක් බව ප්‍රවාහන අංශයෙන් දැනුම් දී ඇත.<br>අංක NC-0859 මෝටර් කොච් වාහනය පිළිබඳ තොරතුරු ප්‍රවාහන අංශයෙන් ලබාගෙන ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරන බව දන්වමි | අධ්‍යක්ෂ (මුදල්) |

| | | |
|---|---|---|
| | මෙම යතුරු පැදි සඳහා අවශ්‍ය තොරතුරු ප්‍රවාහන අංශයෙන් ලබා ගෙන ඉදිරි කටයුතු කිරීමට පියවර ගනු ලැබේ.<br>ඒ අනුව YG-7110 දරණ ත්‍රීවිල් රථය මූල්‍ය ප්‍රකාශන වල ගිණුම් ගත වී ඇත.<br>අංක TD-9198 යතුරු පැදිය, TD-9206 යතුරු පැදිය, TD-9263 යතුරු පැදිය,<br>අංක YG-7110 දරණ ත්‍රීවිල් රථයේ වටිනාකම රු.334,320/- ක් වන අතර උපලේඛනයෙහි පිටු අංක 03 සටහන් කිරීමේදී වැරදීමකින් 207-4654 ලෙස සටහන් වී ඇත. මෙම 207-4654 දරණ ත්‍රීවිල් රථය වටිනාකම උපලේඛනයේ 02 වන පිටුවේ රු.160,350/- ක් ලෙස ගිණුම් ගත කර ඇත. | |
| (උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ට අනුව වත්කමක් ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආ පසුව වුවද, සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන තිබූ පිරිවැය රු. 125,492,259 වූ වත්කම් සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්ෂය කර නොතිබුණි. | 2019 වර්ෂයේදි සියළුම වත්කම් ප්‍රමිත පරිදි නිවැරදිව ක්ෂය කිරීමට කටයුතු කරනු ලැබේ. | අධ්‍යක්ෂ (මුදල්) |
| (ඌ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ස්කන්ධය යටතේ රජයේ ප්‍රදාන හා විදේශ රාජ්‍ය වලින් ලැබී තිබූ ප්‍රදාන වශයෙන් රු.5,298,332,712ක් දක්වා තිබුනද ඒවා ක්‍රමානුකූල පදනමක් යටතේ ආදායම් ලෙස හඳුනාගැනීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණි.<br>(විගණන විමසුමට යොමුව : - VTY/A/NYSC/2018/AQ/16) | රජයේ ප්‍රධාන හා විදේශ රාජ්‍ය වලින් ලැබී තිබූ ප්‍රදාන වශයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇති වත්කම් භෞතික සමීක්ෂණ අනුව වත්තම් ඉවත් කිරීමේදි අදාල සමුච්චිත ක්ෂය වටිනාකම මෙම ස්කන්ධය යටතේ ගැලපීම් කිරීම ප්‍රතිපත්තියක් ලෙස පවත්වා ගෙන යාමට කටයුතු කරනු ලැබේ. | අධ්‍යක්ෂ (මුදල්) |
| (එ) 2016 වර්ෂයේ සභා තීරණයක් මත ආපසු භාර නොගැනීමේ පදනම මත යොවුන් පාර්ලිමේන්තු මන්ත්‍රීන් වෙත බෙදාදුන් එකතුව රු. 14,016,500 ක් වූ මිනි ලැප්ටොප් 289 ක් 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි පරිගණක හා විද්‍යුත් උපකරණ වටිනාකම තුළ ඇතුලත් වී තිබුණි. එබැවින් වත්කම් එම වටිනාකමෙන්ද වාර්ෂික ක්ෂය හා ක්ෂය වෙන් කිරීමේ ගිණුමේ ශේෂය පිළිවෙලින් රු. 2,803,300 කින් හා රු. 8,409,900 කින් ද වැඩියෙන් දක්වා තිබුණි.<br>(විගණන විමසුමට යොමුව : -<br>VTY/A/NYSC/2018/A | 2019 වර්ෂයේදි නිවැරදි කිරිමට කටයුතු කරනු ලැබේ. | අධ්‍යක්ෂ (මුදල්) |

| | | |
|---|---|---|
| (ඒ) සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට සීමාසහිත ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම වෙත ගෙවිය යුතු ණය හිමි ශේෂය රු. 110,000 ක් ලෙස දක්වා තිබුණ ද එම සමාගම විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව එදිනට සභාවෙන් අයවිය යුතු ණය ශේෂයන්ගේ එකතුව රු.79,713,942 ක් වූයෙන් රු. 79,603,942 ක වෙනසක් නිරීක්ෂණය විය.<br>(විගණන විමසුමට යොමුව : - VTY/A/NYSC/2018/AQ/16) | සීමාසහිත තරුණ සේවා සමාගම වෙත ගෙවිය යුතු ණය හිමි ශේෂය 2015 වර්ෂයේ ගිණුම් ගත ශේෂයෙන් මෙතෙක් නිරවුල් නොවී පවතින මුදල රු.110,000 කි මෙම මුදල සඳහා ගිණුම් අංශය වෙත වවුචර් ඉදිරිපත් වී නැත.2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදි අතැති බිල්පත් ලෙස ඉදිරිපත් වූ වවුචර් පත් මිලියන 20 ක් මේ වන විට ගෙවා ඇත. | අධ්‍යක්ෂ (මුදල්) |
| (ඓ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09 හි 11 ඡේදයෙහි සඳහන් පරිදි තොග වශයෙන් හඳුනාගත යුතු දෑ වලට අදාල කර ගත නොහැකි, 2018 වර්ෂයේ පශු නිෂ්පාදනවලින් රු. 4,644,701 ක ආදායමක් උපයන ලද සභාවේ ගොවිපලවල්වල ඇතිකරනු ලබන එකතුව රු. 2,986,920 ක් වූ පශු සම්පත් තොගය අනුචිත ලෙස තොග වශයෙන් හඳුනාගෙන ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. තවද මෙම පශු සම්පත් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 හි 76 ඡේදය ප්‍රකාරව ජංගම වත්කම් යටතේ දැක්වීම අනුචිත බවට නිරීක්ෂණය කෙරේ. | විගණන නිරීක්ෂණ අනුව පෙන්වා දී ඇති පශු සම්පත් තොගය ජංගම නොවන වත්කම් ලෙස ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | අධ්‍යක්ෂ (මුදල්) |
| (ඔ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 09 හි 15 ඡේදයට අනුව පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන වටිනාකමින් අඩු අගයට තොග අගය කළ යුතු වුවද එයට පටහැනිව පිරිවැයට අගය කරන පරිදි තොග ප්‍රතිපත්තිය හඳුනාගෙන තිබුණි.<br>(විගණන විමසුමට යොමුව : - VTY/A/NYSC/2018/AQ/16) | ඉදිරියේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 09 හි 15 ඡේදයට අනුව තොග අගය කිරීමට කටයුතු කරනු ඇත | අධ්‍යක්ෂ (මුදල්) |
| (ඕ) 2017 දෙසැම්බර් මාසයේදී ප්‍රත්‍යාගණනය කරන ලද මෝටර් වාහන 57 ට අදාලව සමාලෝචිත වර්ෂය සඳහා රු. 29,575,000 ක් වූ ක්ෂයවීම් ගිණුම්ගත කර නොතිබුණි.<br>(විගණන විමසුමට යොමුව : - VTY/A/NYSC/2018/AQ/18) | 2019 වර්ෂයේදි නිවැරදි කිරිමට කටයුතු කරනු ලැබේ. | අධ්‍යක්ෂ (මුදල්) |

| | | |
|---|---|---|
| **1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්** | | |
| **1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම** | | |
| **2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව** | | |
| (අ) 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ භාවිතයෙන් ඉවත් කරන ලද වාහන 14 ක් හා අළුත්වැඩියා කළ හැකි තත්ත්වයේ පවතින වාහන 14 ක් සම්බන්ධයෙන් විගණිත දිනය වූ 2019 මාර්තු 31 වන විටත් අපහරණය කිරීම හෝ අළුත්වැඩියා කිරීම සිදුකර නොතිබුණි. | <u>**භාවිතයෙන් ඉවත් කරන ලද වාහන පිළිබඳව**</u><br><br>අපහරණය නොකරන ලද වාහන ලේඛණයේ අංක 01 සිට 04 දක්වා වන 27 ශ්‍රී 5984 / 27 ශ්‍රී 5985 / 41 ශ්‍රී 3420 /29 ශ්‍රී 6264 අංක දරණ වාහන අපහරණය කිරීමට අදාළ ප්‍රවාහන අංශය මඟින් සිදු කළ යුතු සියළුම රාජකාරී කටයුතු අවසන් කර ඉදිරි කටයුතු ඉදිරියට කරගෙන යාම සඳහා 2018 /11/19 දින සහකාර අධ්‍යක්ෂ(සැපයීම්) වෙත යොමු කර ඇත.<br>50- 4585 අංක දරණ නිශාන් කැබ් රථය මොණරාගල ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති යටතේ ජාතික තරුණ සේවා සභාවේ මොණරාගල දිස්ත්‍රික් කාර්යාලයට ලබා දී ඇති මුත් වාහනයේ නීත්‍යානුකූල අයිතිය ලේකම්, සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය සතුය. 2016 වර්ෂයේදී එම ව්‍යාපෘති මඟින් ලබා දුන් වාහන වල අයිතිය පවරාගන්නා ලෙස ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ජාතික තරුණ සේවා සභාව වෙත දන්වා ඇති අතර, ඒ අනුව පැවරීමට අදාල ලිපි ලේඛණ සම්පූර්ණ කර එම ආයතනය වෙත යොමු කොට ඇත. නමුත් මෙම පැවරීම නිසි ලෙස සිදු වී නොමැත. නැවත වරක් 2013 වර්ෂයේදී පැවරීමට අදාල ලිපි ලේඛණ සම්පූර්ණ කර අධ්‍යක්ෂ සැලසුම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මොණරාගල වෙත යොමු කොට ඇත. නමුත් 2015 වර්ෂය වන තුරු මෙම කාර්ය ඉටු නොවූ අතර ,මේ පිළිබඳ දිගින් දිගටම විමසීම් කිරීමේදී අධ්‍යක්ෂ දිස්ත්‍රික් ලේකම් (ක්‍රමසම්පාදන) 2015 වර්ෂයේදී පැවරීමට අදාල ලිපි ලේඛණ සකස් කර ඔවුන් වෙත යොමු කරන ලෙස අප වෙත දන්වන ලදි. ඒ අනුව නැවතත් අදාල ලිපි ලේඛන සකස් කර යොමු කලමුත් මේ වන තුරු අයිතිය පවරාදීමක් සිදු කර නැත. කැබ් රථය දැනට සපුගස්කන්ද පුහුණු මධ්‍යස්ථානයේ ගාල් කර ඇති අතර දෝෂයන් හේතුවෙන් එන්ජිම ගිනිගැන්වීම නිසා එන්ජිම අලුත්වැඩියා කිරීමට ඇත. බොඩියද දිරා පත් වීම ආරම්භ වී ඇත.<br>50 - 6575 - ටොයොටා හයිඑස් වෑන් රථය වාහනයේ ලියාපදිංචි සහතිකය සහ වාහනයේ චැසි අංකය පරස්පරතාවයක් තිබූ බැවින්, නැවත වාහනය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර සංශෝධිත ලියාපදිංචි සහතිකයක් ලබා ගන්නා ලෙස මෝටර්රථ පරීක්ෂක විසින් ප්‍රකාශ කරන ලදි. ඒ අනුව අදාල රාජකාරි කටයුතු ඉටු කර නව ලියාපදිංචි සහතිකයක් ලබා දෙන ලෙස 2018.04.26 වන දින මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වෙත දන්වා යවන | අධ්‍යක්ෂ (පාලන) |

| | | |
|---|---|---|
| | ලදි. නව ලියාපදිංචි සහතිකය 2019.01.23 දින ලැබුණු අතර වෙන්දේසි කිරීමට නියමිත වාහන හඳුනා ගැනීමේ සමීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කර ඇත.<br>51-7262, 52-0751, 52- 0274, 53-5863, 56-7964, 56-7970, 56-7972 යන වාහන වෙන්දේසි කිරීමට නියමිත වාහන හඳුනා ගැනීමේ සමීක්ෂණ මණ්ඩලයට2019.1.11 දින යොමු කර ඇත.<br>207 – 4654 -බජාජ් ත්‍රී රෝද රථය වැසි අංකය සහිත ස්ථාන සම්පූර්ණයෙන් දිරා ගොස් ඇති බැවින් වාහනයේ අනන්‍යතාවය තහවුරු කර ගත නොහැකි බැවින් ඉදිරි ක්‍රියාමාර්ග ගත නොහැකි බැව් මෝටර් රථ පරීක්ෂක විසින් ප්‍රකාශ කරන ලදි. ඒඅනුව මේ පිළිබඳව ඉදිරි කටයුතු කිරීමට මොටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දායකත්වය ලබා ගත නොහැකි වන අතර ආයතනයේ කළමණාකාරිත්වය මඟින් ඉදිරි කටයුතු තීරණය කල යුතුය.<br><br><u>**අළුත්වැඩියා කළ හැකි තත්වයේ පවතින වාහන පිළිබඳව**</u><br>41-6415, 41-9248, 42-0118, 56-7973, 62-2258 යන වාහන 2019 වර්ෂයේ පළමු කාර්තුව සඳහා වෙන් කර ඇති වාහන අළුත්වැඩියා ප්‍රතිපාදන අවසන් වී ඇති බැවින් ඉදිරියේදී වෙන් කරනු ලබන ප්‍රතිපාදන වලින් අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට තීරණය කර ඇත.<br>41-9226 වාහනය අළුත්වැඩියා කිරීම සඳහා 2018.11.13 අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ අනුමැතිය ලැබී ඇති අතර මිල ගණන් කැඳවීමට කටයුතු කර ඇත.<br>53- 5859, 56-7967, 56- 7971වෙන්දේසි කිරීමේ වාහන හඳුනා ගැනීමේ සමීක්ෂණ මණ්ඩලයට යොමු කර ඇත.<br>53-5860 හෙයියන්තුඩුව පුහුණු මධ්‍යස්ථානයට අනුයුක්ත කර ඇති අතර අළුත්වැඩියාව සඳහා ප්‍රධාන කාර්යාලයට රැගෙන විත් ඇති අතර මේ වන විට අළුත්වැඩියාව අවසන් කර ඇත.<br>56 – 7968 දඹුල්ල පුහුණු මධ්‍යස්ථානයට අනුයුක්ත කර ඇති අතර එන්ජෙක්ටර් පොම්පයේ දෝෂයක් හේතුවෙන් අළුත්වැඩියාවට යොමු කර තිබූ අතර මේ වනවිට අළුත්වැඩියාව අවසන් කර ඇත.<br>56– 7965 රත්මලාන පුහුණු මධ්‍යස්ථානයට අනුයුක්ත කර ඇත.<br>KC -6600 - යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි ෆර්ජෝ වර්ගයේ මෙම කාර් රථය එම අමාත්‍යාංශය වෙතින් සාමාන්‍යාධිකාරී සීමාසහිත ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමුපකාර සමිති සංගමය වෙත ලබා දී ඇති අතර, 2012 වර්ෂයේ දී සමුපකාර සමිති සංගමය මඟින් තරුණ සේවා සභාව වෙත ලබා ගෙන ඇත. 2015 වර්ෂය තෙක් ධාවනය කරන ලද මෙම කාර් රථය දැනට ධාවනය නොකරන බැවින් ලේකම් ව්‍යාපෘති කළමනාකරණ තරුණ කටයුතු හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය වෙත නැවත | |

| | | |
|---|---|---|
| | භාරගන්නා ලෙස 2018.05.04 වන දින දන්වා යවා ඇත.<br>PE- 0697 අංක දරණ කැබ් රථය 2017.05 මස අනතුරකට ලක් වීමෙන් පසු අළුත්වැඩියා කිරීම සඳහා දේශිය ඒජන්තවරුන් වෙත යොමු කර ඇත. අළුත්වැඩියාව 2018.12.17 දින වන විට අවසන් කර ඇති අතර 2019.1.11 දින සිට ධාවනයට එක් කර ඇත. | |
| (ආ) 2018 දෙසැම්බර් 31 දිනට පාරිභෝගික තොග ශේෂය තුළ රු. 554,525 ක් වටිනා ක්‍රීඩා උපකරණ ඇතුළු භාණ්ඩ අයිතම් 08 කට අයත් භාණ්ඩ ඒකක 1455 ක් සුදුසු පාර්ශවයන් වෙත බෙදාදීමට කටයුතු නොකර අවුරුදු 02 කට අධික කාලයක් ගබඩාව තුළ නිශ්ක්‍රීයව තිබුණි.<br>(විගණන විමසුමට යොමුව : VTY/A/NYSC/2018/AQ/15) | G 09-349 ඉන්වෙන්ට්‍රි අංකයෙහි සඳහන් රු.51,925 ක් වටිනා අර්ත් කූරු දැනටමත් ලබඩාවේ පවතී. මෙම අර්ත් කූරු ඉදිරි වැඩසටහන් සඳහා අවශ්‍ය වන බැවින් ලබඩාවේ තබා ඇත.<br>B 10-545 ඉන්වෙන්ට්‍රි අංකයෙහි සඳහන් වොලිබෝල් 14 ක් තාවකාලිකව නිකුත් කර ඇති නමුත් එය ලබාදී නොමැති බැවින් (ඌණතා පවතින බැවින්) අයකර ගන්නා ලෙස දැනුවත් කර ඇත.<br>වොලිබෝල් 10 ක් අපහරණ කටයුතු සඳහා වෙන්කර ඇත. ඉතිරි වොලිබෝල් ගබඩාවෙන් නිකුත් කර ඇත. ඊට අමතරව ඇති භාණ්ඩ සියල්ල මේ වන විට දිස්ත්‍රික් කාර්යාල හා පුහුණු මධ්‍යස්ථාන වෙත නිකුත් කර ඇත. | අධ්‍යක්ෂ (මුදල්) |
| (ඇ) 2018 වර්ෂයේදී සභාව විසින් පවත්වන ලද ජාත්‍යන්තර තරුණ දින සැමරුම හා යොවුන්පුර වැඩසටහන සඳහා අනුමත ප්‍රතිපාදනය ඉක්මවා පිළිවෙලින් රු. 9,602,715 ක් හා රු. 26,568,040 ක් වැය කර තිබුණි.<br><br>(විගණන විමසුමට යොමුව : VTY/A/NYSC/2018/AQ/07) | 2018 වර්ෂයේ සංවර්ධන සැලසුම් සකස් කිරිමේදි භාණ්ඩාගාර ප්‍රතිපාදන තුළ රු.5,000,000.00 කින් ජාත්‍යන්තර තරුණ දිනය සැමරීමට සැලසුම් කර තිබිණි. 2018 වාර්ෂික සැලැස්මට අනුව සැලසුම් කර තිබූ No Drugs අපි Youth වැඩසටහන හා 2018 Youth With talent වැඩසටහනට අදාළ සමාරම්භක උත්සවය වෙන වෙනම වැඩසටහන් දෙකක් ලෙස පැවැත්වීමට අධික මුදලක් වැය දැරීමට සිදුවන බැවින්, එම වැඩසටහන් දෙකම ජාත්‍යන්තර තරුණ දින වැඩසටහනට ඒකාබද්ධ කර ක්‍රියාත්මක කිරීමෙන් වියදම් අවම කර ගැනීමට හැකි විය.මේ නිසා ඉතා පුළුල් වැඩසටහනක් ලෙස ජාත්‍යන්තර තරුණ දිනය සැමරීමට අතිරේක ප්‍රතිපාදන ලෙස රු.9,602,715.00ක මුදලක් වැය දැරීමට සිදු විය.මෙම මුදල No Drugs අපි Youth හා යොවුන් පාර්ලිමේන්තු වැඩසටහන මඟින් ලබාගන්නා ලදී.<br>ජාත්‍යන්තර තරුණ දිනය සැමරුම් වැඩසටහනට පුළුල් ප්‍රචාරයක් ලබා දිමත්,නෙළුම් පොකුණ රඟහල ඉතා ආකර්ෂණීය ලෙස සැරසිලි කර උත්සවශ්‍රීයෙන් තිබීමත් නිසා යෞවන සමාජ සාමාජිකයන්,පුහුණු මධ්‍යස්ථාන අභ්‍යාසලාභීන් හා වෙනත් තරුණ තරුණියන් අතිවිශාල ප්‍රමාණයක් මෙම වැඩසටහන නැරඹීමට පැමිණියහ. විශේෂයෙන් කොළඹ දිස්ත්‍රික් බාලදක්ෂ ජම්බෝරියේ තරුණ තරුණියන් 5000ක් සහභාගිවීම සහ රාත්‍රි සංගිත සංදර්ශනය හා food festival සඳහා ඉතා විශාල පිරිසක් සහභාගීවීම නිසා ජාත්‍යන්තර තරුණ දින සැමරුම් වැඩසටහන ඉතා සාර්ථක වූ බව සඳහන් කරමි.<br>"යොවුන්පුරය - 2017" වැඩසටහන රුපියල් මිලියන 150ක් වැය දරමින් තරුණ තරුණියන් 6000 කගේ | අධ්‍යක්ෂ (සංවර්ධන) |

| | | |
|---|---|---|
| | සහභාගීත්වයෙන් සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, “යොවුන්පුරය - 2018” වැඩසටහනද රුපියල් මිලියන 150 ක් තුල තරුණ තරුණියන් 7000 ක සහභාගීත්වයෙන් පැවැත්වීමට කටයුතු සංවිධානය කරන ලදී.<br><br>I. සහභාගික තරුණ තරුණියන් නේවාසික<br>II. කිරීම සඳහා ශ්‍රී ලංකා යුධ හමුදාවෙන් හා ආපදා කළමනාකරණ දෙපාර්තමේන්තුවෙන් කූඩාරම් ලබා ගැනීම මූලිකව සැලසුම් කරන ලදී. නමුත් මෙම ආයතන දෙකෙන්ම ප්‍රමාණවත් පරිදි කූඩාරම් නොතිබීම නිසා අවශ්‍යතාවය පරිදි අමතර කූඩාරම් ලබා ගැනීමට විශාල මුදලක් වැය දැරීමට සිදු විය.<br><br>II. යොවුන්පුර වැඩසටහනට තරුණ තරුණියන් 7000 ක් සහභාගී වීම නිසා සනීපාරක්ෂක පහසුකම්, ජල නල පහසුකම් වැනි දෑ ප්‍රමාණව ලබාදිය යුතු වූ බැවින් එම කාර්යය ඉටු කර ගැනීමට සිවිල් ආරක්ෂක බලකාය වැනි ආයතන වල සහය ලබා ගැනිණි. නමුත් විදුලි බල මණ්ඩලය හා ජල ප්‍රවාහන හා ජල සම්පාදන වැනි රජයේ ආයතන මඟින් කරන ලද කාර්යයන්ට මිලියන ගණනක මුදලක් ගෙවීමට සිදුවීමෙන් අපේක්ෂිත වියදම් ඉක්මවා ගිය බව සඳහන් කරමි.<br>III. යොවුන්පුර වැඩසටහන සඳහා තරුණ තරුණියන් 7000 ක ප්‍රමාණයක සහභාගීත්වයෙන් පැවැත්වීමට සැලසුම් කළ බැවින් සියළු වැඩසටහන් වලට අදාළව යටිතල පහසුකම් වැඩි කිරීමටත්, සහභාගිකයන්ට ටී ෂර්ට්, කැප් හා මග් වැනි තිළිණ ප්‍රදානය කිරිමටත් අමතර මුදලක් වැය දැරීමට සිදු විය.<br>IV. මේ අනුව යොවුන්පුර වැඩසටහනට ඇස්තමේන්තු කළ රුපියල් මිලියන 150 ක් ප්‍රමාණවත් නොවුණු බැවින් අතිරේක ප්‍රතිපාදන යොදවා ගැනීමටත් සිදු වූ බව සඳහන් කරමි.<br>V. උක්ත වැඩසටහනේ දැවැන්ත බව හා එහි සංකීර්ණ බවත්, සනාථ කිරීම සඳහා වූ ඡායාරූප ලේඛණගත කොට ඇත.<br>අදාළ කරුණු නිවැරදි කිරීමට ගෙන ඇති පියවර<br>• මෙවර යොවුන්පුරය වැඩසටහන (2019) ඉහත මූල්‍ය ගැටළු අවම වන සේ සංවිධානය කිරීමට සියලු අංශ වලට උපදෙස් ලබා දීම. | |
| (ඇ) 2018 අගෝස්තු 16 දින සිට 2019 අප්‍රේල් 25 දින දක්වා නිමකිරීමට නියමිත කොන්ත්‍රාත් වටිනාකම රු.759,698,584 ක් වූ ව්‍යාපෘති 08 ක සමාලෝචිත වර්ෂයේ | (ඇ) 2017 වර්ෂයේ මැද ආරම්භ කරන ලද ව්‍යාපෘති 2018 හා 2019 වර්ෂයේදී අවසන් වීමට නියමිතව තිබුණි. එහෙත් 2018 වර්ෂය පුරා අපේක්ෂිත ප්‍රතිපාදන නොලැබුණු නිසා බිල්පත් ගෙවීම ප්‍රමාද වීම් හේතුකොට සියලු කොන්ත්‍රාත් ප්‍රමාදයන්ට ලක්විය. | අධ්‍යක්ෂ (පාලන) |

| | | |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 7 සිට සියයට 67 දක්වා ප්‍රතිශතයක් ගෙන තිබුණි. | එසේම 2019 වර්ෂයේ මේ වනවිටත් මෙම සියළුම කොන්ත්‍රාත් ඉතාමත් අඩු ප්‍රගතියක් ලබා ගෙන ඇති අතර ජනවාරි සිට මේ දක්වා කිසිදු බිල්පතකට ගෙවීම් කර නොමැත. | |
| (ඉ) ජාතික තරුණ සේවා සභාවේ 2016 පෙබරවාරි 11 දිනැති අංක 02/2016 දරන චක්‍රලේඛයට අනුව රු. මිලියන 100 ත් 200 ත් අතර වටිනාකමක් ඇති කොන්ත්‍රාත් අමාත්‍යාංශ ප්‍රසම්පාදන මණ්ඩල අනුමැතිය යටතේ සිදු කළ යුතු වුවත්, බෙල්වුඩ් සෞන්දර්ය නිකේතනය නවීකරණය හා නව ඉදිකිරීම පිළිගත හැකි පදනමකින් තොරව අදියර I සහ අදියර II වශයෙන් පිළිවෙලින් රු. මිලියන 99.66 ක් හා රු. මිලියන 97.79 ක් වශයෙන් කොටස් දෙකකට බණ්ඩනය කර 2017 වර්ෂයේ අවස්ථා දෙකකදී දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩල අනුමැතිය යටතේ එකම කොන්ත්‍රාත්කරුවකු වෙත ප්‍රදානය කර තිබුණි. තවද, අධියර I හි කාර්යයක් වූ පැරණි ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම අවසන් වීමට පෙර අධියර II සඳහා අත්තිකාරම් ලෙස රු. 22,491,900 ක් ගෙවා තිබුණි.<br>(විගණන විමසුමට යොමුව : - VTY/A/NYSC/2018/AQ/05) | 2017 වර්ෂය ආරම්භයේ අනුමත ඉදිකිරීම් ක්‍රියාකාරි සැලැස්මේ මෙම ව්‍යාපෘතිය සඳහා සීමිත ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් වී තිබුණි.<br>උපදේශක ආයතනය විසින් මෙම ව්‍යාපෘතිය සඳහා ලබා දී තිබූ මුළු ව්‍යාපෘති ඇස්තමේන්තුව ප්‍රසම්පාදන කමිටුව විසින් පරික්ෂා කර වෙන් වී ඇති ප්‍රතිපාදන ප්‍රමාණයට ගැලපෙන ලෙස ප්‍රමුඛව ඉටුකල යුතු කාර්යයන් ඇතුලත්ව (නේවාසිකාගාරය, කෑම ශාලාව, මුළුතැන්ගෙය සහ වැසිකිළිය) අදියර 1 වශයෙන් කොන්ත්‍රාත්<br>ප්‍රදානය 2017 ජූලි මස සිදුකර ඇත.<br>2017 වර්ෂය අවසන් වන විට ක්‍රියාකාරි සැලැස්මට අදාල ව්‍යාපෘති 07ක් ඉටු නොවූ බැවින්, ලැබුණු ප්‍රතිපාදන උපරිම ප්‍රයෝජන ගැනීමේ අරමුණු ඇතිව, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ "රජයේ<br>ප්‍රසම්පාදන කාර්යයන් වේගවත් කිරීම" පදනම් කොට ක්‍රියාකාරී සැලැස්ම නොවැම්බර් මස සංශෝධනය කර නව ව්‍යාපෘති ඇතුලත් කරන ලදි.<br>එහිදී ප්‍රමුඛත්වය දී ඉටුකල යුතු ව්‍යාපෘති හඳුනාගෙන ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම සිදුකර ඇත. ඒ අනුව බෙල්වුඩ් අදියර 11 කොන්ත්‍රාත්තුව 2017 දෙසැම්බර් 30 දින ප්‍රදානය කර ඇත.<br>අදියර 1 කොන්ත්‍රාත්තුව තුල ප්‍රධාන ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම ඇතුලත් වුවත්, අදියර 11 කොන්ත්‍රාත්තුව තුල ඊට අනුබද්ධ හා අවට ට්‍රාන්ස්ෆෝමර් කාමරය සැකසීම සහ අනෙකුත් ඉවත් කිරීම් ඇතුල් වී ඇත. ඒ අනුව උපදේශක ආයතනය 2018/01/30 දින අදියර 11 ට අදාල කොන්ත්‍රාත්තුව භාරදී ඇති අතර, කොන්ත්‍රාත් ආයතනය ප්‍රාරම්භක කටයුතු ඉටු කිරීම ආරම්භ කර ඇත.<br>එහෙත් මෙම සියලු කටයුතු ඉටුකර ගෙන යෑමේදී පැරණි ප්‍රධාන ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම සම්බන්ධව බාහිර පාර්ශවයන් මඟින් කරන ලද විමර්ෂන හේතුකොට කාර්යය කිරීම තාවකාලිකව නතර කරන ලදි. ඒ අනුව සැලසුම්ගත සියලුම කාර්යයන් විශාල ප්‍රමාදයකට ලක්විය. | අධ්‍යක්ෂ (පාලන) |
| (උ) 2018 ජනවාරි 30 හා 31 යන දිනයන්හිදී ඇමරිකා එක්සත් ජනපදයේ පැවැත්වූ තරුණ සමුළුවකට සහභාගී වීම සඳහා සභා අධ්‍යක්ෂවරියක් සහ තරුණ නියෝජිතයින් දෙදෙනෙක් සඳහා ගුවන් ටිකට්පත් සහ අනියම් වියදම් වෙනුවෙන් එකතුව රු. 1,029,518 ක් වැය දරා තිබුණි. එහෙත් නියමිත කාලය තුලදී වීසා අනුමත කර | 2018.01.30 හා 31 දිනයන්හී ඇමරිකා එක්සත් ජනපදයේ පැවැත්වූ ECOSOC Youth Forum 2018 වැඩසටහන සඳහා ජාතික තරුණ සේවා සභාව නියෝජනය කරමින් ජාතික තරුණ සේවා සභාවේ සභා අධ්‍යක්ෂිකා සුදර්ශී භාග්‍යා කරුණාරත්න මිය හා තරුණ නියෝජිතයින් දෙදෙනෙකු සහභාගී විය.<br>අදාල සංචාරය සඳහා තිදෙනාට ගුවන් ටිකට්පත් ගාස්තු, වීසා ගාස්තු, ගුවන් ටිකට්පත් අවලංගු කිරීමේ ගාස්තු අනියම් දීමනා හා ආහාර හා නේවාසික වැයදැරීම සඳහා රු. 1,029,518.00 ක මුදලක් වැයදරා | අධ්‍යක්ෂ (සංවර්ධන) |

| | | |
|---|---|---|
| ගැනීමට නොහැකි වීම නිසා අදාල සමුළුව නිමවන දිනයේදී දිවයිනෙන් පිටත්වීම හේතුවෙන් දරන ලද වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි.<br><br>(විගණන විමසුමට යොමුව : - VTY/A/NYSC/2018/AQ/09) | ඇත.මෙම තිදෙනා සහභාගී කරවීමේදී නියමිත දිනයන් වල වීසා සදහා අයදුම් කලද, ඇමරිකානු තානාපති කාර්යාලයේ අනුගමනය කරනු ලබන විවිධ නීතිමය හේතූන් මත මත මෙම තිදෙනාගේ වීසා අවලංගු වූ අතර, වැඩසටහනට සහභාගී කරවීමට තිබූ දැඩි අවශ්‍යතාවය මත ඒ වන විටත් ප්‍රමාණවත් කාලයක් පැවති නිසා නැවත වීසා අයදුම්කරන ලදී. (දෙවන වර වීසා අයදුම් කිරීමට වැයවූ මුදල් මෙම තිදෙනා පෞද්ගලිකව දරාගෙන ඇත) ඒ අනුව මෙම තිදෙනාට 2018.01.30 දින වීසා ලද අතර, ඒවන විට ගුවන් ගමන් පහසුකම් අනුව එක් තරුණ නියෝජිතයකු 2018.01.31 දින පෙරවරුවේ හා අනෙක් තරුණ නියෝජිතයා 2018.01.30 දින පස්වරුවේද ඇමරිකාව බලා පිටත්ව යන ලදී.<br><br>වැඩසටහන 2018.01.30 දින ආරම්භ වී 31 දින අවසන් වුවද එහි පසුවිපරම් කටයුතු 2018.02.01 දිනත් පවතින බව දැන සිටි නිසාත් (මෙම වැඩසටහනට පෙරවසර වල සහභාගීවූවන්ගෙන් හා මෙම වැඩසටහනට නියමිත වේලාවට සහභාගී වී සිටි එවකට තරුණ කටයුතු අමාත්‍යාංශයේ, අතිරේක ලේකම් (තරුණ කටයුතු) මගින් දුරකථනයෙන් දැනුම් දුන් පරිදි ), ඇමරිකාවෙන් කරන ලද විශේෂ ආරාධනයට අනුව ශ්‍රී ලංකාවේ තරුණ කටයුතු<br>සිදුකරන ආයතනයක් ලෙස ජාතික තරුණ සේවා සභාව නියෝජනය කරමින් කිසිවෙකු සහභාගී නොවුන හොත් ඉදිරියේදී ශ්‍රී ලාංකික තරුණයින්ට මෙවන් අවස්ථාවන් නොලැබෙන නිසාත්, ප්‍රමාද වී හෝ මෙම තිදෙනා අදාල වැඩසටහන සදහා පිටත්කර යැවූ බව සදහන් කරමි. කෙසේ වුවද මෙම තිදෙනා අවසාන මොහොතේ හෝ මෙම වැඩසටහන නියෝජනය කලබව සදහන් කරමි.<br>තවද මෙම තරුණ නියෝජිතයන් දෙදෙනාව හා සභා අධ්‍යක්ෂවරියව ඉදිරියේදී පැවැත්වෙන 2019 විදේශ සංචිත තරුණ තරුණියන් පුහුණු කිරීමේ වැඩසටහනේදී, ජාත්‍යන්තර තරුණ සමුළුවකදී (ලෝකයේ බලවත් රටවල් සම්බන්ධ) ලබාගත් සිය අත්දැකීම් හා දැනුම පැහැදිලි කිරීමට අවස්ථාවක්ද ලබාදී ඇති බව සදහන් කරමි.<br>ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටක තාරුණ්‍යට මෙවැනි අවස්ථාවන්ට අවසාන මොහොතේ හෝ සහභාගී වීමට ලැබීම ඔවුන් ලැබූ අනගි අවස්ථාවක් සේ සලකන අතර ඒ සදහා වැයවූ මුදල නිශ්කාර්ය වියදමක් නොවේ යැයි විශ්වාස කරමි.<br>මේ පිළිබදව මීට පෙර විවිධ අවස්ථාවන් වලදී ලබාදුන් විගණන විමසුම් වලදී සපයන ලද පිළිතුරු වලදීද, සහභාගීත්වය, තෝරා ගැනීම හා ගමනේ අවශ්‍යතාවය පැහැදිලි කර ඇති බවද කාරුණිකව සදහන් කරමි.<br>. | |